ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சு
**Ministry of National Policies and Economic Affairs**



# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# Annual Report
# 2015

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
ஊழியர் நம்பிக்கை பொறுப்பு நிதியச் சபை
**Employees' Trust Fund Board**

**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය**
වාර්ෂික වාර්තාව 2015

© සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

Design & Concept by:

maakey Creations

No.241,3rd Floor, Havelock Rd,
Colombo 06.
M: + 94 77 395 2335
T: +94 (0) 115 63 93 83
F: +94 (0) 112 50 89 42
E: sarath.makalanda@gmail.com
maakeycreations@gmail.com



ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය


**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය**

1වන මහළ, කම්කරු මහලේකම් කාර්යාලය,

කොළඹ 05.

දුරකථන : 011-2581704

ෆැක්ස් : 011-2503917

ඊ මේල්: dgmadminetfb@sltnet.lk

වෙබ් : www.etfb.lk

# පිටු අංක


| | |
|---|---|
| ආයතනික තොරතුරු | 6 |
| අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය | 7-9 |
| අපගේ දැක්ම, මෙහෙවර සහ සාරධර්ම | 10 |
| ප්‍රධාන මූල්‍ය තොරතුරු 2015 | 11 |
| 1981 සිට 2015 දක්වා විශේෂ අවස්ථා | 12-13 |
| ආයතනනික සමාලෝචනය | 14 |
| ආයතනික යහපාලනය | 15-17 |
| සභාපතිවරයාගේ පණිවිඩය | 18 |
| අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව 2015 | 19-24 |
| මූල්‍ය ප්‍රකාශන 2015 | 25-33 |
| මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 34-55 |
| විගණකාධිපති වාර්තාව 2015 | 56-76 |
| විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් මණ්ඩලයේ පැහැදිලි කිරීම | 77-89 |
| සංඛ්‍යාණමය ඇමුණුම | 295-299 |

# ආයතනික තොරතුරු

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය 1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත යටතේ 1981 මාර්තු 01 දින ස්ථාපිත කරන ලදි. මෙම අරමුදල සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය මගින් පරිපාලනය වන අතර, වර්තමානයේදී ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. ගරු අමාත්‍යවරයා විසින් නියෝග කර ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර දක්වා ඇති පරිදි ඕනෑම ශ්‍රේණියකට හෝ වර්ගයකට අයත් රජයේ හෝ පෞද්ගලික අංශයේ ආයතනයක් සඳහා මෙම පනතේ විධිවිධාන අදාල වේ. ස්වයං රැකියාලාභී පුද්ගලයන් හා සංක්‍රමික සේවකයන්ට ඔවුන්ගේ අභිමතය පරිදි මෙම අරමුදලට දායක විය හැක. වර්තමානයේ දී ආසන්න වශයෙන් මිලියන 2.4 ක් මෙම අරමුදලේ ක්‍රියාකාරී සාමාජිකත්වය දරණ අතර, සේවායෝජකයින් 76,674 දෙනෙකු ආවරණය කර ඇත. 2015 දෙසැම්බර් 31 දිනට සාමාජික අරමුදලේ වටිනාකම රුපියල් බිලියන 218.5 ක් විය. සේවා නියුක්තියන්ගේ අරමුදලේ කාර්යයන් විමධ්‍යගත කිරීම සඳහා සහ එහි සාමාජිකයන්හට වඩා හොඳ සේවාවක් ලබාදීම සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් එහි ශාඛා ජාලය 1995 වසරේදී ආරම්භ කරන ලදි.

**මණ්ඩලයේ අරමුණු**

(අ) මූල්‍ය සම්පාදනයට හා ආයෝජනයට සහභාගී වීමෙන් සේවක අයිතිය, සේවක සුභසාධනය, ආර්ථික ප්‍රජාතාන්ත්‍රිකය ප්‍රවර්ධනය කිරීම

(ආ) ව්‍යවසායන්හි සාමාන්‍ය කොටස් අත්කර ගැනීමෙන් කළමනාකරණයෙහි සේවක සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම

(ඇ) සේවා නියුක්තයන්ට විශ්‍රාම ගැනීමේදී දායක නොවන ප්‍රතිලාභයක් ලබා ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම සහ

(ඈ) මේ වගන්තියේ (අ) (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි හෝ උපකාරී විය හැකි අන් සියළු ක්‍රියා හෝ දේවල් කිරීම



# අධ්‍යක්ෂ මණ්ඩලය

2015 වසර අවසානයේ සේවා නියුක්තයන්ගේ හාර අරමුදල් මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත සදහන් පරිදි විය.

**මහින්ද මඩිහහේවා මහතා**
සභාපති / ප්‍රධාන විධායක නිලධාරි
ගරු විෂයභාර අමාත්‍යතුමා විසින් පත්කල නියෝජිත

**පී බී මැදගෙදර මහතා**
ක්‍රියකාරී අධ්‍යක්ෂ
ගරු විෂයභාර අමාත්‍යතුමා විසින් පත්කල නියෝජිත

**නිහාල් ෆොන්සේකා මහතා**
අධ්‍යක්ෂ
ගරු විෂයභාර අමාත්‍යතුමා විසින් පත්කල නියෝජිත

**කේ එස් කුරුකුලසිංහ මහතා**
අධ්‍යක්ෂ
ගරු විෂයභාර අමාත්‍යතුමා විසින් පත්කල නියෝජිත

**චම්පා බාලසූරිය මහත්මිය**
අධ්‍යක්ෂ
ගරු මුදල් අමාත්‍යතුමා විසින් පත්කල නියෝජිත

**ශීතා සේනාරත්න මහත්මිය**
අධ්‍යක්ෂ
වෙළඳ අමාත්‍යාංශ නියෝජිත

**සී එල් කේ පී ජයසූරිය මහතා**
අධ්‍යක්ෂ
ලංකා හාම්පුතුන්ගේ සංගමය විසින් පත්කල නියෝජිත

**පී රණවකආරච්චි මහතා**
අධ්‍යක්ෂ
වෘත්තීය සමිති නියෝජිත



# ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය

## නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්



**ආර් එන් ඥාණසේකර මිය**
(ආයෝජන)



**ඩබ්ලිව් එස් දිසානායක මහතා**
(සාමාජික සේවා)



**එල් එච් නිහාල් මහතා**
(පරිපාලන හා මානව සම්පත්)



**කේ එස් වැලිවිට මහතා**
(අභ්‍යන්තර විගණන)



**එන් ඩබ්ලිව් විමලවීර මහතා**
(මුදල්)



**ඩබ්ලිව් සූරියආරච්චි මහතා**
(දායක මුදල් රැස්කිරීම් හා සේවය සබඳතා)

# ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය

## සහකාර සාමාන්‍යාධිකාරීවරුන්



**සී මල්ලිකාරච්චි මහතා**
(සාමාජික ගිණුම්)



**එච් එම් සෙනෙවිරත්න මහතා**
(සාමාජික සේවා)



**එම් එස් දිසානායක මහතා**
(ක්‍රියාත්මක කිරීම්/ස්වයං රැකියා)



**එම් ඒ කේ අළුත්ගමගේ මහතා**
(මුදල්)



**එච් ඒ වයි ආර් ප්‍රනාන්දු මෙනෙවිය**
(දායක මුදල් රැස්කිරීම්)



**ඒ ජේ එම් එස් ජයසුන්දර මහතා**
(ක්‍රියාත්මක කිරීම්) - කලාප ii

# අපගේ දැක්ම

ආයතනනික විශිෂ්ඨත්වය තුළින් සමස්ථ පාර්ශවකරුවන් සඳහා වූ ක්‍රියාශිලි හා ස්ථාවර ප්‍රමුඛ භාරයක් බවට පත්වීම

# අපගේ මෙහෙවර

සාමාජිකයන් සඳහා වූ පුළුල් පරාසයක වූ මූල්‍ය ප්‍රතිලාභ හා විශිෂ්ඨ සේවාවක් සලසන සුහදශිලී හා විචක්ෂණශීලී භාරයක් වීම

# අපගේ සාරධර්ම

- නිර්මාණශිලි නව්‍යකරණයෙන් සහ කැපවීමෙන් යුතු කාර්ය මණ්ඩලය
- ජනතාවට සුහදශිලී සේවා වටපිටාව
- සහයෝගීතාව සහිත ප්‍රතිපත්ති සහ ක්‍රියාවලීන්
- විශිෂ්ඨ ක්‍රමවේද සහ ක්‍රියා පිළිවෙත්
- ඉහළ මූල්‍ය ස්ථාවරත්වය සහ
- තෘප්තිමත් පාරිභෝගිකයින්



# ප්‍රධාන මූල්‍ය තොරතුරු 2015

## සාමාජික අරමුදල




## මූල්‍ය සමාලෝචනය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය එහි ශුද්ධ දායක මුදල් වල වැඩි වීමත් සමඟ මූල්‍ය අංශයේ වත්කම් වල 1.65% ක ප්‍රමාණයක් නියෝජනය කරයි.

2014 වසරේදී රු බිලියන 18.5 ක් වූ ආයෝජන ආදායම 2015 වසරේදී වාර්තා කල රු බිලියන 19.5 හා සැසදිමේදී රු බිලියන 1 කින් වර්ධනය වී තිබිණි. 2014 වසරේදී රු බිලියන 17.2 ක් වූ ආදායම් බදු ගෙවීමට පෙර ශුද්ධ ලාභය රු බිලියන 18.1 ක් දක්වා වර්ධනය විය.

2015 වසර අවසන් වන විට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මුළු වත්කම් වල වටිනාකම රු බිලියන 223 ක් වූ අතර, මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාව මිලියන 12.5 ක් පමණ විය. එයින් මිලියන 2.4 ක් පමණ සක්‍රිය සාමාජික ගිණුම් විය. 2015 දෙසැම්බර් 31 දින වන විට දායක මුදල් ගෙවන සේවා යෝජකයින් සංඛ්‍යාව 76,674 ක් විය. 2014 වසරේදී රු බිලියන 15.9 ක් වූ මුළු දායක මුදල් රැස්කිරීම් 2015 වසරේදී රු බිලියන 18.1 ක් දක්වා වර්ධනය වූ අතර 2014 වසරේදී රු බිලියන 13.9 ක් වූ සාමාජික මුදල් ආපසු ගෙවීම් 2015 වසරේදී රු බිලියන 11.5 ක් දක්වා අඩු විය.

2014 වසරේදී රු බිලියන 2 ක් වූ ශුද්ධ දායක මුදල 2015 වර්ෂයේදී රු බිලයන 6.6 ක් විය. එය 2014 වර්ෂයට වඩා රු බිලියන 4.6 ක වැඩිවීමකි. 2015 වසර අවසානයේදී සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සතු මුළු වත්කම් වල වටිනාකම රු බිලියන 222.5 ක් වූ අතර, එය සියයට 11.8 ක වර්ධනයක් විය.

2014 වසරේදී රු බිලියන 193.9 ක් වූ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ සාමාජික අරමුදල 2015 වසරේදී රු බිලියන 218.5 ක් දක්වා වර්ධනය විය.

# 1981 සිට 2015 දක්වා විශේෂ අවස්ථා



## 1986

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය :

**උපරිමය රු.100,000/-**



## 1989

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය :

**නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය :**

**උපරිමය රු.200,000/-**



## 1991

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය :

නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය :

**හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර**

**උපරිම රු. 300,000/-**



## 1992

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර

**අභ්‍යන්තර අක්ෂිකාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය :**

**ඇස් දෙකම සඳහා රු.18,000/-**




## 1994

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර
අභ්‍යන්තර අක්ෂිකාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය
**සේ නි හා අ සාමාජිකයන්ගේ දරුවන් සඳහාවූ**
**05 වසර ශිෂ්‍යත්ව මූල්‍යාධාර**
**රු 15,000/- බැගින් ශිෂ්‍යත්ව 9,000 ක් වාර්ෂිකව**



## 1997

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර
අභ්‍යන්තර අක්ෂිකාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය
සේ නි හා අ සාමාජිකයන්ගේ දරුවන් සඳහාවූ 05 වසර ශිෂ්‍යත්ව මූල්‍යාධාර
**ශ්‍රම සුව රැකවරණ රෝහල්ගත වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය**
**රු. 25,000/- බැගින් රු.50,000/- ක**
**උපරිමය මුළු සේවා කාලය තුළදී**



## 2002

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර
අභ්‍යන්තර අක්ෂිකාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය
සේ නි හා අ සාමාජිකයන්ගේ දරුවන් සඳහාවූ 05 වසර ශිෂ්‍යත්ව මූල්‍යාධාර
ශ්‍රම සුව රැකවරණ රෝහල්ගත වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය
**"වියන" අඩු පොලී නිවාස ණය යෝජනා ක්‍රමය**



## 2006

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර
අභ්‍යන්තර අක්ෂිකාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය
සේ නි හා අ සාමාජිකයන්ගේ දරුවන් සඳහාවූ 05 වසර ශිෂ්‍යත්ව මූල්‍යාධාර
ශ්‍රම සුව රැකවරණ රෝහල්ගත වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය
"වියන" අඩු පොලී නිවාස ණය යෝජනා ක්‍රමය
**වකුගඩු බද්ධ කිරීම් සඳහා මූල්‍යාධාර : උපරිමය රු.300,000/-**



## 2010

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර
අභ්‍යන්තර අක්ෂිකාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය
සේ නි හා අ සාමාජිකයන්ගේ දරුවන් සඳහාවූ 05 වසර ශිෂ්‍යත්ව මූල්‍යාධාර
ශ්‍රම සුව රැකවරණ රෝහල්ගත වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය
"වියන" අඩු පොලී නිවාස ණය යෝජනා ක්‍රමය
වකුගඩු බද්ධ කිරීම් සඳහා මූල්‍යාධාර
**සේවා කාලය තුළදී නිත්‍ය දුබලතාවයට පත් අරමුදලේ**
**සාමාජිකයින්ගේ 05 වසර සමත් දරුවන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය**
**අපොස (උසස් පෙළ) සමත් අරමුදලේ සාමාජිකයින්ගේ**
**දරුවන් 5,000 කට රු.12,000/- බැගින් වාර්ෂික මූල්‍යාධාර**

# ආයතනික සමාලෝචනය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය 1980 අංක 46 දරණ පනතින් ස්ථාපිත කරන ලද අතර, එහි මෙහෙයුම් කටයුතු 1981 මාර්තු මාසයේ දී ආරම්භ කරන ලදි.

වර්තමානය වනවිට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය භාරකරුවෙක් සහ අරමුදලේ කළමනාකරුවෙක් ලෙස එහි ආවේනික සංවිධාන ව්‍යුහය තුල ක්‍රියාත්මක වන අතර, අනාගතයේදී ඉතාමත් විශිෂ්ඨ මූල්‍ය ආයතනයක් බවට පත්වීමට අදිටන් කරගෙන සිටී. ආයතනික සංවිධාන ව්‍යුහය පිළිබඳව පනතෙහි කිසිවක් විශේෂයෙන් සඳහන් කර නොමැති අතර, පනතේ 5 වන වගන්තියේ සඳහන් පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම සඳහා නීතිරීති සම්පාදනය කල හැකිය.

අරමුදලේ සියළුම කටයුතු කළමනාකරණය කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුව පවතී. අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයන් 9 දෙනෙකුගෙන් සමන්විත වන අතර, ඔවුන්ගෙන් 4 දෙනෙකු අදාල විෂයභාර අමාත්‍යවරයා විසින් පත්කරන අතර, මුදල් අමාත්‍යාංශය, වෙළඳ හා වාණිජ කටයුතු අමාත්‍යාංශය සහ ලංකා භාම්පුතුන්ගේ සංගමය මගින් එක් සාමාජිකයෙකු බැගින් සහ සේවකයන් 100,000 කට වැඩි සාමාජිකත්වයක් ඇති වෘත්තිය සමිති දෙකකින් එක සාමාජිකයෙක් බැගින් නම් කල හැකිය.

මණ්ඩලයේ සභාපතිවරයා අදාල අමාත්‍යවරයාගේ අභිමතය පරිදි පත්කල හැකි අතර, පනතේ සඳහන් පරිදි ඔහු අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී ලෙසද කටයුතු කල යුතුය.

සේවායෝජකයින් විශාල පිරිසක් බස්නාහිර පළාත තුල කේන්ද්‍රගතව සිටීම නිසා ආරම්භයේදී සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය මධ්‍යගත ආයතනයක් ලෙස ක්‍රියාත්මක විය. ප්‍රාදේශිය කාර්යාල ජාලය තුල සිදු කරන ලද ප්‍රතිසංවිධාන කටයුතු නිමවීමෙන් පසුව නව විභවයක් සහිත ප්‍රදේශ වල ආරම්භ කරන ලද ප්‍රාදේශිය හා දිස්ත්‍රික් කාර්යාල සමග ක්‍රියාත්මක කිරීම් හා නීති කටයුතු වල තීව්‍ර සංවර්ධනයක් සිදුවිය.

ඉන් පසුකාලීනව ප්‍රධානතම සාමාජික සේවා කටයුතු එනම් ඉල්ලුම්පත් භාර ගැනීම, ප්‍රතිලාභ ගෙවීම්, සාමාජිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් ආදිය විමධ්‍යගත කරන ලදි.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ කාර්යන් පුළුල් වශයෙන් මෙහෙයුම් සහ සහයක සේවා වශයෙන් දෙආකාරයකට බෙදිය හැක. මෙහෙයුම් කාර්යන් ලෙස රැස්කිරීම් හා සේවා යෝජක සබඳතා, සාමාජික සේවා සහ ආයෝජන අංශ හඳුනා ගෙන ඇත. පරිපාලන හා මානව සම්පත්, මුදල්, තොරතුරු තාක්ෂණ සහ අභ්‍යන්තර විගණන අංශ සහයක සේවා අංශ ලෙස හදුනාගෙන ඇත.

පනතේ දක්වා ඇති පරිදි සභාපතිවරයා හට ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී ලෙස කටයුතු කිරීමටද බලය දී ඇත. සාමාන්‍යාධිකාරී සහ අතිරේක සාමාන්‍යාධිකාරී සභාපතිවරයාගේ සෘජු අධීක්ෂණය යටතේ කටයුතු කරනු ලබයි. සෑම ප්‍රධාන කොට්ඨාශයක්ම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරවරයෙකුගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. මණ්ඩලයේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුර, සභාපතිගේ/ ප්‍රධාන විධායක නිලධාරිගේ කටයුතු වලට සහය වීම සඳහා පිහිටුවා ඇත.

ඒ අනුව ආයතනයේ මනා ක්‍රියාකාරීත්වය සඳහා ප්‍රමාණවත් සංවිධාන ව්‍යුහයක් සකස්කර තිබේ.

# ආයතනික යහපාලනය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සෑම ස්ථරයක් තුළම ශක්තිමත් සාරධර්ම පද්ධතියක් ඇතිකිරීම, ලිඛිත ක්‍රියාවලින් යන ප්‍රතිපත්ති තුලින් සහ ආදර්ශමත් ලෙස නායකත්වය සපයන අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් යහපාලනය සංකල්පය ආයතනය තුළ ස්ථාපිත කිරීම සඳහා පියවර ගෙන තිබේ.

ආයතනික යහපාලනය ඉතා ඉහළ ප්‍රමිතියකින් පවත්වාගෙන යෑම සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය ඉතා වගකීමෙන් කැපවී සිටී. මණ්ඩලයේ ආයතනික යහපාලන ක්‍රියාවලිය එහි පාර්ශවකරුවන් සඳහා සහතිකවූ වටිනාකම් ලබාදීමට අදිටන් කරගෙන ඇත. මණ්ඩලයේ යහපාලන සංකල්පය පහත සඳහන් දේ වලට අනුගත වෙමින් ක්‍රියාත්මක වේ.

1. 1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත

2. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් නිකුත් කර ඇති රාජ්‍ය ආයතන සඳහා වූ යහපාලන උපදෙස් මාලාව

3. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ආයතනික යහපාලනය සඳහා වූ Code of Best Practice

4. ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සම්ක්ෂණ මණ්ඩල පනත

5. මණ්ඩලයේ ප්‍රතිපත්ති හා කාර්ය පටිපාටි සංග්‍රහය

## අධ්‍යක්ෂ මණ්ඩලය

රජය සහ පාර්ශවකරුවන් වෙනුවෙන් වගකීමෙන් කටයුතු කරන ප්‍රවීන අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් මණ්ඩලයේ කටයුතු මෙහෙයවනු ලබයි.

## අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය

පහත දැක්වෙන සාමාජිකයන් නව දෙනාගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ

- අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයන් හතරදෙනෙකු
- මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් සාමාජිකයෙකු
- වෙළෙඳ විෂයය භාර ආමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් සාමාජිකයෙකු
- ලංකා සේවායෝජකයන්ගේ සංගමය විසින් නම් කරනු ලබන එක් සාමාජිකයෙකු සහ
- එක් එක් වෘත්තීය සමිතියෙහි සාමාජිකත්වය 100,000 කට වැඩි වෘත්තීය සමිතිවල සාමාජිකයන් විසින් තෝරා ගනු ලබන සේවක සාමාජිකයන් දෙදෙනෙකු

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සෑම මට්ටමක් තුලම එහි දැක්ම, මෙහෙවර, ආයතනික සාරධර්ම, ආයතනික ඉලක්ක සහ අරමුණු මගින් සහ මූල්‍ය පරිපාලනයේ ලිඛිත ක්‍රියාපිළිවෙත් සහ ප්‍රතිපත්ති, ආයෝජන, සැපයුම් ආදී ප්‍රතිපත්ති මගින් ආයතනික යහපාලන ක්‍රියාදාමය ආරම්භ කර ඇත.

## අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්ය භාරය

රජයේ ප්‍රතිපත්ති වලට අනුකූලව කාර්යක්ෂම හා ඵලදායි ලෙස සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ කටයුතු මෙහෙයවීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. ආයතනයේ සම්පත් ආරක්ෂා කරන අතරම මනා ලෙස ගිණුම් පවත්වා ගැනීම, නිවැරදි වාර්තා තබා ගැනීම සහ කළමනාකරණයට සම්බන්ධ ව්‍යවස්ථාපිත සහ අනිකුත් විධිවිධාන වලට අනුකූල වෙමින් මෙම තත්වය පවත්වා ගත යුතුය.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආයතනයේ උපායමාර්ගික ඉලක්ක නිසියාකාර ලෙස ස්ථාපිත කර එම ඉලක්ක ලඟාකර ගැනීම සඳහා ආයතනය මෙහෙයවනු ලබයි. එසේම කාර්යක්ෂම අභ්‍යන්තර පාලන හා අවදානම් කළමනාකරණයක් ස්ථාපිත කිරීම, ආයතනයේ කළමනාකරණ කාර්යයන් නිසියාකාරව ක්‍රියාත්මක වීම සහ සම්පත් සහ වත්කම් ඵලදායි ලෙස භාවිතා කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය නිරන්තර අවධානයෙන් අධීක්ෂණය කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාමාන්‍යාධිකාරීවරයාගේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ කාර්ය සාධනය වාර්ෂිකව ඇගයීමකට ලක්කරන අතර, මූල්‍ය හා අනිකුත් හෙළිදරව් කිරීම් පිළිබඳව එහි පාර්ශවකරුවන් නිරන්තරයෙන් සහ ප්‍රමාණවත් ලෙස දැනුවත් කිරීමක් සිදුකරනු ලබයි.

එසේම විගණන හා කළමනාකරණ කමිටුව සහ ආයෝජන කමිටුව පත්කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුව පවතී. අන්‍යෝන්‍ය වශයෙන් ගැටුම්කාරී තත්වයක් ඇති නොවන ලෙස රජයේ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට සහ අනිකුත් නීතිරීති සහ චක්‍රලේඛ වලට අනුකූල වෙමින් මණ්ඩලයේ කටයුතු පවත්වා ගෙන යාම අධ්‍යක්ෂ මණ්ඩලයේ අපේක්ෂාවයි. එසේම යහපාලන රාමුවක් තුළ විනිවිදභාවය සහ වගවීම ආයතනය තුළ ස්ථාපිත කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ අපේක්ෂාව වේ.

## අධ්‍යක්ෂ මණ්ඩලය පත්කිරීම

ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත් කිරීම පනතේ සඳහන් ආකාරයට සිදුකරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විසින් අනුකූල විය යුතු කාර්ය භාරය අයිතිවාසිකම් සහ වගකීම් අදාල පත්කිරීමේ බලධාරී විසින් අත්සන් කරනු ලබන පත්කිරීමේ ලිපියේ සඳහන් වේ.

## සභාපති

ආයතනයේ සභාපති විසින් පැහැදිලි හා විශිෂ්ඨ නායකත්වයක් ලබාදීම අපේක්ෂා කරනු ලබයි. එසේම ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී වශයෙන් එහි සම්පූර්ණ යහපාලන ව්‍යුහය තුළ එය නිවැරදි ඉලක්කය කරා මෙහෙයවීමේ කාර්යභාරය ඔහු සතුව පවතී. එසේ සභාපති විසින් ආයතනික යහපාලන පැවැත්ම, සියළුම අධ්‍යක්ෂ වරුන්ව සමකර සැලකීම, පැහැදිලි ලෙස වගකීම් බෙදදීම සහ බලය සහ අධිකාරිය සමබරව පවත්වාගෙන යාම තහවුරු කල යුතුය. ඔහු විසින් සියළුම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මෙහෙයවනු ලැබිය යුතු අතර, ප්‍රමාණවත් මට්ටමකින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වාගෙන යා යුතුය. ඔහු විසින් ක්ෂේත්‍රයේ ලබා ඇති විශේෂ දැනුම භාවිතා කරමින් ආයතනය තුල අධීක්ෂන මට්ටමේ උපරිම කාර්ය භාරයක් සිදුකරන අතර, මෙහෙයුම් කටයුතු වලට සම්බන්ධවීමක් සිදු නොකරයි. එසේම ඔහු විසින් අනිකුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විසින්ද ආයතනය සඳහා ක්‍රියාශීලි වැඩකොටසක් සිදුකිරීමට උනන්දු කරවීම සිදුකරනු ලබයි.

## මණ්ඩලයේ ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩලයට වගකියන, ආයතනයේ ක්‍රියාපටිපාටි පිළිබඳ අනුකූලතාවය, නීතිය හා අනිකුත් නීතිරීති පිළිබඳව දැනුවත්භාවය සහිත සහ නියමිත කාලය තුළ ප්‍රමාණවත් සහ විශ්වාසනීය මට්ටමේ තොරතුරු ලබාදීමට හැකි වෘත්තීය මට්ටමේ සුදුසුකම් සහිත ලේකම් වරයෙකුගේ සහය ලබා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට අවකාශ ඇත. මණ්ඩලයේ ලේකම් විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීමේ මනා ක්‍රියා පිළිවෙතක් අනුගමනය කිරීම, රැස්වීම් ඵලදායි ලෙස පවත්වාගෙන යෑමට සහයවීම සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පත්‍රිකා කලට වේලාවට ලබාදීම ආදිය මනා ලෙස සංවිධානය කල යුතුවේ. ඔහු විසින් ආයතනයේ මෙහෙයුම් පවත්වාගෙන යාමට අවශ්‍ය නියමිත ක්‍රියා පිළිවෙත්, වගකීම්, නීතිරීති පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය උපදෙස් හා සහයෝගය ලබාදෙනු ලැබේ.

## සාමාන්‍යාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

ආයතනයේ මෙහෙයුම් කටයුතු කළමනාකරණය කිරීමේ වගකීම සාමාන්‍යාධිකාරීවරයා සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සතුව පවතී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගන්නා ලද තීරන ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ වගකීම ඔවුන් සතුව පවතී. විසේම අධ්‍යක්ෂ මණ්ඩලයට නිවැරදි තීරණ ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබාදීම සාමාන්‍යාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් සිදුකරනු ලබයි. ආයතනයේ ඉලක්ක සහ අරමුණු සඵල කර ගැනීම සහ ආයතනයේ කටයුතු ඵලදායි ලෙස කළමනාකරණය කිරීමට අවශ්‍ය මෙහෙයුම් සැලසුම් සහ අයවැය ලේඛණ සකස් කිරීම, නියමිත ක්‍රියාපටිපාටින් සහ පාලන ක්‍රමවේද සකස් කිරීම සහ පවත්වාගෙන යෑම ඔවුන් විසින් සිදුකරනු ලබයි.

## මූල්‍ය වාර්තාකරණය

මණ්ඩලයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සත්‍ය සහ සාධාරන භාවය පිළිබිඹු වන පරිදි සහ වාර්ෂික කාර්ය සාධනය පිළිබිඹු වන පරිදි පිළියෙල කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත වලට අනුකූලව සිදුකරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලයත්, සාමාන්‍යාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ වගකීම් ඵලදායි ලෙස ඉටුකිරීම සඳහා කලට වේලාවට වඩා විශ්වාසනියත්වයෙන් යුතුව තොරතුරු සැපයීම ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් සහිතව විනිවිදභාවයකින් යුතුව සිදුකිරීමට පියවර ගෙන ඇත.

## වාර්ෂික විගණනය

මණ්ඩලයේ වාර්ෂික විගණනය විගණකාධිපති විසින් සිදුකරනු ලබයි. ආයතනයේ විගණන කටයුතු වල අපක්ෂපාති බව සහ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා විගණකාධිපති විසින් මණ්ඩලයට උපදෙස් සැපයීම හෝ වෙනත් සේවා ලබාදීමක් අපේක්ෂා නොකරයි.

## මණ්ඩලයේ කමිටු

මණ්ඩලයේ සමහර නිශ්චිත කාර්යයන් කමිටු වලට පවරා ඇත.

# සභාපතිවරයාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ සුවහසක් වැඩ කරන ජනතාව වෙනුවෙන් පවත්නා දැවැන්ත සමාජ ආරක්ෂණ ක්‍රමයක් වන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල දෙවන වන්නේ සේවක අර්ථ සාධක අරමුදලට පමණි.

පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවකයින් උදෙසා 1981 මාර්තු මස 01 වන දින පිහිටුවන ලද මෙම අරමුදල මගින් පොළී හා ලාභාංශ වලට අමතරව අධ්‍යාපන, සෞඛ්‍ය හා නිවාස ප්‍රතිලාභ ක්‍රම 10 ක් සාමාජිකයින්ට ලබාදෙයි. එම ප්‍රතිලාභ තුළින් සාමාජිකයන්ගේ අත්‍යාවශ්‍ය අවශ්‍යතා රාශියක් ඉටු කර ගැනීමට හැකිවන අතර, සාමාජිකයන්ගේ යැපෙන්නන් සඳහාද ප්‍රතිලාභ ගෙවන සුවිශේෂී අරමුදලක් ලෙස අද වර්ධනය වී ඇත.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ අරමුදල් ප්‍රවර්ධනය කිරීම හා සාමාජිකයින්ට වඩාත් කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ලබා දීමේ අරමුණින් 2015 වසරේ ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම ආරම්භ කෙරිණ. විශේෂ අංශ 5 ක් ආරම්භ කරමින් අරමුදලේ අඛණ්ඩව පැවතෙන ප්‍රශ්න රැසකට ආමන්ත්‍රණය කෙරිණ. දායක මුදල් අය කිරීම, ප්‍රවර්ධනය කිරීම සඳහා විශේෂ විමර්ශන අංශයක් (SIU – Special Investigation Unit) ද, සාමාජිකයින්ට කඩිනම් හා කාර්යක්ෂම සේවාවක් ලබාදීම සඳහා "සහන පියස" (CCU – Customer Care Unit) ද ආරම්භ කරන ලදි. 1981 වර්ෂයේ සිට අද දක්වා පවතින පද්ධතියට අතුළත් නොවූ සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීම සඳහා විශේෂ ඒකකයක් (MAU – Member Accounts Upgrading Unit) ආරම්භ කිරීම තුළින් ප්‍රධාන ගැටළුවකට විසඳුම් ලබා දී ඇත.

ආයතනයේ ඉදිරි වැඩකටයුතු සැලසුම් සහගතව සැකසීම සඳහා සැලසුම්, පර්යේෂණ හා ප්‍රවර්ධන අංශය (PRD – Planning, Research and Development Unit) සහ සැලසුම් කාර්ය ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා දත්ත විශ්ලේෂණය කිරීමට සංඛ්‍යාලේඛණ අංශයක් (Statistics Division) ආරම්භ කිරීම සුවිශේෂී වේ.

අප ආයතනයේ වසර 15 ට වඩා පැරණි පරිගණක පද්ධතියේ අඩුපාඩු සහ සීමාවන් හඳුනාගෙන ඒවා ප්‍රතිනිර්මාණ කිරීමට (Re-Engineering) තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණික ඒජන්සියේ (ICTA) මූල්‍ය ආධාර ඇතිව නවීන පරිගණක පද්ධතියක් ස්ථාපනය කිරීමට කටයුතු සැලසුම් කර ඇත.

දායක මුදල් අයකිරීම ප්‍රවර්ධනය සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ තාක්ෂණික සහාය ලබා ගනිමින් (EISA Project – ETF Inspection System Application) ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරයි.

අප මණ්ඩලයේ මානව සම්පත් සංවර්ධනය කිරීමේ කාලීන අවශ්‍යතාවය හඳුනාගෙන කාර්ය මණ්ඩලයට දේශීය හා විදේශීය පුහුණුව, ආධාර ලබාදෙන ආයතන හරහා ආරම්භ කරන්නට ලැබීම ගැන සතුටු වෙමි. එමෙන්ම, මණ්ඩලයේ සියළුම අංශ වල ඵලදායිතාවය ප්‍රවර්ධන වැඩ සටහන් තුළින් මහජනතාව වෙත ලබා දෙන සේවාවන් වල කාර්යක්ෂමතාවය හා ගුණාත්මක බව වර්ධනය කෙරෙනු ඇත.

2015 වසරේ සේවායෝජකයන් 76,674 ක් ආවරණය කරමින් සාමාජිකයන් ලක්ෂ 25 ට දායකත්වය ලබාදීමට හැකිවී තිබේ. එමෙන්ම, මෙම වර්ෂයේ අරමුදල රුපියල් බිලියන 218.5 ක් දක්වා වර්ධනය වී ඇත. පෙර වර්ෂ වලට වඩා දායක මුදල් රැස්කිරීම 14.1% ක ප්‍රගතියක් අත්කර ගැනීම සුවිශේෂී වේ. 2015 වර්ෂයේ රු මිලියන 18,034 ක ලාභයක් උපයාගැනීමට හැකිවූ අතර, එය අයවැයගත ඇස්තමේන්තු සමඟ සංසන්දනය කිරීමේදී රුපියල් මිලියන 552 ක වර්ධනයකි.

මේ අයුරින් ආයතනයේ පැවති ගැටළු විසඳා ගැනීම සඳහාත් අරමුදලේ ඉහළ ප්‍රගතියක් ළඟා කර ගැනීමටත් හැකිවුයේ මණ්ඩලයේ සියළුම නිලධාරීන් කණ්ඩායම් හැඟීමෙන් සහ අධිෂ්ඨානශීලීව කැපවී තම රාජකාරී ඉටු කල බැවිනි. අප සේවක මණ්ඩලයේ අප්‍රතිහත කැපවීම ඉතාම ප්‍රසංශනීය වන අතර, ඔවුනට මාගේ හදපිරි කෘතඥතාවය පිරිනැමීමට කැමැත්තෙමි.

මහින්ද මඩිහහේවා
සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය



# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව 2015

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ 2015 වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්වකීය සාමාජිකයින් වෙත මෙසේ සාඩම්බරයෙන් ඉදිරිපත් කර සිටී.

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක් වන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය 1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත යටතේ ස්ථාපිත කරන ලද අතර, එහි මෙහෙයුම් කටයුතු 1981 මාර්තු මස 01 වන දින ආරම්භ කරන ලදී. මණ්ඩලය විසින් මේ වනවිට සිය සාමාජිකයන්හට සපයන ලද සේවාවට 34 වසරක් සපිරී ඇත.

## වසර තුළ ලබාගත් ප්‍රගතිය

2015 වසර තුළ මණ්ඩලය විසින් ක්ෂේත්‍ර ගණනාවකින් අත්පත්කර ගන්නා ලද විශිෂ්ඨ ප්‍රගතිය පහත දැක්වේ.

1. සේවා යෝජකයින්ගෙන් රැස්කර ගත් දායක මුදල රුපියල් බිලියන 18 ක් වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව රුපියල් බිලියන 2.1 ක වැඩිවීමකි.

2. මණ්ඩලය විසින් 2014 වසරේදී උපයන ලද ආයෝජන ආදායම වන රුපියල් බිලියන 18.4 සාපේක්ෂව මෙම වසරේදී රුපියල් බිලියන 19.5 ක ආදායමක් ඉපයූ අතර, එය රුපියල් බිලියන 1 ක වැඩිවීමක් වූ අතර, වසර අවසානයේදී මුළු ආයෝජන කළඹ රුපියල් බිලියන 186 සිට රුපියල් බිලියන 210 ක් දක්වා වර්ධනය විය.

3. පසුගිය වසරේ උපයන ලද ශුද්ධ ලාභය වන රුපියල් බිලියන 17.1 ට සාපේක්ෂව මෙම වසරේදී රුපියල් බිලියන 18.0 ක ශුද්ධ ලාභයක් උපයා ගැනීමට හැකිවූ අතර, වසර අවසානයේදී ලාභාංශ හා පොළී වශයෙන් රුපියල් බිලියන 18 ක් සාමාජිකයන් අතරේ බෙදා හැරීමට හැකිවිය.

4. වසර අවසානය වනවිට අරමුදලේ මුළු ශුද්ධ වත්කම් වටිනාකම රුපියල් බිලියන 223 ඉක්මවිය.

5. මණ්ඩලයට 2015 වසර සඳහා සිය සාමාජිකයන් වෙත පොළී සහ ලාභාංශ වශයෙන් 9% ක් ප්‍රකාශ කිරීමට හැකිවිය (ප්‍රස්ථාර අංක 01 සහ 02 බලන්න). මෙය බැංකු සහ වෙනත් මූල්‍ය ආයතන විසින් තම පාරිභෝගිකයින් වෙත ලබාදුන් පොළී අනුපාත වලට සාපේක්ෂව ආකර්ෂණීය අනුපාතයකි.

6. 2014 දී 5.15% ක්වූ අරමුදලේ මෙහෙයුම් වියදම 2015 වසරේදී 5.8% දක්වා වැඩිවූ නමුත් එම වියදම් අපේක්ෂිත මට්ටමෙහි රඳවා ගැනීමට මණ්ඩලයට හැකිවිය. (ප්‍රස්ථාර අංක 03 බලන්න).

7. මෙම වසරේදී ශාඛා කාර්යාල ජාලය සාර්ථකව ක්‍රියාත්මක වූ අතර, හිඟ දායක මුදල්, අධිභාර සහ නීතිමය අයවීම් අයකර ගැනීම කෙරෙහිද විශේෂ අවධානයක් යොමු කරන ලදී.

8. ගම්පහ, මහනුවර, මාතර, බදුල්ල සහ කුරුණෑගල ශාඛා කාර්යාලයන්හි ද විමධ්‍යගත ප්‍රතිලාභ ගෙවීමේ වැඩ පිළිවෙල අඛණ්ඩව ඉතා සාර්ථකව පවත්වාගෙන යනු ලබන අතර, මහනුවර සහ කුරුණෑගල කාර්යාලයන් මගින් කඩිනම් ප්‍රතිලාභ ගෙවීමේ කාර්යයද සිදු කරනු ලබයි.

9. සේවායෝජකයින් චෙක්පත් මගින් කරනු ලබන මාසික දයක මුදල් ගෙවීම් ප්‍රධාන කාර්යාලයට අමතරව අපගේ ප්‍රාදේශිය කාර්යාල ජාලය හා ලංකා බැංකු ගොඩනැගිල්ලෙහි පිහිටි අප මණ්ඩලීය නගර ශාඛා කාර්යාලය මගින් සිදුකරනු ලබයි.

10. සේවායෝජකයින් වඩාත් දැනුවත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස 2010 නොවැම්බරයේදී යාපනයෙහි ස්ථාපිත නව ප්‍රාදේශීය කාර්යාලය මාසිකව රුපියල් මිලියන 10 කට ආසන්න දායක මුදල් සාමාන්‍යයක් සහ 1600 කට ආසන්න සේවායෝජකයින් ප්‍රමාණයක් වාර්තා කරමින් ධෛර්ය ගන්වන සුළු ප්‍රගතියක් පෙන්නුම් කරන ලදී.

11. මේ වනවිට සේවායෝජකයින් 2,867 කට ආසන්න ප්‍රමාණයක් අන්තර්ජාල බැංකු ක්‍රමය හරහා දායක මුදල් ගෙවීම් කරනු ලබන අතර, එය මුළු දායක මුදලින් 37% කට ආසන්න ප්‍රමාණයක් වනු ඇත.

12. සේවායෝජකයින් වෙනුවෙන් දිස්ත්‍රික්ක 05 ක පමණ විධිමත් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්විය.

13. 2015 වර්ෂයේ ස්වයං රැකියාලාභීන්ට සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ සාමාජිකත්වය ලබාදීමේ වැඩසටහන යටතේ මිල්කෝ ආයතනය සම්බන්ධීකරණයෙන් ඒකාරාශිවී සිටින ස්වයං පාලිත කිරිගොවි සමිතිවල කිරිගොවීන් හා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සම්භාණ්ඩ නිෂ්පාදන ආයතනයේ පුහුණුව ලත් සුළු පරිමාන ව්‍යවසායකයින්  බඳවා ගැනීමට හැකි විය.

මීට අමතරව සැලසුම් ශිල්පීන්, මල් වගාකරුවන්, විසිතුරු මත්ස්‍ය වගාකරුවන්, පෙරපාසැල් ගුරුවරියන්, ඉදිකිරීම් කර්මාන්තයේ නියැලෙන්නන්, බස්රථ හිමිකරුවන්, රියදුරන් හා කොන්දොස්තරවරුන්, ත්‍රීරෝද රථ රියදුරන් යනාදී ස්වයං රැකියා ලාභීන් දැනුවත් කිරීමේ වැඩපිළිවෙල තුළින් සාමාජියන් ලෙස බඳවා ගැනීමට කටයුතු කරන අතර සමස්ථ සාමාජිකත්වය 39,099 ක් දක්වා සහ 2015 වසර තුලදී ලද සාමාජික මුදල් රු මිලියන 43 ක් දක්වාද වැඩිකර ගත හැකි විය.

14. මානව සම්පත් සංවර්ධනය සඳහා වඩාත් ප්‍රමුඛතාවයක් දී කටයුතු කල අතර, විවිධ මට්ටම්වල සමස්ථ කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩ සටහන් සම්මන්ත්‍රණ, වැඩමුළු ආදිය පවත්වා, සේවක මණ්ඩලයේ හැකියාව, ආකල්ප සහ දැනුම වර්ධනය කිරීමට කටයුතු කරන ලදී. මේ අතර වෘත්තිය  සමිති සාමාජිකයන්ද අදාල ක්ෂේත්‍රයන්හි විවිධ පුහුණු වැඩ සටහන් සඳහා යොමු කරවන ලදී. මෙම වර්ෂයේදී විදේශ පුහුණුවීම් සඳහා ඉහළ කළමනාකරණය යොමු කරන ලදී.

15. කළමනාකාරිත්වය හා වෘත්තිය සමිති අතර කාර්මික සම්බන්ධතාවය සුහද මට්ටමකින් පවත්වා ගැනීමට හැකිවූ අතර, සමස්ත කාර්ය ක්ෂේත්‍රයන්ගෙන් මණ්ඩලය ලබාගත් විශිෂ්ඨ ප්‍රගතිය සඳහා එයද මනා පිටුවහලක් විය.

**2015 වසර තුළ මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන් පහත අයුරින් අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබිණි.**

# ප්‍රධාන කාර්යයන්

## සේවායෝජක දායක මුදල් සහ සාමාජික ගිණුම්

සේවායෝජකයන්ගෙන් දායක මුදල් රැස්කිරීම සහ එම මුදල් කලට වේලාවට බැංකුගත කිරීම දායක මුදල් රැස්කිරීම් අංශයේ කාර්ය භාරය වන අතර, සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීම සහ වාර්ෂික සාමාජික ගිණුම් ප්‍රකාශ නිකුත් කිරීම සාමාජික ගිණුම් අංශයේ කාර්ය භාරය වේ.

සාමාජිකයන් සඳහා වඩාත් ඵලදායි සහ කඩිනම් සේවාවක් සැලසීමේ අභිලාෂයෙන් මණ්ඩලයට දායක මුදල් ගෙවනු ලබන සේවායෝජකයින් විශාල හා කුඩා කාණ්ඩයේ ලෙස වර්ග කර ඇත. සේවකයින් 15 කට අඩු සේවායෝජකයන් කුඩා කාණ්ඩය වශයෙන්ද, සේවකයින් 15 වැඩි සේවායෝජකයින් විශාල කාණ්ඩය වශයෙන්ද, වර්ගීකරණය කර ඇත.

2015 වසර තුළ නව සේවායෝජකයින් 8,607 දෙනෙක් අරමුදලට දායක මුදල් ගෙවීම ආරම්භ කළ අතර වසර අවසානය වන විට මුළු සේවායෝජකයින්ගේ සංඛ්‍යාව 76,674 දක්වා වර්ධනය විය. ඒ අනුව 2014 වසරේදී ලැබුණු මුළු දායක මුදල වන රුපියල් බිලියන 15.9 ට සාපේක්ෂව 2015 වසරේදී ඔවුන්ගේ සේවකයින් වෙනුවෙන් ලැබූ දායක මුදල රුපියල් බිලියන 18.0 කි. (ප්‍රස්ථාර අංක 04 බලන්න). මේ අතර වසර ආරම්භයේදී රුපියල් බිලියන 193.8 ක්වූ සාමාජික අරමුදල සමාලෝචිත වසර අවසානයේදී රුපියල් බිලියන 218.5 ක් දක්වා වර්ධනය විය. (ප්‍රස්ථාර අංක 05 බලන්න).

## සාමාජික ප්‍රතිලාභ සහ සුභසාධන ප්‍රතිලාභ

සාමාජිකයින්ගේ දායක මුදල් ආපසු ගෙවීමේ සහ ප්‍රතිලාභ අයදුම්පත් භාර ගැනීම, ඒවා කඩිනමින් නිම කිරීම සහ ගෙවීම් කිරීම මෙම අංශයන්හි කාර්ය භාරය වේ.

ඊයට අමතරව සාමාජිකයන් වෙනුවෙන් දායක මුදල් නියමිත දිනයන්හි ප්‍රේෂණය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව සේවායෝජකයින් දැනුවත් කිරීම, අනිකුත් ප්‍රතිලාභ යෝජනා ක්‍රම සහ සාමාජික අයිතිවාසිකම් සම්බන්ධයෙන් සාමාජිකයින් සහ සේවායෝජකයින් දැනුවත් කිරීම සාමාජික සේවා අංශයේ කාර්ය භාරය යටතට ගැනේ. විවිධ ආයතන, වෘත්තීය සමිති, වෘත්තිකයන්ගේ සංවිධාන සහ මහජනතාවගේ ඉල්ලීම් මත එම කණ්ඩායම් දැනුවත් කිරීමේ වැඩ සටහන් නිරතුරුව ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි.

වසර 2015 දී ප්‍රතිලාභ අයදුම්කරුවන් 162,983 ක් වෙනුවෙන් රුපියල් බිලියන 11.6 ක් ගෙවන ලදී. මේ සඳහා 2014 වසරේදී අයදුම්කරුවන් 183,928 වෙනුවෙන් රුපියල් බිලියන 14 ක් ගෙවන ලදී. (ප්‍රස්ථාර අංක 06 බලන්න) ප්‍රතිලාභ අයඳුම්පතක් සඳහා ගෙවන ලද සාමාන්‍ය පසුගිය වසරට සාපේක්ෂව රු76,496 සිට රු 71,421 දක්වා අඩුවීමක් පෙන්නුම් කරයි.

වසර 2015 තුලදී සුබසාධන ප්‍රතිලාභ අයඳුම්කරුවන් 3,481 ක් වෙනුවෙන් රුපියල් මිලියන 209 ක් ගෙවන ලදි. මේ සඳහා වසර 2014 තුලදී අයඳුම්කරුවන් 3,974 ක් වෙනුවෙන් රුපියල් මිලියන 180 ක් ගෙවන ලදි. 2015 වසරේදී 05 වසර ශිෂ්‍යත්ව විභාගයෙන් සමත්, අරමුදලේ සාමාජිකයන්ගේ දරුවන් 7,440 ක් වෙනුවෙන් රුපියල් මිලියන 116 ක් මහජන බැංකුව වෙත නිදහස් කරන ලදි. සාමාජිකයන්ගේ, අපොස (උසස් පෙළ) සමත් දරුවන් 1,718 ක් සඳහා ඔවුන්ගේ උසස් අධ්‍යාපන කටයුතු වෙනුවෙන් 2015 වසරේදී රු..මිලියන 20.6 ක් ගෙවන ලදී.(ප්‍රස්ථාර අංක 07 බලන්න).

සිය සාමාජිකයන් වෙනුවෙන් පහත සඳහන් ප්‍රතිලාභ යෝජනා ක්‍රම 10 මණ්ඩලය විසින් දැනට ක්‍රියාත්මක කෙරේ.

1. මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය : උපරිමය රු. 100,000/=
2. හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර : උපරිමය රු. 300,000/=
3. වකුගඩු බද්ධ කිරීම් සඳහා මූල්‍යාධාර : උපරිමය රු. 300,000/=
4. නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය : උපරිමය රු. 200,000/=

5. අභ්‍යන්තර අක්ෂිකාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය : ඇස් දෙකම සඳහා
   රු. 18,000/=
6. සේනිභාඅ සාමාජිකයන්ගේ දරුවන් සඳහාවූ 05 වසර ශිෂ්‍යත්ව මුලයාධාර
   රු 15,000/= බැගින් ශිෂ්‍යත්ව 9,000 ක් වාර්ෂිකව
7. ශ්‍රම සුව රැකවරණ රෝහල්ගත වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය රු. 25,000/= බැගින්
   රු. 50,000/= ක උපරිමය මුළු සේවා කාලය තුළදී)
8. "වියන" අඩු පොලී නිවාස ණය යෝජනා ක්‍රමය
9. සේවා කාලය තුළදී නිත්‍ය දුබලතාවයට පත් අරමුදලේ සාමාජිකයින්ගේ 05 වසර සමත් දරුවන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය
10. අපොස (උසස්පෙළ) විභාගය සමත් අරමුදලේ සාමාජිකයින්ගේ දරුවන් 5,000 කට
    රු. 12,000/= බැගින් වාර්ෂික මුලයාධාර

- ඉක්මණින් මුදල් ලබාගැනීමේ අවශ්‍යතාව සහිත සාමාජිකයන්ගේ පහසුව සඳහාවූ කඩිනම් ප්‍රතිලාභ ගෙවීම් සේවාව අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ.

## සාමාජික ගිණුම් පවත්වාගැනීම

සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීම සහ වාර්ෂික සාමාජික ගිණුම් ප්‍රකාශන සක්‍රීය සාමාජිකයින් වෙත නිකුත් කිරීම සාමාජික ගිණුම් අංශයේ ප්‍රධාන කාර්ය භාරය වේ.

වසර අවසානය වනවිට අරමුදලේ සක්‍රීය හා අක්‍රීය සාමාජික ගිණුම් සංඛ්‍යාව ආසන්න වශයෙන් මිලියන 12.5 ක් පමණ විය. මෙම සියලුම සක්‍රිය හා අක්‍රීය සාමාජික ගිණුම් වාර්ෂිකව යාවත්කාලීන කරමින් අරමුදල පවත්වාගෙන යයි.

2015 වර්ෂය අවසාන වනවිට 2014 වර්ෂය දක්වා සාමාජික ගිණුම් 12,182,280 ක් යාවත්කාලීන කිරීමට හැකිවූ අතර, එය ආසන්න වශයෙන් ඇස්තමේන්තුගත මුළු සාමාජික සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස ගත්කල 97% ත් පමණ විය. මෙම සංඛ්‍යාවෙන් 9,881,300 ක් අක්‍රීය සාමාජික ගිණුම් වන අතර 2,300,980 සක්‍රීය සාමාජික ගිණුම් විය. මෙම සක්‍රීය සාමාජික ගිණුම් සඳහා වාර්ෂික ගිණුම් ප්‍රකාශන අදාල සේවායෝජකයින් වෙත නිකුත් කර ඇත.

## ආයෝජන

පසුගිය වසරේ රුපියල් බිලියන 186 ක්වූ ආයෝජන කළඹ 2015 වසරේදී රුපියල් බිලියන 210 ක් දක්වා වර්ධනය වූ අතර එය ඉකුත් වසරට සාපේක්ෂව 12.9% ක වැඩිවීමකි.

2015 වසර තුළදී මණ්ඩලය සිය ආයෝජන මාර්ගෝපදේශයන් ඉතාමත් වගකීමකින් අනුගමනය කළ අතර, ආයෝජිත ප්‍රාග්ධනයද සුරක්ෂිත කර ගනිමින් ඉහළ ප්‍රතිලාභයක් ද අත්පත් කරගන්නා ලදී.

වසර අවසානයේදි ආයෝජන කළඹින් රු. බිලියන 192 (91.5%) ක් රජයේ සුරැකුම්පත් වල ආයෝජනය කර තිබූ අතර, රජයේ සුරක්ෂිත ස්ථාවර ආදායම් උපකරණ වල රු. බිලියන 3 (1.3%) ක්ද, ස්කන්ධ ප්‍රාග්ධන ආයෝජනය රු. බිලියන 10.8 (5.1%) හා අනෙකුත් ආයෝජන රු බිලියන 4.2 (2.1%) ක්ද විය. (ප්‍රස්ථාර අංක 08 බලන්න)

කොටස් වෙළඳපොළ ආයෝජන මඟින් ලාභාංශ සහ ප්‍රාග්ධන ලාභ ලෙස පසුගිය වසරේ උපයන ලද රු. මිලියන 1,204 ට සාපේක්ෂව 2015 වසරේදී රු. මිලියන 1,194 ක ලාභයක් උපයාගෙන තිබුණි.

පෙර සඳහන් කළ පරිදි සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය 2014 වසරේ ඉපයූ රු. බිලියන 18.4 සාපේක්ෂව 2015 වසර තුළදී රු. බිලියන 19.5 ක ආයෝජන ආදායමක් උපයාගෙන තිබුණු අතර, එය රු. බිලියන 1.1 ක වර්ධනයකි.

2015 වසර අවසානයේදී සාමාජිකයන්ට වඩාත් සාධාරණ ලාභාංශ ප්‍රතිශතයක් ලබා දීම සඳහා ආදායම් ඉලක්ක සපුරා ගැනීමේ අරමුණින් වාණිජ පත්‍ර සහ ණයකර ආදී විකල්ප ආයෝජනයන් කෙරෙහි මණ්ඩලයේ අවධානය යොමුව පවතී. එසේම ද්විතීයක වෙළඳ පොළෙහි වඩාත් ආකර්ෂණීය වාසි අත්කර ගැනීම සඳහා ණයකර අලෙවි කිරීමේ හැකියාව ඇත්දැයි තවදුරටත් පරීක්ෂා කරගෙන යනු ලැබේ.

ශ්‍රී ලංකා සුරැකුම් පත් හා විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් වෙළඳ පොළ මගින් පවත්වනු ලබන අදාළ පාඨමාලා සඳහා යොමු කිරීමෙන් ආයෝජන විශ්ලේෂණ හා පර්යේෂණ සඳහා කාර්ය මණ්ඩල පුහුණු කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත.

තවද, ආයෝජන කමිටුව විසින් ආයෝජන අවස්ථා සහ විකල්පයන් අධ්‍යනය කර නිර්දේශයන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරේ.

## රැස්කිරීම් හා සේවා යෝජක සබඳතා

දිවයිනපුරා ප්‍රාදේශිය කාර්යාල 17 ක කාර්ය මණ්ඩලය 332 දෙනෙකු මඟින් ක්‍රියාත්මක කිරීම් හා නීති කටුයතු ඔස්සේ මාසික දායක මුදල් රැස්කිරීම, ගෙවීම් පැහැරහරින්නන් හඳුනාගැනිම, අයකර ගැනිමේ ක්‍රියාවලිය හා අපගේ පනතට අනුකූලව සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ සාමාජිකයින් බඳවා ගැනීම අප කොට්ඨාශයේ ප්‍රමුඛ කාර්ය භාරය වේ.

ප්‍රාදේශිය කාර්යාල 17 ක් මගින් දිවයින පුරා සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ක්ෂේත්‍ර පරීක්ෂන සංචාර සිදුකර නොගෙවන ලද සේවායෝජකයින් හසුකර ගැනීම තුලින් සක්‍රීය සේවා යෝජකයින් සංඛ්‍යාව පසුගිය වසරට සාපේක්ෂව 76,674 දක්වා වැඩිකිරීමට කටයුතු කරන ලදි, අප මණ්ඩලයේ පරිගණක ජාලය තුලින් දිවයින පුරා මෙහෙයුම් කටයුතු සිදු කිරීම සහ න්‍යාමනය කිරීම සාර්ථකවූ බවත්, ඒ අනුව 2014 ට වඩා 2015 වර්ෂය තුළ දයක මුදල් රුපියල් මිලියන 2,641 ක් වැඩිකර ගැනීමට හැකිවූ බවත් දන්වමු.

අන්තර්ජාලය ඔස්සේ කොමර්ෂල් බැංකුව, ලංකා බැංකුව, මහජන බැංකුව, සම්පත් බැංකුව හා හැටන් නැෂනල් බැංකුව හරහා දයක මුදල් හා සේවක විස්තර එවීමේ වැඩපිළිවෙල සාර්ථකවූ අතර, එම මුළු මාසික දයක මුදලින් 27.5% කට වැඩි මුදලක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගැනීමට හැකිවිය.

2014 ට වඩා අනුකූලතා අගය 2015 වසරේදී වැඩිකර ගැනීමට හැකිවුයේ නිරන්තරයෙන් ප්‍රාදේශිය කාර්යාල හරහා සේවායෝජකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් නිසා බැව් සිහිපත් කරමු.

2015 වසරේදී ප්‍රාදේශිය කළමනාකරුවන් සහ ක්ෂේත්‍ර නිලධාරින් සඳහා නේවාසික හා එක්දින පුහුණු වැඩමුළු මගින් සමස්ථ කම්කරු ජනතාවට බලපාන අනපනත්, නීති රෙගුලාසි සහ පුහුණු වැඩමුළු ගණනාවක් සංවිධානය කළ අතර, එමගින් ප්‍රාදේශිය කාර්යාලයන්හි කාර්ය මණ්ඩලයට න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම වර්ධනය කර ගැනීමට ඉවහල්වූ බව දන්වා සිටිමු.

## පරිපාලන හා මානව සම්පත්

සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලයේ විශ්‍රාම ගැනිම්, සේවයෙන් ඉල්ලා අස්වීම්, සේවය අවසන් කිරීම ආදී හේතූන් මත සේවයෙන් ඉවත්වූ සංඛ්‍යාව 16 ක් විය. එයට අමතරව ඉහළ ශ්‍රේණි සඳහා උසස්වීම් ලද සංඛ්‍යාව 7 ක් විය. මේ අනුව වසර අවසානයේදී මණ්ඩලයේ මුළු සේවක සංඛ්‍යාව 929 ක් විය.

පසුගිය වසරේදී මෙන් මෙම වසරේදීද සියළුම මට්ටම් වල කාර්ය මණ්ඩල සාමාජිකයන්ට ඔවුන්ගේ ක්ෂේත්‍රයන්ට අදාල පුහුණුවීම් ලබා ගැනීමට අවස්ථාවන් උදාකර දෙන ලද අතර එය කාර්ය මණ්ඩලයේ ඵලදායිත්වය, කාර්ය සාධනය හා ආකල්ප වර්ධනයට ඉවහල් විය. එම තත්ත්වය වසර තුළ මණ්ඩලය විසින් ලඟාකරගත් විශිෂ්ඨ ප්‍රගතිය සඳහා විශාල දායකත්වයක් සපයන ලදී. තොරතුරු තාක්ෂණ අංශයේ අදාල කාර්ය මණ්ඩල පුහුණුව සඳහා විශේෂ අවධානයක් යොමුවූ අතර ඒ හා සමානවම කාර්ය මණ්ඩලයේ භාෂා නිපුනත්වය වැඩි දියුණු කිරීම කෙරෙහි ද යොමු කරන ලදී. එසේම ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය ද ඔවුන්ගේ දක්ෂතා වර්ධනයට අදාළ පුහුණු වැඩසටහන් කෙරෙහි යොමු කරවන ලදී.

## මුදල්

මණ්ඩලයේ සමස්ථ මුල්‍ය කටයුතු සම්බන්ධීකරණය කිරීමේ වගකීම මුදල් කොට්ඨාශයට පැවරී ඇත.

මණ්ඩලයේ සියළු ආදායම් සහ වියදම් ගිණුම්ගත කිරීම, සියළු කාර්ය මණ්ඩල ගෙවීම්, සැපයුම් සහ සේවාවන් වෙනුවෙන් ගෙවීම්, මාසික සහ අවසාන ගිණුම්, ප්‍රගති වාර්තා, වාර්ෂික අයවැය ලේඛණය

පිළියෙල කිරීම, වාර්ෂික ලාභාංශ තීරණය කිරීම සහ අනෙකුත් කළමනාකරණ තොරතුරු සැපයීම යනාදී කටයුතු මෙම කොට්ඨාශය මගින් තව දුරටත් පවත්වා ගෙන යනු ලැබුණි.

ඉහත සඳහන් කාර්යයන්ට අමතරව මණ්ඩලයේ ආයතනික සැළැස්ම සහ ක්‍රියාකාරී සැළසුම් සකස් කිරීම, වාර්ෂික වාර්තාව පිළියෙල කිරීම, විගණන විමසුම් සඳහා පිළිතුරු සම්බන්ධීකරණය කිරීම, බාහිර ආයතනයන් සඳහා මුල්‍යමය තොරතුරු සැපයීම සහ අනෙකුත් මුල්‍ය ලේඛණ පවත්වාගෙන යාමද මෙම කොට්ඨාශය මගින් සිදු කරනු ලබයි.

## අභ්‍යන්තර විගණන

ආයතනයේ කටයුතු වලට අදාල ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමෝපායන් පවත්වා ගැනීමට සහය වීම හා මුල්‍ය හා මෙහෙයුම් විනය උසස් ලෙස පවත්වා ගැනිමට උපකාරි වීම අභ්‍යන්තර විගණන කොට්ඨාශයේ ප්‍රධාන කාර්ය භාරය ලෙස සැලකිය හැකිය. මේ අතර ආයතනයේ විගණන කමිටුවේ සම්බන්ධීකරණ කටයුතු අභ්‍යන්තර විගණනන අංශය විසින් සිදුකරන අතර, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුගේ සභාපතිත්වය යටතේ සෑම කාර්තුවකම රැස්වී ආයතනයේ මෙහෙයුම් පද්ධතීන් හි පවත්නා ගැටළු විමසීමට භාජනය කරන අතර, ඒවා නිවැරදි කිරීම සඳහා පියවර ගැනුණි. එමෙන්ම ආයතනයේ අරමුදලින් සැලකියයුතු ප්‍රතිශතයක් ප්‍රතිලාභ ගෙවීම් සහ අරමුදල් ආපසු ගෙවීම් වශයෙන් සාමාජිකයන් වෙත මුදා හැරීමේ කටයුතු විගණනය කිරීමේ කටයුතුද මෙම අංශයෙන් සිදුකරනු ලබයි. තවද 2015 වසර තුළදී තෝරාගත් ප්‍රාදේශීය කාර්යාලයන්හි කටයුතු විමර්ශනය කෙරුණු අතර සියළුම ප්‍රධාන මෙහෙයුම් පිළිබඳවද වාර්තා කරන ලදී. මීට අමතරව තොරතුරු තාක්ෂණ කොට්ඨාශය මගින් සිදුකරනු ලබන මෘදුකාංග මොඩ්‍යුල නවීකරණයන්හිදී විගණන දෘෂ්ඨිකෝණයට අදාළව විශේෂිත කාර්යයන් සඳහා උපදෙස් ලබා දීමද මෙම කොට්ඨාශය විසින් සිදුකරනු ලබයි. අභ්‍යන්තර විගණන සැලැස්මද සමාලෝචිත වසරේදී සාර්ථකව ක්‍රියාත්මක කරන ලද අතර, විශේෂ විමර්ශන ද මෙම කොට්ඨාශය විසින් සිදු කරන ලදී.

## තාක්ෂණය

මණ්ඩලයේ සියළුම මෙහෙයුම් කටයුතු එනම් සාමාජික ගිණුම්, රැස්කිරීම්, සාමාජික සේවා, නීති හා ක්‍රියාත්මක කිරීම් ආදිය මුළුමනින්ම පරිගණක තාක්ෂණය උපයෝගී කරගනිමින් ක්‍රියාත්මක වේ. මෙම කටයුතු ආයතනයේ ප්‍රධාන පරිගණක පද්ධතිය වන සාමාජික පරිපාලන මෘදුකාංග පද්ධතිය (Member Administration Software System) භාවිතා කරගනිමින් සිදුකරනු ලබයි. එසේම ආයතනයේ මුල්‍ය සහ පරිපාලන අංශවල කටයුතුද පරිගණක මෘදුකාංග භාවිතා කරමින් සිදුකරනු ලබයි. ඒ අනුව, ආයතනයේ ප්‍රධානතම අංශ සියල්ලම සඳහා මේ වනවිට පරිගණක තාක්ෂණය හඳුන්වා දී ඇත. IPVPN තාක්ෂණය උපයෝගි කර ගනිමින් ආයතනයේ කලාප කාර්යාල ජාලයද ප්‍රධාන පරිගණක පද්ධතිය සමග සම්බන්ධ කර සියළුම සාමාජික සේවා විමධ්‍යගත කර ඇත. 2015 වසර වනවිට වාණිජ බැංකු 05 ක් හරහා අන්තර්ජාල බැංකු ක්‍රමය (Online Banking) උපයෝගී කරගනිමින් සාමාජික මුදල් ප්‍රේෂණය කිරීමට සහ සාමාජික තොරතුරු ලබාදීමට පහසුකම් සලසා ඇත. එසේම ඉන්ට්‍රානෙට් (Intranet) තාක්ෂණය උපයෝගී කර ගනිමින් ආයතනයේ එක් එක් කොට්ඨාශ සහ ප්‍රාදේශිය කාර්යාල අතර, තොරතුරු හුවමාරු කර ගැනිමේ කටයුතු පහසු කරන ලදි. මේ අනුව ඉදිරියේදිත් ආයතනයේ කටයුතු සඳහා නව තාක්ෂණය හඳුන්වා දෙමින් සාමාජිකයන් සහ සේවායෝජකයින් සඳහා වඩා කාර්යක්ෂම සේවාවක් සැපයීමට අරමුණු කරගෙන සිටී.

## සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත සඳහා සංශෝධන

1993 වසරේ සිට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත සංශෝධනයකට භාජනය නොකෙරුණු අතර ප්‍රවර්ථන අවශ්‍යතා සහ සංවර්ධනයට සාපේක්ෂව මෙම පනතට සංශෝධනයන් කළ යුතු බවට කළමනාකාරිත්වය තීරණය කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සහ ජ්‍යෙෂ්ඨ නිළධාරින්ගෙන් සමන්විත විශේෂ උප කමිටුවක් මගින් අවශ්‍ය සංශෝධනයන් නිර්දේශ කර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලදුව එකී යෝජිත සංශෝධනයන් අනුමත කර ජාතික කම්කරු උපදේශක (NLAC) වෙත යොමුකරන ලදී. මෙම යෝජිත සංශෝධන ජාතික කම්කරු උපදේශක කමිටුවෙහි අනුමැතියෙන් අනතුරුව කැබිනට් මණ්ඩලය අනුමැතිය සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය වෙත අගෝස්තු මස ඉදිරිපත් කිරීමට නියමිතය.



# මූල්‍ය ප්‍රකාශන

# 2015

**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය**
**2015 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**ආදායම් ප්‍රකාශනය**

| | සටහන් | 2015 | 2014 |
|---|---|---|---|
| **ආදායම්** | | රු. '000 | රු. '000 |
| පොළී ආදායම | 1 | 18,318,740 | 17,311,835 |
| ලාභාංශ ආදායම | 2 | 360,582 | 309,256 |
| ලාභාලාභ ගිණුම හරහා මූල්‍ය වත්කම් මත | | | |
| ශුද්ධ ලාභ/(අලාභ) | 3 | 833,850 | 894,917 |
| අනෙකුත් ආදායම් | 4 | 320,139 | 317,455 |
| **මුළු ආදායම් එකතුව** | | **19,833,312** | **18,833,463** |
| **වියදම්** | | | |
| සේවක මණ්ඩල වියදම් | 5.1 | 994,389 | 813,000 |
| මෙහෙයුම් වියදම් | 5.2 | 132,608 | 134,786 |
| මූල්‍ය වියදම් | 5.3 | 1,988 | 3,041 |
| සාමාජික වියදම් | 5.4 | 429,610 | 380,512 |
| දේපළ, පිරියත හා උපකරණ ක්ෂයවීම් | | 16,896 | 18,605 |
| ප්‍රවර්ථන වර්ෂයේ ගෙවන ලද පොළී | | 148,737 | 209,073 |
| **මුළු මෙහෙයුම් වියදම** | | **1,724,228** | **1,559,014** |
| ආදායම් බදු වලට පෙර ලාභය | | **18,109,084** | **17,274,449** |
| ආදායම් බදු වියදම | 6 | 105,183 | 202,131 |
| **ආදායම් බදු වලට පසු ලාභය** | | **18,003,901** | **17,072,318** |
| ප්‍රවර්ථන වර්ෂයේ ලාභයට ගැලපුම | | 30,073 | 59,941 |
| **ගලපන ලද වර්ෂයේ ලාභය** | | **18,033,974** | **17,132,259** |
| ඉ/ගෙ. රඳවාගත් ලාභය | | 1,486,827 | 33,559 |
| විකිණීම පිණිස ඇති මූල්‍ය උපකරණ සංචිතය අරමුදලට මාරුකිරීම | | (1,468,737) | - |
| ලාභාංශ තුළන සංචිත අරමුදලින් මාරුකිරීම | - | ----- - | 515,000 |
| **විසර්ජනය සඳහා වූ ලාභය** | | **18,052,064** | **17,680,818** |
| අඩුකළා : යෝජිත විභජනයන් - පොළී 3% | | 6,013,817 | 5,287,328 |
| - ලාභාංශ 6% | | 12,027,634 | 12,337,098 |
| **විසර්ජනයට පසු ලාභය** | | **10,613** | **56,393** |
| අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය | | | |
| විකිණීම පිණිස ඇති මූල්‍ය උපකරණ සංචිතය | | 60,425 | 1,468,737 |
| ආයුගණන ලාභය / (අලාභය) | | (29,794) | (38,303) |
| අසම්භාව්‍ය බැරකම් වෙන්කිරීම | | (21,900) | - |
| **අනෙකුත් විස්තීරණ ආදයම්** | | **8,731** | **1,430,434** |
| **වර්ෂයට අදාල මුළු විස්තීරණ ආදයම්** | | **19,344** | **1,486,827** |

**නිවැරදි බවට සහතික කළේ,**

එම් ඒ වී කුමුදිනි
මූල්‍ය කළමනාකාරිනි

එන් ඩබ්ලිව් විමලවීර
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

පිටු අංක 34 සිට 43 දක්වා ඇති ගිණුම්කරණ සටහන් හා පිටු අංක 44 සිට 55 දක්වා ඇති ගිණුම්කරන ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ. මෙම අවසාන ගිණුම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.

මණ්ඩලය වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන අත්සන් කරන ලදි.

මහින්ද මඩිහහේවා
සභාපති/ප්‍රධාන විධායක නිළධාරි

## සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
## 2015 දෙසැම්බර් මස 31 දිනට
## මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | සටහන් | 2015<br>රු. '000 | 2014<br>රු. '000 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| මුදල් හා මුදල් සමානයන් | | 841,949 | 2,634,973 |
| විකිණීම පිණිස රඳවා ගත් අනෙකුත් මූල්‍ය වත්කම් | 7 | 1,829,018 | 733,167 |
| විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන | 8 | 8,973,928 | 8,592,784 |
| පරිනත වීම තෙක් රඳවා ගත් මූල්‍ය ආයෝජන | 9 | 198,320,192 | 169,651,791 |
| ණය සහ ලැබිය යුතු මූල්‍ය ආයෝජන | 10 | 1,336,538 | 7,535,296 |
| අනෙකුත් වත්කම් | 11 | 7,865,283 | 6,512,779 |
| දේපළ, පිරියත සහ උපකරණ | 12.1 | 173,144 | 187,008 |
| අස්පෘශ්‍ය වත්කම් | 12.2 | 266 | 369 |
| ආයෝජන දේපළ | 13 | 3,200,000 | 3,200,000 |
| **මුළු වත්කම්** | | **222,540,319** | **199,048,167** |
| **බැරකම් හා ස්කන්ධය** | | | |
| ප්‍රවර්තන බදු බැරකම | | 33,582 | 68,330 |
| අනෙකුත් බැරකම් | 14 | 351,851 | 249,680 |
| ප්‍රතිපාදන | 15 | 213,754 | 76,923 |
| **මුළු බැරකම්** | | **599,187** | **394,933** |
| මුළු ස්කන්ධය | 16 | 221,941,132 | 198,653,233 |
| **මුළු බැරකම් හා ස්කන්ධය** | | **222,540,319** | **199,048,167** |

**නිවැරදි බවට සහතික කළේ**

එම් ඒ වී කුමුදිනි
මූල්‍ය කළමනාකාරිනි

එන් ඩබ්ලිව් විමලවීර
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

ආරම්භක හඳුනාගැනීමෙන් අනතුරුව සිදුවී ඇත්නම් (දරා ඇති අලාභ සිද්ධිය) සහ එම සිද්ධිය (හෝ සිද්ධි) එම මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් සමූහයේ ඇස්තමේන්තුකළ අනාගත මුදල් ප්‍රවාහයන්ට කිසියම් බලපෑමක් සිදුව ඇතැයි විශ්වාසනීයව ඇස්තමේන්තු කළ හැකි විය යුතුය.

## ක්‍රමක්ෂය පිරිවැයට ධාරණය කළ වත්කම්

මණ්ඩලය ප්‍රථමයෙන් තනිව හා තනිව වැදගත් හා සාමූහිකව නොවැදගත් මූල්‍ය වත්කම් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි තිබේදැයි තක්සේරු කරනු ලබයි. එසේ තනිව තක්සේරු කරන ලද මූල්‍ය වත්කමක් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි නොමැති යයි මණ්ඩලය තීරණය කරන්නේ නම් එම මූල්‍ය වත්කමට සමාන ණය අවදානමක් ඇති මූල්‍ය වත්කම් සමූහයකට ඇතුලත් කර එම වත්කම් හානිකරණය සඳහා සාමූහිකව තක්සේරු කරනු ලැබේ. හානිකරණ අලාභ සඳහා තනිව තක්සේරු කරන ලද වත්කම මත හානිකරණ අලාභ පවතී නම් හෝ ඒ බව අඛණ්ඩව හඳුනාගෙන තිබේ නම් ඒවා සාමූහික තක්සේරුවකට ඇතුලත් කරනු නොලැබේ.

වත්කමක් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි ඇත්නම්, එහි අලාභය ලෙස මිනුම්කරණය කරනු ලබන්නේ වත්කමේ ධාරණ අගය සහ ඇස්තමේන්තුකළ අනාගත මුදල් ප්‍රවාහයන්ගේ (මෙතෙක් දරා නොමැති අනාගත ණය අලාභ හැර) වර්තමාන අගය අතර වෙනසය. වත්කමෙහි ධාරණ අගය දීමනා ගිණුමක් මඟින් අඩුකරන අතර අලාභය ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබේ. අඩුකරන ලද ධාරණ අගයට පොළී ආදායම අඛණ්ඩව උපචිත කරන්නේ නම් සහ අනාගත පොළී මුදල් ප්‍රමාණයන් වට්ටම් කිරීම සඳහා යොදාගත් පොළී ප්‍රතිශතයන් හානිකරණ අලාභ මිනුම්කරණය සඳහාද යොදාගනු ලැබේ.

පොළී ආදායම "පොළී ආදායමේ" කොටසක් ලෙස වාර්තා කරනු ලැබේ. අනාගතයේදී අයකර ගැනීමේ හැකියාවක් නොමැති ණය හා සම්බන්ධිත දීමනාවන් ලියා හරිනු ලැබේ. පසු වර්ෂයකදී හානිකරණ අලාභයේ අගය වැඩිවන්නේ නම් හෝ අඩුවන්නේ නම් හෝ හානිකරණය හඳුනාගැනීමෙන් පසුව සිදුවූ සිද්ධියකට අදාළ කර ගත හැකි නම්, කළින් හඳුනාගත් හානිකරණ අලාභය දීමනා තුළින් අඩු හෝ වැඩි කිරීම මඟින් ගලපනු ලැබේ.

ඇස්තමේන්තුකළ අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන වටිනාකම මූල්‍ය වත්කමේ සපල පොළී අනුපාතය මඟින් වට්ටම් කරනු ලැබේ. ණය සඳහා විචල්‍ය පොළී අනුපාතයක් පවතින්නේ නම්, කිසියම් හානිකරණ අලාභයක් මිනුම්කරණය සඳහා වට්ටම් අනුපාතය ලෙස ප්‍රවර්තන සපල පොළී අනුපාතය යොදා ගත යුතුවේ. ව්‍යවසාය වෙළඳ වත්කම්, ණය හෝ අත්තිකාරම් වශයෙන් ප්‍රතිවර්ගීකරණය කරන්නේ නම්, හානිකරණ අලාභය නව සපල පොළී අනුපාතය මත ප්‍රතිවර්ගීකරණ දිනයේදී නිර්ණය කරනු ලැබේ.

## විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන

විකිණීමට ඇති මූල්‍ය ආයෝජනයක් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි ඇත්දැයි ව්‍යවසාය විසින් සෑම වාර්තාකරණ දිනයකදීම තක්සේරු කරනු ලැබේ.

ණය උපකරණයක් විකිණීමට ඇති ආයෝජන ලෙස වර්ගීකරණය කර ඇති විටෙක, එකී නිර්ණායකය පදනම් කොට ගෙන මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට ධාරණය කර ඇති හෙයින්, ව්‍යවසාය තනිව එම ණය උපකරණ හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි තිබේදැයි තක්සේරු කරනු ලබයි. කෙසේ වුවද හානිකරණය වශයෙන් වාර්තා කරන ලද මුදල, ආදායම් ප්‍රකාශනයේ කළින් හඳුනාගත් ආයෝජන මත හානිකරණ අලාභය හැර ක්‍රමක්ෂය පිරිවැය හා වර්තමාන සාධාරණ වටිනාකම අතර වෙනසෙහි මිනුම්කරණය කරන ලද සමුච්චිත අලාභය වේ. අනාගත පොළී ආදායමට අඩුකරන ලද ධාරණ වටිනාකම පදනම වන අතර, හානිකරණ අලාභය මිනුම්කරණය සඳහා භාවිතාකරන අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීමට යොදාගත් පොළී අනුපාතය භාවිතයෙන් උපචිත කරනු ලැබේ. පොළී ආදායම "පොළී ආදායමේ" කොටසක් ලෙස වාර්තා කරනු ලැබේ. පසු කාලීන කාලච්ඡේදයකදී ණය උපකරණයක සාධාරණ වටිනාකම වැඩි වන්නේ නම් සහ හානිකරණ අලාභය ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගැනීමෙන් අනතුරුව සිදුවන ණය සිද්ධියට සෘජුවම අදාළ වන්නේ නම්, හානිකරණ අලාභය ආදායම් ප්‍රකාශනය හරහා ප්‍රතිවර්තනය කෙරේ.

### ස්කන්ධ ආයෝජනයක්

විකිණීම සඳහා ඇති ලෙස වර්ගීකරණය කර ඇති විටෙක, ආයෝජනයේ සාධාරණ වටිනාකම එහි පිරිවැයට අඩු බවට "වැදගත්" සහ "දිගු කාලීන" පරිහානියක් ඇති බවට සාධාරණ සාක්ෂි ඇතුලත් වේ. හානිකරණය සඳහා සාක්ෂි ඇති විටෙක, සමුච්චිත අලාභය අත්පත් කර ගැනීමේ පිරිවැය සහ ප්‍රවර්තන සාධාරණ අගයෙහි වෙනස සමුච්චිත අලාභය ලෙස මිනුම්කරණය කෙරේ. එම ආයෝජනයෙහි හානිකරණ අලාභයක් ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගෙන ඇත්නම්, ස්කන්ධයෙන් ඉවත් කර ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. ස්කන්ධ ආයෝජනයන්හි හානිකරණ අලාභයන් ආදායම් ප්‍රකාශනය තුළින් ප්‍රතිවර්තනය නොකෙරෙන අතර, හානිකරණයෙන් පසුව ධාරණ වටිනාකමෙහි වැඩිවීම් ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

### නැවත වර්ගීකරණය (Reclassification)

මණ්ඩලය විසින් ආයතනයේ ගණුදෙනු කිරීම සඳහා රඳවාගත් වත්කම් කළ (Asset held for trading) ආසන්නතම අනාගතයේදී විකිණීමට ඇති හැකියාව පිළිබඳ වලංගුතාවය ඇගයීමකට ලක් කරනු ලබයි. කිසියම් විටෙක මෙම මූල්‍ය වත්කම් අක්‍රීය වෙළඳපොළ තත්වයක් තුළ විකිණීමට නොහැකිවූ තත්වයක් මත කළමනාකරණය විසින් එම වත්කම් ඉදිරි අනාගත කාලයකදී විකිණීමට අපේක්ෂා කලහොත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය වත්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 39 (මූල්‍ය ආයෝජන හඳුනා ගැනීම හා මැන බැලීම) අනුව විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන ලෙස නැවත වර්ගීකරණය කල හැක.

විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් ලෙස නැවත වර්ගීකරණය කර ඇති මූල්‍ය වත්කම් සාධාරන අගයට ගණනය කරන අතර, උපලබ්ධි නොවූ ලාභ ලෙස සෘජුවම ස්කන්ධ මඟින් විකිණීමට ඇති ආයෝජන සංචිත (Avaialbe for Sale Financial Instrument Reserve) ලෙස අනිකුත් විස්තීරණ ආදායම් යටතේ හඳුනාගන්නා අතර, උපලබ්ධි නොවූ අලාභ එම සංචිතයේ එදිනට පැවති ශේෂය නොඉක්මවූ ප්‍රමාණයක් දක්වා එම සංචිතයෙන් මාරු කල හැක. සාධාරන අගය මත ගණනය කිරීම තුලින් පැන නඟින ඉතිරි අලාභ, සාධාරන අගය මත ලාභ අලාභ හරහා නම් කරන ලද මූල්‍ය වත්කම් වල ශුද්ධ ඉපයීම හෝ පාඩුව යටතේ ආදායම් ප්‍රකාශයේ වාර්තා කරනු ලැබේ. ආයෝජන ඉවත්කරන විටකදී ස්කන්ධ වල කලින් හඳුනාගත් සමුච්චිත ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශයේ අනිකුත් මෙහෙයුම් ආදායම් (Other Operating Income) යටතේ හඳුනා ගනු ලැබේ.

### ගිණුම් ඒකාබද්ධ කිරීම (Consolidation of Accounts)

මණ්ඩලය විසින් 1997 වසරේදී මහා භාණ්ඩාගාරය හරහා ලුණු සමාගමේ අයිතියෙන් 90% ක ප්‍රමාණයක් අත්පත්කර ගන්නා ලදි. මව් ආයතනයේ ප්‍රධාන පරමාර්ථය වනුයේ අරමුදල් ආයෝජනය තුලින් ප්‍රාග්ධන ලබා ගැනීම සහ/හෝ ආයෝජන ආදායම් ලබා ගැනීම බැවින් මෙම ආයෝජනය සඳහා ගිණුම් ඒකාබද්ධ කිරීමක් සිදුනොකරයි.

මණ්ඩලය විසින් මෙම ආයෝජනය රඳවා තබා ගැනීමේ මූලික පරමාර්ථය වනුයේ නැවත විකිණීම හෝ පරිනතය තෙක් රඳවා ගැනීමයි.

### 1.8 දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගනු ලැබේ. මිලදී ගැනීමේ පිරිවැය, සෘජුවම ආරෝපනය කළ හැකි පිරිවැය සහ අනාගතයේදී නොවැලැක්විය හැකි ඉවත් කිරීමේ හෝ කොටස් වෙන් කිරීමේ පිරිවැය, පිරිවැයෙහි අන්තර්ගත වේ. අදාළ බැරකම ප්‍රතිපාදන තුළින් හඳුනාගනු ලැබේ.

පළමු තත්ත්වයේ කාර්යක්ෂමතාවයෙන් අනාගත ප්‍රතිලාභ ලැබීමේ අපේක්ෂාවෙන් දේපළ, පිරියත හා උපකරණ නඩත්තුව හෝ අළුත් වැඩියාව සඳහාවූ පිරිවැය එය දරණ අවස්ථාවේදී වියදමක් ලෙස ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

සින්නක්කර ඉඩම් (ආයෝජන දේපළ) හැර, ක්ෂය ප්‍රතිපාදනය හීනවන ශේෂ ක්‍රමය අනුව ගණනය කෙරේ. උපකරණ ක්ෂයවීම් ඒවායේ ප්‍රයෝජනවත් ජීවකාලය තුළ සුන්බුන් වටිනාකම අඩුකළ ධාරණ වටිනාකමට ප්‍රතිපාදනය කෙරේ. වත්කම්වල ඇස්තමේන්තුකළ ප්‍රයෝජනවත් ජීවකාලය පහත දැක්වේ.

| | |
|---|---|
| පරිගණක උපකරණ | 20% |
| අනෙකුත් උපකරණ | 20% |
| ලී බඩු | 15% |
| මෝටර් වාහන | 25% |
| සවිකිරීම් වැද්දුම් | 33.33% |

වත්කම් භාවිතය සඳහා යෙදවූ දිනයේදී ක්ෂයවීම් ආරම්භ වේ.

## 1.9 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

කිසියම් මූල්‍ය නොවන වත්කමක් හානිකරණයට ලක්වීමේ සළකුණු දක්වන්නේදැයි යන්න මණ්ඩලය විසින් එක් එක් වාර්තාකරණ දිනයේදී සමාලෝචනය කරනු ලැබේ. එවැනි සළකුණක් දක්වන්නේ නම් හෝ වත්කමෙහි හානිකරණ පරීක්ෂණයක් අවශ්‍ය වන්නේ නම් හෝ මණ්ඩලය විසින් වත්කමෙහි අයකර ගත හැකි මුදල ඇස්තමේන්තු කරනු ලැබේ.  වත්කමක අයකර ගත හැකි මුදල වන්නේ එම වත්කමෙහි හෝ මුදල් උත්පාදන ඒකකයෙහි විකුණුම් පිරිවැය අඩුකළ සාධාරණ වටිනාකම හෝ භාවිත වටිනාකම යන දෙකෙහි ඉහළ අගයයි. වත්කමෙහි හෝ මුදල් උත්පාදන ඒකකයෙහි ධාරණ වටිනාකම අයකර ගත හැකි මුදල් ප්‍රමාණය ඉක්මවන්නේ නම් වත්කම හානිකරණය වූ ලෙස සළකා අයකර ගත හැකි වටිනාකම දක්වා ලියාහරිනු ලැබේ.

භාවිත වටිනාකම ගණනයේදී ඇස්තමේන්තුකළ අනාගත මුදල් ප්‍රවාහයන් ප්‍රවර්තන වෙළඳපොළ තක්සේරු පිළිඹිබු වන බදු පෙර වට්ටම් අනුපාතය භාවිතයෙන් වට්ටම් කරනු ලැබේ. සාධාරණ වටිනාකමෙන් අඩුකළ විකුණුම් පිරිවැය තීරණය කළ යුත්තේ නිවැරදි ආගණන ආකෘතිය අනුවය. මෙම ආගණනයන්, විවිධ වටිනාකම්, ප්‍රසිද්ධ වෙළඳ සමාගම්වල මිල ප්‍රකාශිත කොටස් හෝ පවත්නා අනෙකුත් සාධාරණ අගය මිණුම් සාධක මගින් තහවුරු කෙරේ.

වත්කම් සඳහා පූර්වයෙන් හඳුනාගන්නා ලද හානිකරණ අලාභයන් තවදුරටත් පවතින්නේ ද නැතහොත් අඩුවී ඇත්ද යන්න පිළිබඳව තක්සේරුවක් සෑම වාර්තාකරණ දිනයකදීම සිදුකරනු ලැබේ. එවැනි සළකුණක් දක්වන්නේ නම්, මණ්ඩලය වත්කමෙහි හෝ මූල්‍ය උත්පාදන ඒකකයෙහි අයකරගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. අවසන් හානිකරණ අලාභය හඳුනාගන්නා ලද අවස්ථාවේදී වත්කමෙහි අයකරගත හැකි වටිනාකම නිර්ණය කිරීමට භාවිතා කරන ලද උපකල්පනයන්හි වෙනසක් පවතින්නේ නම් පමණක්, පූර්වයෙහි හඳුනාගන්නා ලද අලාභය අවලංගු කරනු ලැබේ. වත්කමෙහි අයකරගත හැකි වටිනාකම එහි ධාරණ වටිනාකම නොඉක්මවන්නේ නම් හෝ තීරණය කරන ලද ධාරණ අගය ඉක්මවන්නේ නම් හෝ ක්ෂය අඩුකළ වටිනාකමට පූර්ව වර්ෂයන් සඳහා හානිකරණ අලාභ හඳුනාගෙන නොමැති නම් මෙම අවලංගු කිරීම සීමිත වේ. මෙවැනි අවලංගු කිරීම් ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

## 1.10 ආයෝජන දේපළ

අත්පත් කර ගැනීමේ පිරිවැය ඇතුළු ගත් මිලට ආයෝජන දේපළ මිනුම්කරණය කෙරේ. මුල් හඳුනාගැනීමෙන් අනතුරුව වාර්තාකරණ දිනයේදී වෙළඳපොළ තත්ත්වයන් දක්වන සාධාරණ වටිනාකමට ආයෝජන දේපළ සටහන් කරනු ලැබේ. ආයෝජන දේපළෙහි සාධාරණ වටිනාකම නිසා උද්ගත වන ලාභ හෝ අලාභ ඒවා උද්ගත වූ කාලච්ඡේදයේ ආදායම් ප්‍රකාශනයේ අන්තර්ගත කෙරේ.

මණ්ඩලයේ ආයෝජන දේපළ සෑම වසර 3 කට වරක්ම විවෘත වෙළඳපොළ වටිනාකමට ප්‍රත්‍යගණනය කරනු ලබන අතර, ධාරණ වටිනාකමෙහි සිදුවන වෙනස්කම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

ලැබිය යුතු කුලී කල්බදු කාලච්ඡේදය තුළ සරලමාර්ග පදනම යටතේ බෙදා හරිනු ලැබේ. කුලී නිවැසියාට කුලී රහිත කාලසීමාවක් වැනි දිරිගැන්වීමක් ලබා දෙන්නේ නම් මෙම පදනම යටතේ හඳුනාගනු ලබන කුලී ආදායමක් හේතුවෙන් වාර්තාවන වෙනත් වත්කමක වටිනාකම ආයෝජන වත්කමෙහි ධාරණ වටිනාකමෙන් අඩුකරනු ලැබේ.

## 1.11 අස්පෘෂ්‍ය වත්කම්

### 1.11.1 බාහිරව අත්පත්කරගන්නා ලද අස්පෘෂ්‍ය වත්කම්

වෙන් වෙන්ව අත්පත් කර ගත් අස්පෘෂ්‍ය වත්කම් ආරම්භයේදී හඳුනාගත් පිරිවැයට මිනුම්කරණය කෙරේ. ආරම්භක හඳුනාගැනීමට අනුකූලව අස්පෘෂ්‍ය වත්කම්, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ පිරිවැයට ධාරණය කරනු ලැබේ.

අස්පෘෂ්‍ය වත්කම්වල ප්‍රයෝජනවත් ජීවකාලය නිශ්චිත හෝ අවිනිශ්චිත ලෙස තක්සේරු කරනු ලැබේ.

නිශ්චිත ජීවකාලයක් සහිත අස්පෘෂ්‍ය වත්කම් ඒවායෙහි ප්‍රයෝජනවත් ආර්ථික ජීවකාලය තුළ ක්‍රමක්ෂය කරනු ලබන හානිකරණය සඳහා සමාලෝචනය කෙරේ. කිසියම් සළකුණක් දක්වන්නේ නම් අස්පෘෂ්‍ය වත්කම් හානිකරණය කරනු ලැබේ. එක් එක් වාර්තාකරණ කාලච්ඡේදයක් අවසානයේදී නිශ්චිත ජීවකාලයක් සහිත අස්පෘෂ්‍ය වත්කමෙහි ක්‍රමක්ෂය කාලච්ඡේදය සහ ක්‍රමක්ෂය ක්‍රමය සමාලෝචනය කරනු ලැබේ. අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීවකාලය හෝ වත්කමට අනුබද්ධිත අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජන රටාවේ වෙනස්කම් අදාළ පරිදි ක්‍රමක්ෂය කාලච්ඡේදය හෝ ක්‍රමක්ෂය ක්‍රමය වෙනස් කිරීමෙන්, එම වෙනස්කම් ගිණුම් ඇස්තමේන්තු වෙනස්කම් සේ සළකනු ලැබේ. නිශ්චිත ජීවකාලයක් සහිත අස්පෘෂ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය වියදම ආදායම් ප්‍රකාශනයේ වියදම් වර්ග යටතේ, අස්පෘෂ්‍ය වත්කම්වල ක්‍රියාකාරිත්වය සාපේක්ෂව හඳුනාගනු ලැබේ.

අස්පෘෂ්‍ය වත්කමක් හඳුනා නොගැනීමෙන් උද්ගත වන ලාභ හෝ අලාභ වත්කමෙහි ධාරණ අගය සහ ශුද්ධ උපලබ්ධි ලැබීම් අතර වෙනස සේ මිනුම්කරණය කරනු ලබන අතර, වත්කම හඳුනා නොගැනීමෙන් පසුව ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

#### පරිගණක මෘදුකාංග පැකේජයන්

පරිගණක මෘදුකාංග පැකේජයන් අත්පත් කරගැනීමේ සහ වැඩිදියුණු කිරීමේ වියදම අස්පෘෂ්‍ය වත්කමක් ලෙස හඳුනාගන්නා අතර වසර 03 ක් තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ.

## 1.12 කල්බදු දේපළ

### 1.12.1 මෙහෙයුම් කල්බදු

අයිතියට අදාළ අවදානම සහ ප්‍රතිඵලය අවස්ථානුකූලව මණ්ඩලය වෙත මාරු නොකරන අවස්ථාවන්හිදී (මෙහෙයුම් කල්බදු), ගෙවිය යුතු මුළු කල්බදු කුලී ප්‍රමාණය සරළ මාර්ග ක්‍රමයට කල්බදු කාලය පුරා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට මාරුකරනු ලැබේ.

## 1.13 තොග

යල් පැනගිය සහ සෙමින් චලනය වන අයිතමයන්ට අදාළ දීමනා අඩු කිරීමෙන් පසු පිරිවැයට හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් වඩාත් අඩු අගයට තොග ආගණනය කෙරේ.

## 1.14 විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය

### 1.14.1 නිශ්චිත දායක යෝජනා ක්‍රම

අදාළ ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාර සේවකයිනට, සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වයට සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ දායකත්වයට හිමිකම ලැබේ. මණ්ඩලය විසින් සේවකයන්ගේ දළ පාරිශ්‍රමිකයෙන් 15% ක් සහ 3% ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක වශයෙන් ගෙවනු ලැබේ.

## 1.17 ප්‍රතිපාදන

අවිනිශ්චිත කාල සහ සංඛ්‍යාවන් සහිත බැරකම් සඳහා මණ්ඩලය විසින් ප්‍රතිපාදන හඳුනාගෙන තිබේ. වාර්තාකරණ දිනට බැඳියාව නිරවුල් කිරීම සඳහා අවශ්‍ය වියදම පිළිබඳව හොඳම තක්සේරුව මත ප්‍රතිපාදනය ගිණුම්කරණය කරන අතර, බැරකමට බලපාන වර්තමාන වෙළෙඳපොළ තක්සේරු මුදලේ කාල වටිනාකම සහ විශේෂිත අවදානම් හුවා දැක්වෙන බදු පූර්ව අනුපාතය මත වට්ටමක් ද ලැබේ.

## 1.18 ගිණුම්කරන ඇස්තමේන්තු වල වෙනස්වීම්

උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රතිලාභ සඳහා වාර්ෂිකව දැරිය යුතු පිරිවැය ගණනය කිරීමේදී සමාලෝචිත වර්ෂයේ දැරීමට සිදුවේයැයි අපේක්ෂිත ප්‍රශස්ත පිරිවැය ඇස්තමේන්තු කර ගිණුම්ගත කරයි. එමෙන්ම වාර්ෂිකව අයඳුම්කරනු ලැබේයයි අපේක්ෂිත උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ලාභින් සංඛ්‍යාවේද තත්‍ය අගය ගණනය කරනු ලබනුයේ පසුගිය වර්ෂයේ අයඳුම්කල තත්‍ය ශිෂ්‍යත්ව ලාභින් සංඛ්‍යාව පදනම් කරගෙනය. ඒ අනුව උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රතිලාභ ලෙස පසුගිය වර්ෂයේ මෙන් සමාලෝචිත වර්ෂයේදී දරණ ලද තත්‍ය පිරිවැය පහත පරිදි උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රතිලාභ ගිණුමේ ගැලපීම් කර ඇත.

| **උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව** | | 2015 (Rs.'000) | 2016 (Rs.'000) |
|---|---|---|---|
| 2015 වර්ෂයේ වෙන්කිරීම් | 2011 | (2,424) | - |
| **අඩුකලා:** ගැලපීම් වෙනුවෙන් | 2012 | (576) | 144 |
| | 2013 | (468) | (1,656) |
| | 2014 | (3,840) | (9,744) |
| **ශුද්ධ:** ආදායම් වාර්තාවට අනුව විදයම්වල වෙනස්වීම් | | **52,692** | **48,444** |

**1.19** ගිවිසුමක් කඩකිරීම හේතුවෙන් අධිකරණ නියෝගයක් මත එක්තරා ආයතනයක් වෙත ගෙවන ලද රු 219,000,000 ක මුදලක් අසම්භාව්‍ය ගැලපීම් (Contingent Liability) ගිණුම්වල දක්වා ඇත. එකී නියෝගයට එරෙහිව මණ්ඩලය විසින් අභියාචනයක් ගොනුකර ඇති අතර, ඒ හේතුවෙන් මණ්ඩලය විසින් ගෙවන ලද මුදලට සමාන මුදලක් එම ආයතන විසින් බැඳුම්කරයක අධිකරණයේ තැන්පත් කර ඇත.

## 2. තීරණාත්මක ගිණුම් ඇස්තමේන්තු සහ විනිශ්චයන්

අනාගතය පිළිබඳව මණ්ඩලය ඇතැම් ඇස්තමේන්තු සහ උපකල්පනයන් සකසනු ලැබේ. ඇස්තමේන්තු සහ විනිශ්චයන් ඓතිහාසික පළපුරුද්ද සහ වෙනත් කරුණු පදනම් කොට ගෙන අඛණ්ඩව අගයනු ලබන අතර අවස්ථානුකූලව සාධාරණ යයි විශ්වාස කළ හැකි අනාගත සිද්ධී ද ඇතුළුව අනාගතයේදී සත්‍ය සිදුවීම් මත මෙම ඇස්තමේන්තු සහ උපකල්පනයන් වෙනස් විය හැක. ඉදිරි මූල්‍ය වසර තුළ මෙම ඇස්තමේන්තු සහ උපකල්පනයන්ගේත් වත්කම් සහ බැරකම් වල ධාරණ වටිනාකමේ කළ හැකි ප්‍රමාණාත්මක සහ වැදගත් අවදානම පිළිබඳව පහත සාකච්ඡා කර ඇත.

### ඇස්තමේන්තු සහ උපකල්පනයන්

**(අ) ආයෝජන දේපළ අගයනය**

ව්‍යවසාය එහි ආයෝජන දේපළ බාහිර තක්සේරුකරුවකු ලවා එකී ආයෝජනයේ සාධාරණ වටිනාකම ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. මෙම අගයනය අනාගත කුලී අදායම, පුරෝකථන නඩත්තු පිරිවැය, අනාගත සංවර්ධන පිරිවැය සහ අදාළ වට්ටම් අනුපාත යන උපකල්පනයන් මත පදනම් වේ. මෙම තක්සේරුකරු මේ හා සමාන දේපළ වල ගණුදෙනු වටිනාකම පිළිබඳ වෙළෙඳපොළ සාක්ෂි කෙරෙහිද යොමුවේ.

### (ආ) මූල්‍ය උපකරණ වල සාධාරණ වටිනාකම

මණ්ඩලය වටිනාකම් ඇගයීමේ තාක්ෂණ ක්‍රම යොදාගැනීමෙන් මිල ප්‍රකාශිත නොවූ ආයෝජනයන්ගේ සාධාරණ වටිනාකම තීරණය කරනු ලැබේ. වට්ටම් අනුපාත සහ අනාගත මූල්‍ය ප්‍රවාහයන්ගේ ඇස්තමේන්තු ඇතුළුව භාවිතාකරන ලද උපකල්පනයන් එකී තාක්ෂණ ක්‍රමයන් මත සැළකිය යුතු අන්දමින් ගලපා ඇත. මේ අයුරින් සාදාගන්නා ලද සාධාරණ වටිනාකමේ ඇස්තමේන්තු ස්වාධීන වෙළෙඳපොළ හා සැමවිටම සංසන්දනය කළ නොහැකි අතර බොහෝ අයිතමයන් සඳහා ක්ෂණිකව උපලබ්ධි කිරීමේ හැකියාවක් නැත.

### (ඇ) දේපළ, පිරියත සහ උපකරණයන්ට අදාළ ප්‍රයෝජනවත් ජීවකාලය සහ සුන්බුන් අගය

ඇස්තමේන්තුකළ ප්‍රයෝජනවත් ජීවකාලය සහ සුන්බුන් අගය ගිණුම් ප්‍රතිපත්තිවලට අනුකූලවන්නේද සහ අදාළවන්නේද යන්න ව්‍යවසාය වාර්ෂිකව පරීක්ෂාකරනු ලැබේ.

## 3. මූල්‍ය උපකරණ අවදානම් කළමනාකරණය

### අවදානම් කළමනාකරණ ව්‍යුහය

සියළුම ව්‍යාපාර මෙහෙයුම් ක්ෂේත්‍රයන්හි නීති, රීති, රෙගුලාසි, නිත්‍ය උපදෙස්, සහ අනුමත කළ ප්‍රතිපත්ති අනුකූලව කටයුතු කිරීමට මණ්ඩලයට අනුකූලතා කාර්ය භාරයක් පවතී.

අනෙකුත් සියළු ව්‍යාපාරයන්ට අනුකූලව, මූල්‍ය උපකරණ භාවිතයේදී මතුවන අවදානම මණ්ඩලයට තිබේ. එම අරමුණු, ප්‍රතිපත්ති සහ සැළසුම් සහ එකී අවදානම් කළමනාකරණය කිරීමට සහ ඒවා මිණුම්කරණය කිරීමට භාවිතා කරන ක්‍රම පිළිබඳව මෙම සටහනෙහි විස්තර කෙරේ. මෙම අවදානම පිළිබඳ ප්‍රමාණාත්මක තොරතුරු වැඩිදුරටත් මෙම මූල්‍ය ප්‍රකාශනයන් තුළින් ඉදිරිපත් කෙරේ.

මූල්‍ය උපකරණ අවදානම සම්බන්ධව මණ්ඩලයේ ස්වාධීන වෙනසක් නිරාවරණය නොවන අතර එහි අරමුණු, ප්‍රතිපත්ති සහ එකී අවදානම් කළමනාකරණය හෝ ඒවා මිණුම්කරණයේදී භාවිත ක්‍රම පූර්ව කාලච්ඡේදයන් සඳහා විස්තර සටහන්වල නොදැක්වේ නම් පූර්ව ක්‍රමයන් අනුගමනය කර ඇත.

### 3.1 ණය අවදානම

මණ්ඩලයේ පාරිභෝගිකයන් හෝ සමානයන් ඔවුන්ගේ ගිවිසුම්ගත බැඳීම් ඉටුකිරීමට අසමත් වීම හේතුවෙන් මණ්ඩලයට දැරීමට සිදුවන අලාභය ණය අවදානම ලෙස සැළකේ. පෞද්ගලික පාර්ශවකරුවන් භාරගැනීමට කැමති අවදානම් ණය සීමා නියම කිරීමෙන් සහ එම සීමාවන්ට අදාළ නිරාවරණයන් අධීක්ෂණය මගින් මණ්ඩලය විසින් ණය අවදානම පාලනය සහ කළමනාකරණය කරයි.

## 3.2 හානිකරණ තක්සේරුව

හානිකරණය වූ වත්කම් මත අලාභය හඳුනාගැනීම සඳහා මණ්ඩලය දරණ ලද අලාභ ආකෘතිය මණ්ඩලය විසින් මිණුම්කරණය සඳහා උපයෝගි කර ගනී. එහි අර්ථය වන්නේ නිරීක්ෂණය වූ විශේෂිත අලාභ සිද්ධියකට අදාළව සාධාරණ සාක්ෂි මත හඳුනාගැනීමයි. ඉලක්කගත සිද්ධීන්ට පහත සඳහන් දෑ ඇතුලත් වේ.

- පාරිභෝගිකයාගේ වැදගත් මූල්‍ය අවශ්‍යතා
- ගෙවීම් පැහැර හැරීම් වැනි ගිවිසුම් උල්ලංඝණය කිරීම්
- පාරිභෝගිකයාගේ ගෙවීම් සඳහා වූ මූල්‍ය අපහසුතා මත මණ්ඩලය පාරිභෝගිකයා වෙත සහන සැලසීම
- බොහෝ විට පාරිභෝගිකයා බුන්වත්වීම හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයන්ට පත්වීම.
- ඇස්තමේන්තුකළ ණය මත අනාගත මූල්‍ය ප්‍රවාහයන් අඩුවීමේ දත්ත නිරීක්ෂණය වීම.



# විගණකාධිපති වාර්තාව
# 2015

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT


මගේ අංකය / எனது இல. / My No. } එල්ර්ඩබ/බි/ර්ටිඑෆ්/එෆ්ඒ/2015   ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2016 අගෝස්තු // දින.

සභාපති,

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය.

**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 10 (7) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 10 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 10 (7) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.


අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34   +94-11-2887223   oaggov@sltnet.lk   www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තිරණය කිරීම සඳහා 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 10 (1) වගන්තියෙන් විගණකාධිපති වෙත බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 27 "ඒකාබද්ධ හා වෙන් වූ මූල්‍ය ප්‍රකාශන" ප්‍රකාරව මව් සමාගම විසින් පරිපාලිත සමාගම්වල කරන ලද පාලන හැකියාවක් සහිත ආයෝජනයන් වාර්තා කිරීමට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් පිළියෙල කළ යුතු අතර, එසේ පිළියෙල කළ නොහැකි නම් ඊට හේතු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. මණ්ඩලය 1997 වර්ෂයේ සමාගමක කොටස්වලින් සියයට 90 ක් රු.470,960,938 ක ප්‍රතිෂ්ඨාවකට මිලට ගෙන තිබුණද, ඒ වෙනුවෙන් 2015 දෙසැම්බර් 31 දක්වා ඉහත ප්‍රමිතිය ප්‍රකාරව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කර නොතිබුණි.

(ආ) 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල, උක්ත ආයෝජනය සිදුකර තිබුනේ ප්‍රාග්ධන ලාභ උපයාගැනීමට බව දක්වා ඇතත්, අදාල ආයෝජනයෙන් 1997 වර්ෂයේ සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා ලද ප්‍රාග්ධන ලාභ කිසිවක් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබූ අතර, ආයෝජනයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

### 2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01

(i) ප්‍රමිතියෙහි 60 වන වගන්තිය ප්‍රකාරව, ආයතනයක් එහි වත්කම් හා වගකීම් මූල්‍ය ප්‍රකාශනයේ වාර්තා කිරීමේදී ජංගම හා ජංගම නොවන වත්කම් ලෙස වාර්තා කළ යුතු අතර, ඊට ව්‍යතිරේකව තොරතුරු විශ්වාසවන්තව හා වඩාත් අදාල වන්නේ නම් ද්‍රවශීලතා පදනමට වාර්තා කළ හැකිය. මණ්ඩලය එහි වත්කම් හා වගකීම් ජංගම හා ජංගම නොවන ලෙස වර්ගීකරණයට ව්‍යතිරේකව ද්‍රවශීලතා පදනම මත වාර්තා කර තිබුණද, ඒ බව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ii) ප්‍රමිතියේ 79 (b) වගන්තිය ප්‍රකාරව අස්තිත්වයක් විසින් පවත්වාගෙන යනු ලබන සංචිතවල ස්වාභාවය හා අරමුණු පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවද, මණ්ඩලය පවත්වාගෙන යනු ලබන ප්‍රත්‍යාගණන සංචිතය හා ලාභාංශ සමකිරීමේ සංචිතය ඇති වූ ආකාරය හා අරමුණු පිළිබඳව ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

(iii) ප්‍රමිතියේ 81 වන වගන්තිය ප්‍රකාරව, අස්තිත්වය විසින් සියලු ආදායම් හා වියදම් තනි විස්තීරණ ආදායම් ප්‍රකාශනයක හෝ ප්‍රකාශන දෙකක (ආදායම් ප්‍රකාශනය හා විස්තීරණ ආදායම් ප්‍රකාශනය) වෙන වෙනම හෝ වාර්තා කළ යුතුය. මණ්ඩලයේ විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 ප්‍රකාරව සාධාරණ අගයට හඳුනාගැනීම නිසා ඇතිවූ රු. 871,626,571 ක මිල පහළ යාමේ අවාසිය ප්‍රවර්තන වර්ෂයේ විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ නිරූපණය කර නොතිබුණි .

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08

මෙම ප්‍රමිතියේ 49 වගන්තිය ප්‍රකාරව, ඉකුත් කාලපරිච්ඡේදවල වැරදි නිවැරදි කිරීමේදී, වරදේ ස්වාභාවය, නිවැරදිකරන ප්‍රමාණය, නිවැරදි කිරීම් බලපානු ලබන අයිතමයන් පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවද, මණ්ඩලයේ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සාමාජික අරමුදලට හා රඳවාගත් ලාභයට 2014 වර්ෂයේදී සිදුකර ඇති රු. 1,499,000 ක් හා රු. 59,941,000 සහ 2015 වර්ෂයේ සිදුකර ඇති

රු. 2,815,000 ක් හා රු. 30,073,000 ක පෙර වර්ෂවල ගැලපීම් පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16

2015 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු. 420,288,000 ක් වූ ස්ථාවර වත්කම් තුළ වර්ෂ 25 කට අධික කාලයක සිට ක්ෂය වෙමින් පවතින වත්කම් පැවතියද, එහි සාධාරණ අගය පෙන්නුම් කිරීම සඳහා ප්‍රත්‍යාගණනයක් සිදුකර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37

(i) 2015 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව ආයක මුදල් හා ආයෝජන සහ ආයෝජන ආදායම් අයකර ගැනීමට පනවන ලද නඩු පැවතියද, ඒවායේ ස්වාභාවය, වර්තමාන තත්ත්වය යනාදිය පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

(ii) මණ්ඩලයේ ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ඉහත ප්‍රමිතියට අනුගත නොවන ආකාරයෙන් ගලපා තිබූ රු. 21,900,000 ක් වූ අසම්භාව්‍ය වත්කමක්, සමාලෝචිත වර්ෂයේදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේදී අඩුකර තිබුණද, ඒ සම්බන්ධ ගෙන ඇති නීතිමය පියවර හා ඒවායේ වර්තමාන තත්ත්වය පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39

(i) විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් මූලික හඳුනාගැනීමෙන් පසු සෑම වාර්තාකරන කාල පරිච්ඡේදයක් අවසානයේදීම සාධාරණ අගයට හඳුනාගත යුතුය. සාධාරණ අගය ගණනය කිරීම ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 13 "සාධාරණ අගය මැනීම" හි ප්‍රතිපාදනවලට අනුව සිදුකළ යුතුය. කෙසේ වුවද, මණ්ඩලය සමාගම් 2 ක සාමාන්‍ය කොටස්වල ආයෝජනය කර තිබුණු ආයෝජනයේ වටිනාකම රු.75,299,075 ක් ලෙස පිළිවෙලින් 2014 මාර්තු 31 දිනට හා 2014 සැප්තැම්බර් 30 දිනට පැවති ශුද්ධ වත්කම් වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇතත් අදාල ආයෝජනයේ 2015 දෙසැම්බර් 31 දිනට සාධාරණ අගය වාර්තා කර නොතිබුණි. ඉන් එක් සමාගමක 2015 මාර්තු 31 දිනට ශුද්ධ වත්කම් අගය සැලකූවිට ආයෝජනයේ වටිනාකම, මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකමට වඩා රු. 5,625,300 කින් වැඩිවී තිබුණි.

(ii) මණ්ඩලය විසින් 2000 වර්ෂයට පෙර සිට මිලට ගෙන තිබුණු ඒකක භාර සමාගම් 03 ක සිදුකර ඇති ආයෝජනය, මූල්‍ය ප්‍රකාශනවල වෙළෙඳපොළ මිලෙන් සාධාරණ අගය ලෙස හඳුනාගෙන තිබුණද. එම ආයෝජනය එදිනෙදා අළෙවිකිරීම සඳහා මිලටගත් ආයෝජනයක් නොවන බව මිලට ගත් වර්ෂයේ සිට ගනුදෙනු නොවීමෙන් නිරීක්ෂණය වුවද, එය විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් ලෙස හඳුනාගෙන නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 40

මණ්ඩලය ආයෝජන වත්කම් මූලික හඳුනාගැනීමෙන් පසු ප්‍රත්‍යාගණිත අගයට හඳුනාගනු ලබන අතර. සෑම වසර 03 කට වරක්ම ප්‍රත්‍යාගණනයක් සිදුකළ යුතු බවට ගිණුම් සටහන්වල දක්වා ඇතත්, රු. 3,200,000,000 ක් වටිනා ආයෝජන වත්කම් අවසන් වරට 2011 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කර තිබුණද, 2015 දෙසැම්බර් 31 දින දක්වා ප්‍රත්‍යාගණනයක් සිදු නොකිරීමෙන් එහි දෙසැම්බර් 31 දිනට සාධාරණ වටිනාකම නිරූපණය නොවුණි.

### 2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය 2014 දෙසැම්බර් 31 දිනට ලාභ අලාභ තුළින් සාධාරණ අගයට පවත්වාගෙන ගිය වත්කම්වලින් සියයට 90 වඩා වැඩි ප්‍රමාණයක් 2015 පෙබරවාරි අධ්‍යක්ෂ මණ්ඩලය ගත් තීරණයක් පරිදි "ක්‍රියාකාරී වෙළෙඳපොළක් නොමැති නිසා මණ්ඩලයට ගනුදෙනු කළ නොහැකිය "යන පදනම මත විකිණීම සඳහා ඇති වත්කම් ලෙස නැවත වර්ගීකරණය කරන ලදි. 2014 දෙසැම්බර් 31 දිනට එලෙස නැවත වර්ගීකරණය කළ සහ 2015 වර්ෂයේ දී මිලට ගන්නා ලද කෙටිකාලීනව විකිණීමට අදහස් නොකර පවත්වාගත් කොටස් වලින් ආයතන 16 ක පිරිවැය රු. 2,644,068,045 ක් වන කොටස් 17,987,347 ක් (2014 වර්ෂයේදී නැවත වර්ගීකරණය කර වසරක්වත් ගතවීමටත් පෙර) 2015 වර්ෂයේදී කොටස් වෙළඳපලේ අලෙවිකර තිබූ අතර, එය ගිණුම්කරණ ප්‍රමිතියේ සඳහන් මූල්‍ය වත්කම් හඳුනාගැනීමේ ප්‍රතිපත්තියට අනුකූල නොවන පරිදි කටයුතු කිරීමක් බව නිරීක්ෂණය විය.

(ඈ) 2014 දෙසැම්බර් 31 දිනට ලාභ අලාභ තුළින් සාධාරණ අගයට පැවති කොටස්, විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් ලෙස නැවත වර්ගීකරණයට ප්‍රධාන හේතුව ලෙස දක්වා ඇති "මෙම කොටස් සඳහා ක්‍රියාකාරී වෙළෙඳපොළක් නොමැති නිසා මණ්ඩලයට ගනුදෙනු කළ නොහැකිය" යන හේතුව එම කොටස් කෙටිකාලීනව නැවත කොටස් වෙළෙඳපොළේ අලෙවි කිරීමෙන් තාර්කික හේතුවක් නොවන බවත්, එමගින් කොටස් නැවත වර්ගීකරණය සඳහා වූ පදනම සාධාරණ නොවන බවත් නිරීක්ෂණය විය.

## 2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී අරමුදලේ සාමාජිකයින්ගේ පෞද්ගලික ගිණුම් වලට බැරකළ යුතු රු. 6,013,817,000 ක් වූ පොලී මුදල මෙහෙයුම් වියදමක් ලෙස ගිණුම්ගත නොකිරීම හේතුවෙන්, වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු. 6,013,817,000 කින් වැඩියෙන් දක්වා තිබුණි. පසුගිය වර්ෂය හා ඊට පෙර වර්ෂයේදී එලෙස පොලී මුදල් ගිණුම්ගත නොකිරීම නිසා පිළිවෙලින් රු.5,287,328,000 ක් හා රු. 4,752,333,000 කින් අදාල වර්ෂවල මෙහෙයුම් ලාභය වැඩියෙන් නිරූපණය වී තිබුණි.

(ආ) මණ්ඩලය 2006 වර්ෂයට පෙර දී වැඩිපුර ගෙවූ 2014/2015 තක්සේරු වර්ෂය දක්වා පැවති රු. 121,882,827 ක ලැබිය යුතු ආදායම් බද්ද ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී සැලකිල්ලට ගෙන නොතිබුණි.

(ඇ) මණ්ඩලයේ ස්ථාවර වත්කම් ක්ෂය කිරීමේදී, 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා ක්ෂය වියදම රු. 6,794,794 ක් අඩුවෙන් ගණනය වීම නිසා වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.

## 2.2.5 පැහැදිලි නොකළ වෙනස්කම්

---

මණ්ඩලයේ 2015/2016 තක්සේරු වර්ෂය සඳහා පිළියෙල කරන ලද, මණ්ඩලය විසින් ගණනය කරන ලද බදු බැදියාව සහ ආදායම් ප්‍රකාශනයේ දැක්වෙන බදු වියදම හා

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන ගෙවිය යුතු බදු ශේෂ සම්බන්ධ කිසිදු සැසඳුම් ප්‍රකාශනයක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ හිටපු අතිරේක සාමාන්‍යාධිකාරීවරයෙකුගෙන් අයවිය යුතුව තිබූ රු. 508,789 ක විශේෂ ආපදාණය ශේෂය අයකර ගැනීමෙන් තොරව සේවයෙන් ඉල්ලා අස්වීමට අවසරදී තිබූ අතර, 2015 දෙසැම්බර් 31 දින වනවිට ද සම්පූර්ණ මුදල් අයකරගෙන නොතිබුණි.

(ආ) 1995 වර්ෂයේ සිට අඛණ්ඩව වැඩිවෙමින් පැවතෙන හිමිකම් නොපාන ලද මරණ ප්‍රතිලාභ රු. 9,914,000 ක්, 2001 වර්ෂයේ සිට පැවත එන රඳවාගත් ප්‍රතිලාභ රු. 15,305,000 ක් හා ඉල්ලුම් නොකළ ප්‍රතිලාභ රු. 4,754,000 ක් වශයෙන් එකතුව රු. 29,973,000 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විටත් නිරවුල් නොකර පැවති අතර, 2016 අප්‍රේල් 30 වන විට එයින් රු. 3,692,070 ක් හෙවත් සියයට 12 ක් පමණක් අදාල ප්‍රතිලාභීන්ට නිරවුල් කර තිබුණි.

(ඇ) මණ්ඩලය විසින් සේවාදායක ආයතනවලින් 1981 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අයකරගත් එකතුව රු. 2,368,393,633 ක දායක මුදල් අරමුදල් පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව ඒ ඒ සාමාජිකයින්ගේ පෞද්ගලික ගිණුම් වලට බැර නොකර වෙනත් තාවකාලික ගිණුම්වල රඳවා තැබීමෙන් අදාල සාමාජිකයින්ට තම මුදල් අහිමි වීමේ අවධානමක් පැවතුණි. මෙම මුදල් අප්‍රමාදව සාමාජික ගිණුම්වලට බැරකිරීම සඳහා විශේෂ ඒකකයක් 2016 පෙබරවාරි 10 දින ස්ථාපිත කළද, එමගින් 2016 ජුනි මස 08 වනවිට කොපමණ මුදලක් නිරවුල් කර තිබුණේද යන්න අනාවරණය නොකෙරුණි.

## 2.4 නීතිරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීතිරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනත | පනත ප්‍රකාරව සේවකයින්ට හිමි නිවාඩු සංඛ්‍යාව වාර්ෂික 14 ක් හා අනියම් නිවාඩු 07 ක් වශයෙන් උපරිම දින 21 ක් වුවද, මණ්ඩලය වසරකට නිවාඩු 42 ක් සේවකයින්ට ලබාදී තිබුණි. අතිකාල සඳහා ගෙවීම් කිරීමේදී සාමාන්‍ය පැයක වේතනය මෙන් එකහමාර ගුණයක් ගෙවිය යුතු වුවද, මණ්ඩලය විසින් අතිකාල පැයකට පැය එකහමාරක් සහ දිනක වැටුපක්ද එකතුකර අතිකාල ගෙවීම නිසා මණ්ඩලයේ 2015 වර්ෂයේ අතිකාල පිරිවැය රු. 18.555,000 ක් වී තිබුණි.<br>අතිකාල සඳහා හිමිකම් ලැබීමට නම් සාමාන්‍ය උපරිම කාලය (සතියකට පැය 45 ක්) ට වඩා වැඩියෙන් සේවය කළ යුතු වුවද, සතියකට දින 05 ක සේවය කරන ඊට වැඩි කාලයකට අතිකාල ගෙවා තිබුණි. |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 396 | මණ්ඩලය පවත්වාගෙන යන බැංකු ගිණුමක 2015 දෙසැම්බර් 31 දිනට රු. 245.450 ක් වටිනා නිකුත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් 09 ක් සඳහා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

මණ්ඩලය විසින් සේවකයකුට ලබාදිය හැකි විශේෂ ආපදාණය මුදල කොපමණද යන්න ගණනය කිරීමේදී මූලික වැටුපට අමතරව දීමනාද පදනම් කරගන්නා අතර (එනම් දීමනා සහිත මාස 12 ක වැටුප) ඒ සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත් බවට සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය බදුවලට පසු රු.18,003,901,000 ක ලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 17,072,318,000 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 931,583,000 ක වර්ධනයක් නිරීක්ෂණය විය. පොළී ආදායම රු. 1,006,905,000 ක් වැඩිවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

(ආ) ප්‍රවර්තන වර්ෂයේ හා ඊට පෙර වර්ෂ හතරක කාලය තුළ මණ්ඩලයේ දායකත්වය හා එහි වර්ධනය සැලකීමේදී, දායකත්වය වර්ධනය වී ඇති නමුත් වර්ධන වේගය 2013 න් පසුව පහළ බැස ඇති ප්‍රවණතාවයක් නිරීක්ෂණය විය. ඒ අනුව 2014 වර්ෂයේ වර්ධන වේගය සියයට 8.81 කින්ද, 2015 වර්ෂයේ වර්ධන වේගය සියයට 8.24 කින්ද, පහත බැස තිබුණි. එසේම 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ දායකත්වයේ වැඩිවීම සියයට 50 ට වඩා වැඩි ප්‍රමාණයකින් පහත බැස තිබුණු අතර ඊට ආදායමේ වර්ධන වේගයේ අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

(ඇ) මණ්ඩලයේ සමාලෝචිත වර්ෂයේ මුළු ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 5.3ක වර්ධනයක්ද, සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායමට සාපේක්ෂව සියයට 6.2 ක වර්ධනයක්ද නිරීක්ෂණය විය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂයේ මුළු වියදම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 10.5 ක වර්ධනයක් පැවති අතර මේ අනුව සමස්ත ආදායමේ වර්ධනය මෙන් දෙගුණයකට ආසන්න ප්‍රමාණයකින් සමස්ත වියදම ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩි වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ මෙහෙයුම් ලාභ අනුපාතය 2015 දී සියයට 91.1 ක්ද, 2014 වර්ෂයේදී සියයට 91.7ක්ද, වශයෙන් 2015 වර්ෂයේදී සියයට 0.6 කින් පහත බැස තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අරමුදල මත ප්‍රතිලාභ අනුපාතයද 0.57 කින් පහල ගොස් තිබුණි.

(ආ) මණ්ඩලයේ වර්ෂයේ මුළු ආදායම් වර්ෂයේ ආරම්භක දිනට ඇති අරමුදලේ වටිනාකම සමඟ සැසඳීමේදී 2015 වර්ෂයේ සියයට 10.23 ක්ද, 2014 වර්ෂයේ දී සියයට 10.80 ක්ද, වශයෙන් 2015 වර්ෂයේදී සියයට 0.57කින් පහල ගොස් තිබුණි. එසේම වර්ෂයේ ලද ශුද්ධ දායක මුදල් හා ආරම්භක සාමාජික අරමුදලට සාපේක්ෂව වර්ෂයේ ආදායම් සියයට 9.89 ක පමණ අගයක පැවතුණි.

(ඇ) 2014 ජනවාරි මාසයට සාපේක්ෂව 2015 ජනවාරි මාසය වනවිට මණ්ඩලයේ සාමාජික අරමුදල සියයට 11.2 කින් වර්ධනය වුවද, මණ්ඩලයේ දළ ආදායමේ වර්ධනය සියයට 5.3 ක් වශයෙන් පැවතුණි.

### 3.3 ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

මණ්ඩලය විසින් ආයෝජන පොලී හා ආදායම් ආවරණය කරගැනීම වෙනුවෙන් ආයතන 04 කට, ගෙවූ වන්දි මුදලක් ආවරණය කරගැනීම වෙනුවෙන් එක් ආයතනයකට සහ දායක මුදල් හා අධිභාර අයකර ගැනීම වෙනුවෙන් ආයතන 70 කට එරෙහිව අධිකරණවල නඩු ගොනුකර තිබුණි.

### 3.4 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

මණ්ඩලය විසින් වාණිජ බැංකුවක පවත්වාගෙන යන මුදල් වෙළඳපොළ ගනුදෙනු ගිණුම්වල 2015 දෙසැම්බර් 31 දිනට රු. 1,850,333 ක් හා රු. 1,938,238 ක මුදල් ශේෂ සාමාන්‍ය ඉතිරි කිරීමේ ගිණුමක තැබීමෙන් ඒ සඳහා සාමාන්‍ය පොළී ආදායම් පමණක් ලැබී තිබුණු අතර, වෙනත් ඉහළ ආදායම් ලැබීමේ අවස්ථා අහිමි වී තිබුණි.

අංශයක් ස්ථාපිත කර. ක්‍රියාකාරී සැළැස්ම තුළ උපායමාර්ග දක්වා තිබුණද. 2015 වර්ෂයේ අවසන් වන විට ඊට දැක්වූ අවධානය අවම මට්ටමක පැවතුණි.

(ඇ) 2014 වර්ෂයේ ලැබුණු ශුද්ධ දායක මුදලට සාපේක්ෂව 2015 වර්ෂයේ ලැබුණු ශුද්ධ දායක මුදල සියයට 230.8 කින් වැඩි වී ඇති අතර. එහිදී දායකත්ව ලැබීම්වල සියයට 14 ක වර්ධනයක් හා දායකත්වය ගෙවීම්වල සිදුවූ සියයට 17 ක පහළ යෑමක් ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි. කෙසේ වුවද, 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේ ලද ශුද්ධ දායක මුදල සියයට 58.7 කින් අඩු වී ඇති අතර ඒ සඳහා එම වර්ෂයේ දී දායකත්ව ලැබීම්වල සිදුවූ සියයට 10 ක වර්ධනයට වඩා දායකත්ව ගෙවීම්වල සිදුවූ සියයට 44.7 ක වර්ධනය බලපා තිබුණි.

(ඇ) 2015 වර්ෂයේදි අරමුදලේ සාමාජිකයන්ට ප්‍රකාශකළ අනිවාර්ය පොලිය සියයට 3 හා සියයට 6 ක ලාභාංශ ප්‍රතිශතය සමඟ මුළු ප්‍රතිලාභය 2014 වර්ෂයට සාපේක්ෂව සියයට 10 සිට සියයට 9 දක්වා සියයට 1 කින් හෙවත් රු. 2.004.605.667 කින් අඩුකර ප්‍රකාශ කර තිබුණි. එසේම මෙම මුළු ප්‍රතිලාභය ප්‍රකාශ කිරීම සඳහා ප්‍රවර්තන වර්ෂයේ උපයන ලද ලාභ ප්‍රමාණවත් නොවීමෙන්, පසුගිය වර්ෂයේ ලාභයෙන් රු. 7.477.000 ක් භාවිතා කිරීමට සිදුව තිබුණි.

(ඉ) මණ්ඩලය විසින් එහි සාමාජිකයන් වෙනුවෙන් සුභසාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රම 10ක් පමණ ක්‍රියාත්මක කරන අතර, ඉන් බැංකු සමාගමක් හරහා ලබාදෙන නිවාසණය යෝජනා ක්‍රමය හැර ඉතිරි ප්‍රතිලාභ වෙනුවෙන් 2015 වර්ෂයේදි දරා ඇති ප්‍රතිලාභවල වටිනාකම රු. 373.882.000 ක් වූ අතර, එම ප්‍රමාණය එම වර්ෂයේ අයවැයගත ප්‍රතිලාභ වටිනාකමින් සියයට 85 ක් පමණ විය.

(ඊ) මණ්ඩලය ව්‍යවසායන්හි අත්කරගත් සාමාන්‍ය කොටස් ආයෝජන කළඹවල 2015 දෙසැම්බර් 31 දිනට සාධාරණ අගය රු. 9.921.955.118 ක් වූ අතර, එම කොටස් ආයෝජනයේ වටිනාකම 2016 මාර්තු 31 දින වන විට රු. 1.510.446.765 කින් හෙවත් සියයට 15 කින් පහත වැටී තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) (i) 2011 වර්ෂයට පෙර වර්ෂ සඳහා අදාල වන හිමිකම් නොපෑ උසස් පෙළ සමතුන්ට ගෙවියයුතු ශිෂ්‍යත්ව මුදල් රු. 2,258,000 ක් 2015 දෙසැම්බර් 31 දින වන විටත් නොගෙවා මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම් යටතේ පෙන්වා තිබුණි. 2012, 2013 හා 2014 වර්ෂ වල උසස්පෙළ හා 5 වසර ශිෂ්‍යත්වය සමත් 7,323 දෙනෙකු වෙනුවෙන් ගෙවිය යුතු රු. 109,626,000 ක් 2016 මාර්තු 31 දින වන විටත් ගෙවා නොතිබුණි. 2015 ජූනි 08 වන විට එයින් රු. 876,000 ක් උසස් පෙළ සමත් සිසුන් වෙනුවෙන් ගෙවීම් කර තිබුණි.

(ii) උසස් පෙළ සමත් සිසුන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේදී විභාගය සාමාන්‍ය සාමාර්ථයක් සහිතව හෝ සමත්වීම ශිෂ්‍යත්වයක් ලැබීමට ප්‍රමාණවත් වුවද, 2011-2014 වර්ෂවල ශිෂ්‍යත්ව ප්‍රදානයට මණ්ඩලය පුරෝකථනය කළ සංඛ්‍යාවෙන් අඩක්වත් අයදුම්පත් ලැබී නොතිබීමෙන් මෙය සාමාජිකයින් අතර එතරම් ජනප්‍රිය නොවන බව පෙනී ගියද, සාමාජිකයින් දැනුවත් කිරීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනට විශේෂ ආපදාණය මුදල් ලෙස රු. 169,824,000 ක් සේවකයන්ට ලබාදී තිබුණු අතර, ඒ සඳහා ඇපකරුවන් ලෙස අත්සන් කරනු ලබන නිලධාරීන්ට ණය ප්‍රදානය කිරීමේදී, ඔවුන් කලින් ඇපකරුවන් ලෙස අත්සන් කරන ලද ණය මුදල්වල වටිනාකම් සැළකිල්ලට නොගෙන ණය ලබාදීම සිදුකරන බව නිරීක්ෂණය විය. එසේම විශේෂ ආපදාණය ලබාදීමේදී, ඇපකරුගේ වේතනයෙන් සියයට 60 සීමාව තුළ ණය වාරිකය අඩු කළ හැකිද, යන්න ගණනය කිරීමේදී, ණයකරුගේ මාසික වාරිකයක වටිනාකමින් සියයට 50 කට අදාල ප්‍රමාණය පමණක් සලකා බැලීම හේතුවෙන් එක් ඇපකරුවකු ණය ගෙවීමට නොහැකි තත්ත්වයට පත් වූවහොත් ණය අයකර ගැනීම අවදානමකට ලක්වන බව නිරීක්ෂණය විය.

## 4.3 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලයට 2015 වර්ෂය සඳහා ප්‍රසාද දීමනා ගෙවීමේදී 2015 දෙසැම්බර් 09 දිනැති කළමනාකරණ චක්‍රලේඛ අංක 02/2015 ට අනුව රු. 15,000 ක් පමණක් ගෙවිය යුතු වුවද, මණ්ඩලය විසින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2015 දෙසැම්බර් 17 දිනැති අංක පීඊ/අයිඑන්/ටීවීඑෆ්/ජීඊඑන්/2015 දරන ලිපිය මගින් 2015 වර්ෂයේ ප්‍රසාද දීමනා ලෙස මාස දෙකක වැටුප ගෙවීමට විශේෂ අනුමැතිය ලබා ඇති අතර, එහි "වැටුප" ලෙස අර්ථ දක්වා ඇත්තේ මූලික වැටුපද, සියලු දීමනා සහිත වැටුපද, යන්න පිළිබඳව පැහැදිලි නොවුණි. කෙසේවුවද, මණ්ඩලය මාස දෙකක සියලු දීමනා සහිත දළ වැටුප මත පදනම්ව 2015 වර්ෂයට සේවකයින්ට රු. 84,253,000 ක ප්‍රසාද දීමනා ගෙවා තිබුණි.

(ආ) 2013 වර්ෂයේ සිටම ගිවිසුම් පරිදි නියමිත දිනට මාසික බදු මුදල් ගෙවීම පැහැර හැර ඇති බාහිර ආයතනයකට ලබාදී තිබූ මණ්ඩලයට අයත් කොළඹ නවම් මාවතේ පිහිටි ඉඩමට 2015 ජනවාරි සිට ජූනි දක්වා වූ කාලපරිච්ඡේදයට හිඟව පැවති රු. 7,421,720 ක බදු කුලී ආදායම අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සිදුව් තිබුණි.

(ඇ) මණ්ඩලයේ දිරිදීමනා ක්‍රමය තුළ පැමිණීම වෙනුවෙන් සේවකයින්ට මසකට උපරිම රු.2,500 ක දිරිගැන්වීමේ දීමනාවක් ගෙවූවද, ඊට අතිරේකව නිවාඩු ලබා නොගැනීම මත 2015 වර්ෂයේදී රු. 12,299,000 ක් ඉතිරිකරගත් නිවාඩු වෙනුවෙන් ගෙවා තිබුණි.

## 4.4 ආර්ථික නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පෞද්ගලික සමාගමක සාමාන්‍ය කොටස්වලින් සියයට 90 ක ආයෝජනය කර ඇති රු.470,960,937 වෙනුවෙන් 2015 වර්ෂයේදී කිසිදු ලාභාංශ ආදායමක් අරමුදලට ලැබී නොමැති අතර, 2014 වර්ෂය සඳහා රු. 7,875,000 ක ලාභාංශයක් ලැබී තිබුණි. එය ආයෝජිත මුදලට සාපේක්ෂව සියයට 1.67 ක් වැනි ඉතාමත් අඩු ප්‍රතිලාභයක් වූ අතර

මෙම මුදල් අවදානම් රහිත දින 364 කින් කල්පිරෙන රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කළේ නම් අවම වශයෙන් වර්ෂයකට සියයට 6 ක් එනම් රු. 28,257,656 කට වඩා වැඩි ප්‍රතිලාභයක් ඉපයීමට හැකියාව තිබුණි.2013 වර්ෂයේදී මෙම සමාගම රු. 67,444,037 ක අලාභයක් ලබා තිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් ලෙස නැවත වර්ගීකරණය කළ කොටස්වල සාමාන්‍ය පිරිවැය රු. 336,114,586 ක් වන සමාගම් 12 කින් 2015 වර්ෂයට කිසිදු ලාභාංශ ආදායමක් ලැබී නොමැති අතර, ඉන් කොටස්වල සාමාන්‍ය පිරිවැය රු. 50,346,605 ක් වූ සමාගම් 03 ක කොටස් වෙළෙඳපොළ මිල 2014 දෙසැම්බර් 31 දිනට සාපේක්ෂව 2015 දෙසැම්බර් 31 දිනට සියයට 32 ක්, 18 ක් හා 37 ක් ලෙස පහත වැටී තිබුණි.

## 4.5 හඳුනාගන්නා ලද පාඩු

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් වැව්ලි සමාගමක ණයකරවල ආයෝජනය වෙනුවෙන් 2006 වර්ෂය දක්වා ලැබිය යුතු රු. 12,291,566 ක පොළී ආදායම් අයනොවී පැවතුණි.

(ආ) මණ්ඩලයේ සංචාරක නිවාසවලින් 2015 හා 2014 වර්ෂවල ලැබූ ශුද්ධ අලාභය පිළිවෙලින් රු.2,938,000ක් හා රු. 1,188,000 ක් විය.

(ඇ) මණ්ඩලය ඒකක භාර අරමුදල් තුනක සිදුකර ඇති ආයෝජනයේ 2014 දෙසැම්බර් 31 දිනට රු. 356,426,847 ක් වූ වෙළෙඳපොළ වටිනාකම 2015 දෙසැම්බර් 31 දිනට රු.21,696,000 කින් පහත වැටීම නිසා එම ප්‍රමාණයෙන් අලාභයක් සිදුවී තිබුණි. ඉන් එක් ඒකක භාර අරමුදලක්, වර්ධන අරමුදලක් බැවින් 2015 වර්ෂයේ දී ඒකකවල අගය වර්ධනය නොවීම මත ආයෝජිත මුදලට කිසිදු ආදායමක් ලැබී නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---

### 5.1 සංයුක්ත හා ක්‍රියාකාරී සැළැස්ම

---

ක්‍රියාකාරි සැළැස්ම අනුව තොරතුරු තාක්ෂණ අංශය මගින් ඉලක්ක කල වර්තමානයේ පවතින සාමාජික ගිණුම් කළමනාකරණ පද්ධතිය හා අනෙකුත් මෘදුකාංග පද්ධති පිළිබඳව අධ්‍යයනය කර නව මෘදුකාංග පද්ධතියක් සංවර්ධනය කිරීම. සාමාජිකයන්ට තම සාමාජික මුදල් ශේෂය අන්තර්ජාලය තුළින් හෝ ජංගම දුරකථනය හරහා පරික්ෂා කිරීමට පහසුකම් සැලැස්වීම හා ආපදා වළක්වා ගැනීමේ සැළැසුම ක්‍රියාත්මක කිරීම යන කාර්යයන් ඉටුකර නොතිබුණි. පරිපාලන හා මානව සම්පත් සැළැස්මෙහි සේවක ඵලදායිතාවය වැඩිදියුණු කිරීම යටතේ ඇති පහත සඳහන් උපායමාර්ග ළඟාකර ගැනීමට 2015 දෙසැම්බර් 31 වන විට නොහැකිව් තිබුණි.

(i) පවතින ශ්‍රම බලකාය හා ඔවුන්ගේ හැකියාවන් අධ්‍යයනය. පවරන ලද වැඩ ප්‍රමාණය අධ්‍යයනය ශ්‍රම බලකාය හා සැසඳීම. ප්‍රශස්ත මට්ටමකින් ශ්‍රම බලකාය පවත්වා ගැනීමට අවශ්‍ය උපායමාර්ග හඳුනා ගැනීම.

(ii) පවතින කාර්යසාධන ඇගයීම පද්ධතියේ අඩුපාඩු නිවැරදි කර නව කාර්යසාධන ඇගයීම පද්ධතියක් හඳුන්වා දීම හා එය සංයුක්ත අරමුණු හා බද්ධ කිරීම.

### 5.2 අභ්‍යන්තර විගණනය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ ක්‍රියාකාරී සැළැස්ම අනුව අභ්‍යන්තර විගණන අංශය විසින් මණ්ඩලයේ මාසික ගිණුම් පිළිබඳව මාසිකවද, වාර්ෂික ගිණුම, අයවැය, වාර්ෂික වාර්තාව, සංයුක්ත සැළැස්ම පිළිබඳ වාර්ෂිකවද, සභාපතිවරයා විසින් පවරන ලද විමර්ශනයන් ද කළ යුතු වුවත්, ඒ සම්බන්ධව කටයුතු සිදුව් නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 133 (2) ප්‍රකාරව අභ්‍යන්තර විගණනය මගින් මණ්ඩලයේ ප්‍රධානම ව්‍යාපාරික කාර්ය වන අරමුදල් ආයෝජනය හා ඒ මත ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව අවධානය යොමුකර නොතිබුණි.

(ඈ) මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශයේ සෘජුව විගණන කටයුතු හා සම්බන්ධ වන කාර්ය මණ්ඩලය 24 ක් වූ අතර ඉන් විගණනය හා සම්බන්ධ සුදුසුකම්ලත් නිලධාරීන් සංඛ්‍යාව තිදෙනෙකුට සීමාවිය. මේ අනුව 2015 දෙසැම්බර් 31 වන විට රු. 221,941,132,000 ක ශුද්ධ වත්කම් පවතින ආයතනයක අභ්‍යන්තර විගණන අංශයේ සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලය එහි විෂය පථය අනුව ප්‍රමාණවත් නොවුණි.

## 5.3 අයවැය ලේඛනමය පාලනය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේ වියදම් සැලකිමේදී අයවැයට සාපේක්ෂව, වියදම් අයිතම 09 ක සියයට 20 ත් සියයට 50 ත් අතර විචලනයන් නිරීක්ෂණය වූ අතර, වැටුප් පිරිවැය, පොලී පිරිවැය, ගොඩනැගිලි කුලී හා ප්‍රසාද දීමනා පිළිවෙලින් සියයට 32, සියයට 27, සියයට 26 හා සියයට 22 බැගින් අයවැයගත ප්‍රමාණයට වඩා වැඩිවී තිබුණි. මණ්ඩලය සාමාජිකයින් අරමුණු කරගත් අයවැයගත මුළු වියදම්වලට සාපේක්ෂව සත්‍ය වියදම් සියයට 17 කින් අඩුවී තිබුණි.

(ආ) මණ්ඩලයේ ස්ථාවර තැන්පත් පොලී ආදායම හා ආයෝජන කළමනාකරණ ගිණුම් පොලිය (Custodial Account) පිළිවෙලින් සියයට 52 ක හා 50 වන සේ අයවැයගත ප්‍රමාණයට වඩා අඩුවී තිබුණි. ඊට අමතරව ආදායම් ශීර්ෂ අතර සියයට 20 - 49 ත් අතර විචලනයන් පැවති අවස්ථා 08 ක් නිරීක්ෂණය වූ අතර. එහිදී වියන නිවාස ණය පොලිය, භාණ්ඩාගාර බිල්පත් පොලිය හා දේපළ ආදායම (ලීසිංකුලී) පිළිවෙලින් සියයට 25, 30 හා 36 වශයෙන් අයවැයගත ප්‍රමාණයට වඩා අඩුවී තිබුණි. අයවැයගත සංඛ්‍යා හා සත්‍ය දත්ත අතර සැළකිය යුතු විචලනයක් පැවතිමෙන් අයවැය කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගි කරගෙන නොතිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමුකළ අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) | සාමාජික ගිණුම්වලට මුදල් බැර කිරීම | අරමුදල විසින් සේවාදායකයින්ගෙන් එකතුකරන මුදල් පනත ප්‍රකාරව අප්‍රමාදීව සාමාජිකයින්ගේ ගිණුම්වලට බැර කර නොතිබුණි. |
| (ආ) | අයවැය පාලනය | මණ්ඩලයේ අයවැයගත ආදායම් හා වියදම් සහ සත්‍ය ආදායම් හා වියදම් අතර සැළකිය යුතු විචලනයක් පවතින බැවින් අයවැයට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | අභ්‍යන්තර විගණනය | මණ්ඩලයේ අරමුදල් ආයෝජනවල ලාභදායිත්වය ඇගයීම හා අභ්‍යන්තර විගණනයට සුදුසුකම්ලත් ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් යෙදවීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි |

එච්.එම්. ගාමිණී විජේසිංහ,
විගණකාධිපති



# විගණකාධිපති වාර්තාව 2015

## සම්බන්ධයෙන් මණ්ඩලයේ පැහැදිලි කිරීම්

# විගණකාධිපති වාර්තාව - 2015 සම්බන්ධයෙන් පැහැදිලි කිරීම්

## 2 මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කල මතය

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

(අ) මණ්ඩලයේ ප්‍රධාන ව්‍යාපාරික කටයුත්ත වනුයේ අවදානම් රහිත හා අවදානම් සහිත ආයෝජන උපකරණ (Investment Instruments) වල ආයෝජනය කිරීමයි. ඒ අනුව, 1997 වර්ෂයේදී රු.470,960,938 ක මුදලක් ලංකා ලුණු සමාගමේ ආයෝජනය කරන ලදී. මෙම ආයෝජනයේ ප්‍රධාන අරමුණ වූයේ ප්‍රාග්ධන ලාභ ලබා ගැනීම හෝ ලාභාංශ ලබාගැනීම හෝ මේ දෙආකාරයෙන්ම ප්‍රතිලාභ ලබා ගැනීමයි. එබැවින් මෙම ආයෝජනය එහි ස්වභාවය අනුව විකිණීම සඳහා පැවති ආයෝජන ලෙස (AFS ) වර්ගීකරණය කර ගිණුම් ප්‍රකාශන වල හෙලිදරව් කරන ලදී. එබැවින්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 27 ප්‍රකාරව මෙකී ආයෝජන සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් පිළියෙල කිරීමේ අවශ්‍යතාවය පැන නොනැගුනි.

(ආ) එසේ ප්‍රාග්ධන ලාභ ලබා ගැනීමට අවස්ථාවක් මේ දක්වා නොලැබී ගියද, සෑම වසරකම ලාභාංශ ආදායම් ලැබී ඇත. කෙසේ වෙතත් 2016 වසරේ සිට මෙම ආයෝජනයේ වටිනාකම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති හා ශ්‍රී ලංකා ගිණුම් වාර්තා කිරීමේ ප්‍රමිතීන්ට අනුකූලව විකිණීම සඳහා පැවති ආයෝජන වලට සිදුකල යුතු ගණනය කිරීම් සහිතව මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීමට පියවර ගනිමු.

#### 2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

(අ)

i. මණ්ඩලයේ වත්කම් වලින් 94% ක පමණ ප්‍රමාණයක් සමන්විත වනුයේ ආයෝජන උපකරණ (Instrument) වලින් වන අතර, වගකීම් වලින් 99% ක්ම නියෝජනය වනුයේ සාමාජික මුදල් (Member Fund) වන බැවින්, එකී වත්කම් හා වගකීම් ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති වලට අනුකූලව ජංගම හා ජංගම නොවන ලෙස වර්ගීකරණයක් කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනඟියි. එසේ වුවත්, ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති අංක 1, 60 වගන්තියට ව්‍යතිරේඛීයව ද්‍රවශීලතාවය පදනම් කරගෙන ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීමට සිදුවූ ඉහත හේතුව 2016 වසරේ මූල්‍ය වාර්තාවල හෙලිදරව් කිරීමට පියවර ගනු ඇත.

ii. මූල්‍ය ප්‍රකාශන වල ප්‍රත්‍යාගණන සංචිතය ලෙස දක්වා ඇති රු.3,155,730,470 අගය මණ්ඩලය සතු නවම් මාවතෙහි පිහිටි ඉඩමේ මිලදී ගත් අගය හා 2011 වර්ෂයේදී රජයේ තක්සේරුකරු විසින් ප්‍රත්‍යාගණනය කරන ලද වෙළඳපොල වටිනාකම වැඩිවීමේ අගයයි.

**ලාභාංශ තුලන සංචිතයේ 2015.12.31 දිනට සඳහන් රු.142,000,000 අගය පහත ආකාරයෙන් ගොඩනැඟී ඇත.**

| | | රු. ශත |
|---|---|---|
| 2010 වර්ෂයේදී ඉපයූ ලාභයෙන් ලාභාංශ තුලන සංචිතයට මාරුකල මුදල | … | 4,000,000,000 |
| 2011 වර්ෂයේදී ලාභාංශ ගෙවීම සඳහා යොදගත් මුදල | … | (1,000,000,000) |
| 2012 වර්ෂයේදී ලාභාංශ ගෙවීම සඳහා යොදගත් මුදල | … | (2,000,000,000) |
| 2013 වර්ෂයේදී ලාභාංශ ගෙවීම සඳහා යොදගත් මුදල | ... | ( 343,000,000) |
| 2014 වර්ෂයේදී ලාභාංශ ගෙවීම් සඳහා යොදගත් මුදල | … | ( 515,000,000) |
| **2015.12.31 දිනට අගය** | … | **142,000,000** |

ඉහත සඳහන් සංචිත වල ස්වභාවය 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ.

iii. අපගේ මූල්‍ය ප්‍රකාශන වලට අනුව විකිණීමට ඇති මූල්‍ය වත්කම් (Financial Assets Avaialable for Sale) වලින් උපලබ්ධි වූ කොටස් ආයෝජන වලට අදාලව සංචිතයේ ඇතුලත් රු 475,069,000 ක් සාධාරණ අගයට මූල්‍ය වත්කම් වල ලාභ අලාභ යටතේ උපලබ්ධි වූ ලාභයක් ලෙසට ප්‍රවර්ථන වර්ෂයේ ආදායම් ප්‍රකාශයේ ඇතුලත් කර ඇත. විමසුමේ දක්වා ඇති පරිදි රු871,626,580 ලෙස දක්වා ඇති මුදල කොටස් විකිණීමෙන් සිදුවූ අලාභයක් නොවන අතර, එය කොටස් වල පිරිවැය සහ 2015/12/31 ට පැවති වෙළඳපොල මිල සැසඳීමේ ඇතිවූ හීනවූ අගය (Depreciation) වන අතර, මෙම විචලනය ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයේ (Statement of Changes in Equity) විකිණීමට ඇති වත්කම් සංචිතයෙන් අඩුකර පෙන්වා ඇත.

(ආ) මෙම ගැලපුම් ආයතනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලට අදාල වූ ඒවා බැවින් එවැනි හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයක් ඇති නොවුනි.

(ඇ). මණ්ඩලයේ ස්ථාවර වත්කම් ලෙස දක්වා ඇත්තේ එදිනෙදා භාවිතයට ගන්නා ගෘහස්ථ උපකරණ, පරිගණක යන්ත්‍ර හා වාහන වේ. මෙම ස්ථාවර වත්කම්ද ප්‍රත්‍යාගණය කිරීමකින් පසු ප්‍රවර්ථන අගයන්ට ගිණුම්වල ගැලපීම් කිරීම සඳහා අවශ්‍ය ප්‍රත්‍යාගණනයන් සිදුකිරීම රජයේ තක්සේරුකරුට දන්වා ඇති අතර, මේ දක්වා එකී කටයුතු සම්පූර්ණ කර නොමැත. රජයේ තක්සේරුකරු විසින් වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමකින් පසු ක්ෂය ප්‍රතිපත්තිය සංශෝධනය කර වර්තමාන මිල ගණන් අනුව ස්ථාවර වත්කම් ගිණුම් ප්‍රකාශන වලට ඇතුලත් කිරීමට බලාපොරොත්තු වේ.

(ඈ)

I. ආයෝජන සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක වැදගත් කමක් ඇති සමර්විල් නඩුවේ ස්වභාවය ගිණුම් ප්‍රකාශණවල හෙළිදරව් කර ඇති අතර, දායක මුදල් අයකර ගැනීමට සම්බන්ධ නඩු, මණ්ඩලයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වල සාමාන්‍ය ව්‍යාපාරික ගණුදෙනුවලට සම්බන්ධව වන බැවින් සහ එවැනි නඩු විශාල සංඛ්‍යාවක් ඇති බැවින්, ඒවා සම්බන්ධව සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ විධිවිධාන අනුව කටයුතු කරනු ලැබේ.

ii. මෙම සී/ස සමරවිල් ඇන්ඩ් කොම්පැනි ලිමිටඩ් විසින් මණ්ඩලය සමඟ ඇති කරගත් කළමනාකරණ ගිවිසුම කඩකිරීමක් සම්බන්ධයෙන් එම සමාගම විසින් මණ්ඩලයට එරෙහිව පවරන ලද අංක 56 (98) 1 දරණ නඩුව සම්බන්ධවයි.

මෙම නඩුව සම්බන්ධයෙන් මණ්ඩලයද කරුණු ඉදිරිපත් කළ නමුත් අධිකරණය සමර්විල් ආයතනය වෙත රුපියල් මිලියන 21.9 ක් ගෙවීමට නියෝග කරන ලදි. ඒ අනුව, රුපියල් මිලයන 21.9 ක් ඉහත සමර්විල් ආයතනයට ගෙවන ලදි.

නමුත්, මණ්ඩලය විසින් එම නියෝගයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියාචනයක් ලැයිස්තුගත කර ඇති අතර, එහි නියෝග අනුව ඉහත කී සමාගම විසින් රුපියල් මිලියන 21.9 ක බැංකු ඇපකරයක් අධිකරණයේ තැන්පත් කර ඇත.

මණ්ඩලය විසින් ගොනු කරන ලද ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු අංක SC/20/2003 දරණ නඩුව 2017/02/22 දින නැවත විභාගයට ගැනීමට නියමිතය.

## (ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39

I. එකඟ වේ. අපගේ ගිණුම් ප්‍රකාශන වල මෙම වරද නිවැරදි කරන ලද ගැලපුම් මඟින් එම ආයෝජන වල අගය රු60,425,468.80 කින් වැඩිවූ අතර, ෆස්ට් කැපිටල් සමාගමේ කොටස් වල සාධාරන අගය 2014.12.31 වර්ෂයේ ගිණුම් මත පදනම්ව ගැලපූ හෙයින්, එම ආයෝජනයේ අගය රු5,625,900 ක් අඩුවෙන් ගිණුම් ගත කර ඇත. 2016 වර්ෂයේදි මෙම ගණනය කිරීම් නිවැරදිව සිදුකොට එම ආයෝජන වල සාධාරණ අගය ගිණුම් ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට පියවර ගනු ලැබේ.

ii. මෙම ආයෝජන වෙළඳපොලේ ඕනෑම අවස්ථාවක විකිණිය හැකි ලැයිස්තුගත ආයෝජන බැවින් වෙළඳපොළ මිලෙන් සාධාරන අගය ලෙස හඳුනාගත් ආයෝජන යටතේ වර්ගීකරණය කර ඇත.

(ඊ) මණ්ඩලය සතු නවම් මාවතෙහි පිහිටි ඉඩම නැවත ප්‍රත්‍යාගණනයක් කිරීම සඳහා 2015 වසරේදී රජයේ තක්සේරුකරු වෙත දන්වා ඇත. එසේ වුවද, මෙතෙක් එම වාර්තාව නොලැබීම හේතුවෙන් වර්තමාන සාධාරන වටිනාකම මූල්‍ය ප්‍රකාශවල පෙන්නුම් කිරීමට නොහැකිවී තිබේ.

## 2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

(අ) 2014 වසරේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයක් අනුව ආයතනයේ ලැයිස්තුගත කොටස් ආයෝජන කළඹ නැවත වර්ගීකරණයක් (Re-classification) කරන ලදි. ඒ අනුව, කෙටිකාලීනව නැවත විකිණීමේ පරමාර්ථයෙන් (Trading Portfolio) ලෙස 30% ක්ද, දිගුකාලීන ආයෝජන කළඹ (Long term portfolio) යටතේ 70% ක ප්‍රමාණයක්ද බෙදා වෙන්කිරීමට තීරණය කරන ලදි. ගිණුම් ප්‍රකාශවල ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති ප්‍රකාරව ආයෝජන කළඹ ගණුදෙනු කිරීම සඳහා පවත්වා ගන්නා වත්කම් (Held for Trading) හා විකිණීම සඳහා ඇති වත්කම් (AFS) ලෙස වර්ගීකරණය කර තිබුනද, කොටස් වෙළඳපොලට ආවේනික අනපේක්ෂිත මිල ඉහළයාම් වලදී මණ්ඩලයට වාසිසහගත ලෙස ලාභයක් ලබා ගැනීමේ අවස්ථාවක් පැන නැගුනහොත් එකී කොටස් මූල්‍ය ප්‍රකාශන වල කර තිබෙන වර්ගීකරණය නොසලකා ආයෝජන උපක්‍රමයක් ලෙස (Investment Stratergy) විකුණා ලාභ ලබාගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව ආයෝජන වර්ගීකරණ හා මූල්‍ය ප්‍රකාශනවලට ඉදිරිපත් කිරීම, එකී ආයෝජන විකිණීම හා එමගින් ලාභ ලබාගැනීමට බාධාවක් නොවේ. මණ්ඩලයේ අරමුදල් ආයෝජනයේ ප්‍රමුඛ අරමුණ ආයෝජන සඳහා ප්‍රශස්ථ ලාභයක් ලබාගැනීම බැවින් එවැනි ලාභදායක අවස්ථාවලදී මණ්ඩලය ඒ සම්බන්ධයෙන් කටයුතු කරනු ලබයි.

(ආ) 2013 මාර්තු මස 21 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කල අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවේ (පිටපතක් ඇමුණුම් අංක 01) මුළු කොටස් වෙළඳපොල ආයෝජනයෙන් විකිණීම සඳහා පැවති ආයෝජන (AFS) වශයෙන් වර්ගීකරණය කරන ලද කොටස් සඳහා හේතු වශයෙන් එක් එක් ආයතනයේ පරිපාලන ව්‍යුහය, ආයතනයේ අපේක්ෂිත කාර්ය සාධනයන්, ලාභාංශ ප්‍රතිපත්ති සහ ආයතනයට ඔවුන් නියැලෙන කර්මාන්තයේ ප්‍රසාරණය වීමට ඇති හැකියාව ආදි කරුණු සැලකිල්ලට ගෙන ඇත.

එබැවින්, 2014 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂයේදී මණ්ඩලයේ කොටස් වෙළඳපොල ආයෝජනයෙන් 70% ක පමණ ප්‍රමාණයක් නැවත වර්ගීකරණය කිරීමට හේතුව ''ක්‍රියාකාරි වෙළඳපොලක් නැත'' යන ඔබගේ නිරීක්ෂණය හා එකඟ විය නොහැක.

## 2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

(අ) 2015 වසර සඳහා සාමාජිකයන්ගේ ගිණුමට බැර කරන ලද රු6,013,817,000 ක මුදල පෙර වර්ෂ වලදී මෙන් විසර්ජනය කිරීමට ඇති ලාභයෙන් අඩුකර පෙන්වා ඇත. කෙසේ වුවද, මෙම ගැලපීම තුළින් ආයතනයේ සමස්ථ මූල්‍ය ප්‍රතිඵලයට බලපෑමක් නොවන අතර, ඉදිරියේදී මේ පිළිබඳව අධ්‍යනය කර අවශ්‍ය ගැලපීම් කිරීමට බලාපොරොත්තු වේ.

(ආ) බදු ගණනය කිරීමේ පත්‍රිකාවෙහි (Tax Computation) දක්වා ඇති රු121,882,827 ක අගය 2006 වර්ෂයට පෙර ගෙවන ලද භාණ්ඩාගාර බැදුම්කර වලට අදාලව ගෙවන ලද ගැලපීමක් වන අතර, එකී උපලබ්ධි නොවූ ප්‍රතිලැබීම් (Refund) සෑම වර්ෂයේ වර්තමාන බදු බැඳියාවට සමාන ප්‍රමාණයක් අඩුකරගෙන යනු ලබයි. ඒ ආකාරයෙන් මෙකී අගය ඉදිරි වර්ෂ වලදී බදු වගකීමට එරෙහිව කපා හැරීමට බලාපොරොත්තු වේ.

(ඇ) ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරීම සඳහා පවත්වාගෙන යන පරිගණක පැකේජයට දත්ත ඇතුලත් කිරීමේදී සිදුවී ඇති වෙනස්කම් නිසා මෙකී ඌන ක්ෂය ප්‍රතිපාදනය සිදුවී ඇත. ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන ක්‍රියාවලිය නිමවූ පසුව දැනට එම පැකේජයේ පවතින

ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන ක්‍රියාවලිය නිමවූ පසුව දැනට එම පැකේජයේ පවතින තාක්ෂණික ගැටළු නිරාකරණය කරගෙන නිවැරදි ලෙස ක්ෂය ගණනය කිරීමට කටයුතු කරනු ඇත.

## 2.2.5 පැහැදිලි නොකළ වෙනස්කම්

දැනට විස්තරාත්මක බදු ගණනය කිරීමේ ප්‍රකාශය (Tax Computation) මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කර ඇති අතර විගණන විමසුමේ සඳහන් පරිදි බදු ශේෂ සැසඳුම් ප්‍රකාශයක් (Tax Resconciliation) 2016 වසරේ සිට ඉදිරිපත් කිරීමට පියවර ගනිමි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) හිටපු අතිරේක සාමාන්‍යාධිකාරිවරයා සේවයට වාර්තා නොකොට අස්වී ඇත. ඔහුගෙන් මණ්ඩලයට අයවිය යුතු ණය මුදල් වල ශේෂය වන රු.508,789 ක වන මුදලින් කොටසක් ගෙවා මේ වනවිට රු.425,812 ක ශේෂය පමණක් අයවීමට ඇත. එයද ගෙවන ලෙසට දන්වා ඇති අතර, එසේ නොවුවහොත් එකී ණය මුදල් වල ශේෂය ඇපකරුවන්ගෙන් අයකරගනු ලැබේ.

(ආ) හිමිකම් නොපාන මරණ ප්‍රතිලාභ ගිණුමේ 2015.12.31 දිනට පැවති රු.9,914,376.85 (ප්‍රතිලාභ අයදුම්කරුවන් 836) ක් වූ ශේෂයක් පවතී. සාමාජිකයින්ගේ මරණයෙන් පසු එකී සාමාජිකයාගේ ප්‍රතිලාභ සඳහා එක් අයෙකුට වඩා හිමිකම් ලාභින් සිටින බවට තීරණය වන අවස්ථා පවතී. එකී හිමිකම් ලාභින් සියලු දෙනාම එකවිට ඉදිරිපත් නොවීම සහ ඇතැම් අය ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසාද දීර්ඝ කාලීනව විසඳී නොමැති බූදල් නඩුද මෙම තත්වය ඇතිවීමට හේතුවී තිබේ. එම නිසා ඔවුන්ගේ කොටස් මණ්ඩල ගිණුමේ රඳවා ලේඛණ ඉදිරිපත් කර ඇති කොටස් හිමියන්ට පමණක් ගෙවීම් කිරීමට කටයුතු කරනු ඇත. 2016 ජනවාරි සිට 2016.06.30 දක්වා මරණ ප්‍රතිලාභ හිමිකරුවන් විසින් ඉදිරිපත් කර ඇති කරුණු සලකා බලා රු 171,817.88 ක මුදලක් හිමිකරුවන් 05 දෙනෙකු වෙත ගෙවා ඇති අතර, 2016/06/30 දිනට හිමිකරුවන්ට ගෙවීමට ඇති වගකීමේ වටිනාකම රු.9,742,558.97 ක් වනු ඇත. (මරණ ප්‍රතිලාභ අයදුම්පත් 831)

ඒ අනුව ඉදිරියේදී ද අදාල හිමිකරුවන් තම නීත්‍යානුකූල හිමිකම ඉදිරිපත් කරන ආකාරයට මෙම මුදල් ඔවුන් වෙත ගෙවීම සිදුකරනු ලැබේ.

ආපසු එවන ලද ප්‍රතිලාභ ගිණුමේ 2015.12.31 දිනට ශේෂය රු.15,304,642.94 කි. (ප්‍රතිලාභීන් 1233) මෙම ගිණුමින් පිළිඹිබු වනුයේ සාමාජිකයින්ට හිමි ප්‍රතිලාභ මුදල් ඉල්ලුම් කර කෙලින්ම බැංකුවට යැවීමේදී බැංකුවෙන් ප්‍රතිලාභ ඉල්ලුම්කරුගේ බැංකු ගිණුම් විස්තර වල දෝෂ සහිත නිසා නැවත හරවා එවා ඇති මුදල් වල වටිනාකමයි. ප්‍රතිලාභ හිමිකරුවන්ට නැවත මේ බව දැනුම්දීමට කටයුතු කරනු ඇත. මෙම මුදල් පසුව ප්‍රතිලාභ හිමිකරුවන් ඉල්ලුම් කිරීමේදී පරීක්ෂා කර බලා නැවත ගෙවීම් කරනු ලබයි.

ඒ අනුව, 2016 ජනවාරි සිට 2016.06.30 දින දක්වා ප්‍රතිලාභ හිමිකරුවන් විසින් ඉල්ලුම් කර රු 2,889,777.69 ක මුදල් ප්‍රතිලාභ හිමිකරුවන් 91 ක් වෙත ගෙවා ඇති අතර, 2016.06.30 දිනට ගෙවීමට ඇති වගකීමේ වටිනාකම රු.12,414,865.25 ක් වනු ඇත. (ප්‍රතිලාභීන් 1142)

ජංගම සේවා මගින් සහ ප්‍රාදේශීය කාර්යාල හරහා ප්‍රතිලාභ ඉල්ලුම්කරුවන් දැනුවත් කිරීමට පියවර ගෙන අදල සාමාජිකයින්ට එම මුදල් ගෙවීම් කිරීමට කටයුතු කරමින් පවතී.

ආපසු එවන ලද ප්‍රතිලාභ (Return Benefit slip) ගිණුමේ 2015.12.31 දිනට ශේෂය රු.4,753,869.45 කි. (ප්‍රතිලාභීන් 965) අන්තර් බැංකු ගෙවීම් ක්‍රමය (slip system) නොමැති බැංකු ගිණුම් තිබෙන ප්‍රතිලාභ අයදුම්කරුවන්ට අදල මුදල් චෙක්පත් මඟින් ප්‍රතිලාභ අයදුම් පත්‍රයේ සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් යවනු ලැබේ.

එම චෙක්පත් වලින් නැවත ආපසු ලැබෙන චෙක්පත් ලියාපදිංචි තැපැල් මගින් අදල බැංකු වෙත යොමුකරනු ලැබේ. එලෙස යවන ලද නමුත්, ඉල්ලුම්කරුවන්ගේ බැංකු ගිණුම්වලට බැර නොවී ඇති චෙක්පත් වල වටිනාකම ඉහත ගිණුමෙන් පෙන්නුම් කෙරේ.

රු83,946.96 ක මුදලක් ප්‍රතිලාභ හිමිකරුවන් 7 ක් වෙත ගෙවා ඇති අතර, 2016.06.30 දිනට ගෙවීමට ඇති වගකීමේ වටිනාකම රු4,669,922.49 ක් වනු ඇති. (ප්‍රතිලාභීන් 958)

ජංගම සේවා මගින් සහ ප්‍රාදේශිය කාර්යාල හරහා ප්‍රතිලාභ ඉල්ලුම්කරුවන් දැනුවත්කිරීමට පියවර ගෙන අදාල සාමාජිකයින්ට එම මුදල් ගෙවීම් කිරීමට කටයුතු කරමින් පවතී.

### (ඇ) සාමාජික ගිණුම් වලට බැර නොවූ දායක මුදල්

1981 සිට 2014.12.31 දක්වා සාමාජික මුදල් වශයෙන් ලැබී 2016.05.02 දිනට සාමාජික ගිණුම්වලට බැරකර නොතිබුණු වටිනාකම රු2,368,393,636 ක් වූ අතර 2016.08.31 දිනවනවිට රු 271,142,523 ගිණුම් වලට බැර කර ඇති අතර, එදිනට සාමාජික ගිණුම් වලට බැර කිරීමට ඇති වටිනාකම රුපියල් මිලියන 2,097,251,113 කි.

2016.02.10 දින සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමේ විශේෂ ඒකකය ස්ථාපනය කර සේවායෝජක ගිණුම්වල ඇති එහෙත් මෙතෙක් සාමාජික ගිණුම් වලට බැර කර නොමැති මුදල් සාමාජික ගිණුම් වලට බැර කිරීමේ කටයුතු සිදුකෙරෙමින් පවතී.

## 2.4 නීතිරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූලනොවීම

### සාප්පු හා කාර්යාල සේවක පනත

### 1954 අංක 19 දරණ සාප්පු හා කාර්යාල සේවක පනත

මණ්ඩලයේ සේවකයින්ට වාර්ෂිකව නිවාඩු 42 ක ප්‍රමාණය කලක සිට ලබාදී ඇති අතර, එය කර්මාන්තයේ පරිචය අනුව සිදුකර තිබේ. එම නිවාඩු ප්‍රමාණය වාර්ෂිකව නිවාඩු 21 ක් දක්වා අඩු කිරීමට යාමේදී සේවකයින් විසින් දීර්ඝ කාලයක සිට භුක්ති විදි වරප්‍රසාදයක් අහිමිවන බැවින් එය කාර්මික සාමයට බාධාවක් විය හැකිය.

අතිකාල ගෙවීම් සිදුකරනු ලබන්නේ සාප්පු හා කාර්යාල සේවක පනතෙහි විධි විධාන අනුව වේ.

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 396

අංක 1650001111 දරණ මහජන බැංකු ගිණුමට අදාල බැංකු සැසඳුම් ප්‍රකාශනයේ 2015.12.31 දිනට පෙන්වූ රු245,450.21 ක වටිනාකමින් චෙක්පත් 07කට අදාල රු224,836.78 ක මුදල සාමාජිකයින්ගේ බැංකු ගිණුම් විස්තර සොයාගෙන ඉදිරියේදි නිරවුල් කිරීම සඳහා 2016/මැයි මස ඉල්ලුම් නොකළ ප්‍රතිලාභ ගිණුමට මාරුකරන ලදි.

ඉතිරි රු20,613.43 ක මුදලට අදාල විස්තර පරිගණක අංශයෙන් ලබාගෙන අදාල ගැලපුම් සටහන් කිරීමට කටයුතු කරනු ඇත.

## 2.5 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

මේ සඳහා 1994.05.27 දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අනුමැතිය ලබා ගෙන ඇති අතර, එහිදී සියළු දීමනා සහිත මාසික වැටුප ණය මුදල ගණනය කිරීමේ දී සැළකිල්ලට ගනු ලබන බව දන්වා ඇත. සේවක ණය යෝජනා ක්‍රමය සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය පසුව ලබාගෙන ඇත.

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

(අ) එකඟ වේ.

(ආ) එකඟ වේ. 2015 වර්ෂයේ කොටස් වෙළඳපොල ආයෝජන වලින් 13% ක පමණ ආදායමක් උපයා ගැනීමට හැකි වුවද, ස්ථාවර ආදයම් සහිත සුරැකුම්පත් වලින් ලද පොළී ප්‍රතිශත අඩුවූ හෙයින් මෙවැනි තත්වයක් ඇතිවිය. මණ්ඩලය වියදම් සම්බන්ධයෙන් ස්ථිර ප්‍රතිපත්තියක් අනුගමනය කරන අතර, ඉදිරි වර්ෂ වලදී ස්ථාවර ආදයම් සහිත සුරැකුම් පත් වල පොලී අනුපාත වැඩිවීමේ වාසියෙන් මෙකී තත්වය මඟහැරී යයි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී වියදම් වැඩිවීමට ප්‍රධාන හේතුව වූයේ රජය මඟින් යෝජනා කරන ලද රාජ්‍ය වැටුප් වැඩිකිරීමට අනුකූලව මණ්ඩලය විසින් සේවකයින් සඳහා ගෙවන ලද රු10,000 ක වැටුප් වැඩිකිරීම සහ සාමාජික ප්‍රතිලාභ යටතේ හෘද සැත්කම් සඳහා ගෙවන ප්‍රතිලාභය රු150,000 සිට රු300,000 දක්වා වැඩි කිරීම නිසා ඇතිවූ අමතර වියදම් වල ඉහළ යාමයි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) එකඟ වේ

(ආ) එකඟ වේ

(ඇ) සාමාජික අරමුදල මේ ආකාරයෙන් වර්ධනය වුවද, මුළු අයෝජන වලින් 90% ක් පමණ වන රජයේ සුරැකුම්පත් වල පොළී ප්‍රතිශත පහළ යෑම හේතුවෙන් මෙවැනි තත්වයක් ඇති විය.

## 3.3 ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

එකඟ වේ. සමහර අවස්ථා වලදී ගිවිසුම්ගත ආකාරයට පටහැනිව ආයෝජන මුදල හා පොළී ආදයම් ගෙවීම, දයක මුදල් හා අධිභාර ගෙවීම පැහැර හැරීම වැනි අවස්ථා වලදී එම මුදල් අයකර ගැනීමට වෙනත් විකල්පයක් නොමැති බැවින් නඩු දැමීමට සිදුවේ.

## 3.4 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

කොමර්ෂල් බැංකුවේ ගිණුම් අංක 2220509201 හා 222050202 ගිණුම් වල තිබූ අතිරික්ත මුදල් මහජන බැංකුවේ නාරාහේන්පිට ශාඛාවේ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් ගිණුම් අංක 11910014369329 ගිණුමට 2016 මැයි මසදී මාරුකිරීමට කටයුතු කරන ලදි.

# 4 මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්ය සාධනය

(අ) සටහන් කර ගතිමි

(ආ) ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොලෙහි 62% ක් පමණ අසංවිධිත අංශය නියෝජනය කරන අතර, ඔවුන් වැඩිදෙනා ගෘහස්ථ, සුළු හා මධ්‍යම ප්‍රමාණයෙන් ව්‍යාපාර ලෙස පවත්වාගෙන යනු ලබන ආයතන වේ. ලෝක කම්කරු සංවිධානයේ තාක්ෂණික ආධාර සහ අප අමාත්‍යාංශයේ ආධාර යටතේ නව සේවායෝජක ආයතන පරීක්ෂා කිරීමෙන් සාමාජිකයින් විශාල ලෙස බඳවා ගැනීමේ විධිමත් ක්‍රියාවලියක් ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.

ස්වයං රැකියා හා සංක්‍රමණික සේවා අංශයේ ප්‍රවර්ධනය වෙනුවෙන් ඊට සම්බන්ධවන රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයන්හි ආයතන සමඟ සම්බන්ධීකරණ වැඩ සටහන් තුලින් විශාල ලෙස ස්වයංරැකියා හා සංක්‍රමණික සේවා සාමාජිකයන් බඳවා ගැනීමට දැනටමත් කටයුතු කර ඇත.

(ඇ) 2013 වසරේ සිට 2015 වසර දක්වා දායක මුදල් ලැබීම් වල අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කරන අතර, 2014 වසරේදී දායක මුදල් ගෙවීම් වල වර්ධනයක් ඇතිවූ බැවින් මෙම විචලනය සිදුවී ඇති අතර මේ සම්බන්ධයෙන් ඔබගේ නිරීක්ෂණ සමඟ එකඟ වේ.

(ඈ) කිසියම් වර්ෂයකදී නියමිත ප්‍රතිලාභ ගෙවීම සඳහා එම වර්ෂයේ ලාභ ප්‍රමාණවත් නොවූ විටෙක

ඉදිරියට ගෙනා ලාභ සංචිත උපයෝගී කර ගත හැක. එම නිසා එම ආකාරයෙන් මෙම ගැලපුම සිදුකර ඇත.

(ඉ) විගණන වාර්තාවේ සඳහන් කරුණු සමඟ එකඟ වේ.

(ඊ) 2015 වසරේ සිට කොටස් වෙළඳපොල තුල දිගින් දිගටම පැවති අයහපත් වෙළඳපොල තත්වය මත කොටස් ආයෝජනයේ වටිනාකම මේ ආකාරයෙන් පහත වැටීනි. කොටස් වෙළඳපොළ තත්වය යහපත්වූ විට මෙම තත්වය මඟහැරී යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) i. 2015.12.31 දින හිමිකම් නොපෑ 5 වසර ශිෂ්‍යත්ව ගිණුමේ ශේෂය රු2,258,385 කි. 2016 ජනවාරි සිට 2016.08.30 වන දින දක්වා ශිෂ්‍යත්ව ලාභීන් හඳුනාගෙන රු48,598.49 ක් ගෙවා ඇති අතර, 2016.08.30 දිනට ගෙවීමට ඇති වගකීමේ වටිනාකම රු2,209,786.51 ක් වනු ඇත. ශිෂ්‍යත්ව ලාභීන් දැනුවත් කිරීමට පියවර ගෙන ඉදිරියේදී මෙම මුදල් ගෙවීම් කිරීමට කටයුතු කෙරෙමින් පවතී.

ii. සියලුම ප්‍රතිලාභ පිළිබඳව සේවායෝජකයින් සහ සාමාජිකයින් දැනුවත් කිරීමේ කටයුතු සිදුකලද 5 වසර ශිෂ්‍යත්ව සහ උසස් පෙළ මුලයාධාර සඳහා අපගේ ඉලක්කගත ප්‍රමාණයට අයදුම්පත් නොලැබෙනු ඇත. එයට හේතුව වනුයේ 5 වසර ශිෂ්‍යත්ව සහ උසස් පෙළ මුලයාධාර සඳහා සියලුම සාමාජිකයින්ගේ දූදරුවන් අවශ්‍ය සුදුසුකම් නොලබන හෙයින්, සංඛ්‍යාව අඩුවීමට හේතුවිය හැක.

(ආ) විශේෂ ආපදා ණය මුදල් ලබාදීමේදී ඇපකරුවන් වශයෙන් අත්සන් කරනු ලබන ණය මුදල්වල වටිනාකම සැලකිල්ලට ගනු නොලැබේ. ණය මුදල නිදහස් කරන අවස්ථාවේදී ණයකරු ඇපකරුවන් දෙදෙනා සමඟ එළඹෙන ගිවිසුමේ ඇපකරුවන් එක්ව හා වෙන් වෙන්ව වගකීමට බැඳී ඇති බැවින්, එක් ඇපකරුවකුගෙන් ණය අයකර ගැනීමට නොහැකි තත්වයට පත්වුවහොත් එම ඇපකරුගේ ප්‍රමාණයද අනෙක් ඇපකරුගෙන් අයකර ගැනීමට හැකියාව නීතිමය වශයෙන් ඇති නිසා ණය අයකර ගැනීමේදී අවධානමකට ලක් නොවේ.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

(අ) "වැටුප" යන්න ආයතන සංග්‍රහයේ විස්තර කර ඇත්තේ ඒකාබද්ධ වැටුප යන්නයි. ඒකාබද්ධ වැටුප යනු සියලු දීමනා සහිත වැටුප බැවින් එම අර්ථ නිරූපනය අනුව 2015 වර්ෂයේ ප්‍රසාද දීමනාව සඳහා අදාල කරගෙන ඇත්තේ මාස 2 ක ඒකාබද්ධ වැටුප වේ. එසේම මණ්ඩලයේ සේවකයින්ට පසුගිය සෑම වසරකම ප්‍රසාද දීමනා ගෙවා ඇත්තේ එම පදනමෙහි පිහිටාය.

(ආ) බදු මුදල් නොගෙවීමට බලපෑ ප්‍රායෝගික හේතු ඉදිරිපත් කරමින් හිඟ බදු මුදල් ගෙවන බවට ලිඛිතව ඉල්ලා සිටී බැවින් එය සැලකිල්ලට ගෙන හිඟ බදුමුදල් ගෙවීමට අවස්ථාව ලබාදී ඇත. නමුත් හිඟ බදුමුදල් ගෙවන විට වර්තමාන මාසවල බදු මුදල් හිඟව පවතී. එම හේතුව මත 2015 ජුලි මාසයේදී බදු ගිවිසුම නතර කොට දේපලෙහි භුක්තිය මණ්ඩලය වෙත ලබාගෙන ඇත. හිඟ බදු මුදල් ගැනීමට නෛතිකව කටයුතු කර ඇත.

(ඇ) සාප්පු හා කාර්යාල සේවක පනත අනුව හිමිවන වාර්ෂික නිවාඩු මණ්ඩලයේ රාජකාරි කටයුතු හේතුවෙන් ලබා ගැනීමට නොහැකිව ඉතිරිවන අවස්ථාවල එම වාර්ෂික නිවාඩු සඳහා පනත අනුව සේවකයාට මුදල් ලබා ගැනීමට හිමිකමක් ඇති බැවින් පසුගිය සෑම වසරකම සිට ඉතිරිවූ වාර්ෂික නිවාඩු සඳහා ගෙවීම් සිදුකොට ඇත.

මාසික දිරිදීමනා යෝජනා ක්‍රමයේ "පැමිණීම" යන නිර්නායකය සඳහා වෙන්කොට ඇති රු2,500 ක් වටිනාකම මාසිකව නිවාඩු 5 ක් ඉක්මවූ විට එය අහිමි වේ. දිරිදීමනා යෝජනා ක්‍රමය කාර්ය සාධනය දියුණු කිරීමට හඳුන්වාදී ඇති අභිප්‍රේරණ ක්‍රමයකි.

## 4.4 ආර්ථික නොවූ ගණුදෙනු

(අ) වසර 1997 දී ලංකා ලුණු සමාගමේ අයිතියෙන් 90% ක ප්‍රමාණයක් ලබා ගැනීම සඳහා රු මිලියන 470 ක මුදලක් මහා භාණ්ඩාගාරය වෙත ගෙවා ඇති අතර, එහි 10% ක කොටස් අයිතිය එහි සේවකයන්ට ලබාදී ඇත.

ආරම්භයේ සිට මෙම සමාගම විසින් මේ දක්වා රු මිලියන 123 ක පමණ ලාභාංශ මණ්ඩලය වෙත ගෙවා ඇත. ආයතනයේ ශුද්ධ වත්කම් ප්‍රමාණය 2014 අවසන් වනවිට රු මිලියන 612 ක් දක්වා වර්ධනයවී ඇති අතර, එය ආයෝජිත මුදල වන රු මිලියන 470 ට වඩා රු මිලියන 142 ක වැඩි වීමකි.

(ආ) සමාගම් 13 කින් 2015 වර්ෂය සඳහා ලාභාංශ ලැබී නොමැති ලෙස සඳහන් කලද, ඉන් වැලිබල් වන් සමාගමෙන් 2015 වර්ෂය සඳහා රු.861,070 ක මුදලක් ලාභාංශ ලෙස ලැබී ඇත.

සමාගම් 4 ක කොටස් වෙළඳපොල මිල 10% සිට 37% ක් අතර ප්‍රමාණයකින් පහත වැටී ඇති බව සඳහන් කළද, කොටස් වෙළඳපොල රටේ ආර්ථික තත්වය, බදු ප්‍රතිපත්තිය, දේශපාලන ප්‍රතිපත්ති, විදේශ සංචිත, විදේශ විනිමය ප්‍රතිපත්ති, ජනතාවගේ ක්‍රය ශක්තිය ආදී සාධක වලට සංවේදිව නිතර මිල උච්චාවචනයන්ට ලක්වේ. එසේ වුවද, ඉහත සමාගම් කොටස් වල මිල ඉහළ යන අවස්ථාවල විකුණා ඉහළ ප්‍රාග්ධන ලාභ ලබාගැනීම අපගේ අපේක්ෂාව වේ.

## 4.5 හඳුනාගත් පාඩු

(අ) අමාත්‍ය මණ්ඩල තීරණයක් මත 1994 දී රුපියල් මිලියන 15ක් වටිනා ණයකර ඇල්කඩුව සමාගමේ ආයෝජනය කෙරුණි. එම රුපියල් මිලියන 15ක ණයකර සඳහා ලැබිය යුතු පොළී මුදල ලෙස රු.12,291.556.16 සඳහන් වේ.

මෙම හිඟමුදල සම්බන්ධයෙන් අදාල පාර්ශවයන් සමඟ සාකච්ඡා කල අතර, රුපියල් ලක්ෂ 5 බැගින් මාසිකව ගෙවා නිදහස් කරන බවට පොරොන්දු විය. ඒ අනුව 2011 නොවැම්බර් මස තෙක් වාරික 11ක් ගෙවා ඉතිරිය හිඟව පවතී. එමෙන්ම 2014.08.04 දින දරණ ලිපිය මගින් අප මණ්ඩලය විසින් මෙම මුදල අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ගයන් ගනු ලබන බව සමාගම වෙත දැනුම්දීමක් කර ඇත. එම නීතිමය ක්‍රියාමාර්ගය සම්බන්ධ තීරණය 2015.06.16 දින දරණ ලිපිය මගින් මහා භාණ්ඩාගාරය වෙත ද යොමුකර ඇති අතර, 2015.07.07 දින ඇල්කඩුව වැවිලි සමාගම විසින් නැවතත් ඔවුන්ගේ මූල්‍ය දුෂ්කරතාව සහ මේ සම්බන්ධයෙන් වැවිලි කර්මාන්ත අමාත්‍යංශයේ ලේකම් සමඟ කටයුතු කරන බව දන්වා එවා ඇත.

ඇල්කඩුව සමාගම වෙතින් අයකර ගැනීමට ඇති මෙම පොළී ආදායම සම්බන්ධයෙන් 2015.11.17 දින දරණ ලිපියක් මගින් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යංශයේ ලේකම් වෙත මණ්ඩලය විසින් ලිපියක් යොමුකර ඇත. එහි පිටපතක් මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ද යොමුකර ඇත. අපගේ ලිපියට පිළිතුරු ලෙස ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් ඇල්කඩුව වැවිලි සමාගමේ සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂකවරයාට මෙම මුදල් ගෙවන ආකාරය ඉල්ලා ලිපියක් යවා ඇති අතර, අප මණ්ඩලයට එහි පිටපතක් එවා ඇත. සමාගමේ මූල්‍ය දුෂ්කරතාවය මේ වනතුරුත් පවතින බව 2016.08.10 දින දරණ ලිපියෙන් දැනුම් දී ඇත.

(ආ) මෙවැනි සංචාරක නිකේතනයක් ගොඩනැඟිමේ ප්‍රධාන අරමුණ වූයේ සේවක සුභසාධනයයි. එම නිසා සහනදායී මිලකට මණ්ඩලයේ සේවකයින්ට මෙය ලබාදෙනු ලැබේ. ඊට අමතරව පිටස්තර පාර්ශවයන්ටද නියමිත මිලකට මෙය ලබාදෙනු ලැබේ. එමනිසා මෙම සංචාරක නිවාසය ලාභ ලැබීමේ පරමාර්ථයෙන් පවත්වාගෙන යන්නක් නොවන බවට සඳහන් කරමි .

(ඇ) 2015 වසරේදී වෙළඳපොල තුල පැවති අවාසිදායක තත්වය මත මෙම ඒකක භාර වල මිල ගණන් මෙසේ පහළ යෑමක් සිදුවිය. කෙසේ වුවද, මෙම වෙළඳපොල තත්වය යහපත්වූ විට මෙම ඒකකභාර විකුණා ලාභ ලැබීමට බලාපොරොත්තු වේ.

(ඈ) ඈවරකරණයට ලක්ව ඇති සමාගම් දෙක සම්බන්ධයෙන් මේ දක්වා අවසන් තීන්දුවකට එළඹ නැති බැවින් ආයෝජනයන්ගේ නැවත අයකර ගැනීමේ හැකියාව පිළිබඳව නිශ්චිත

තහවුරුවක් කල නොහැකිය.

(ඉ) වණික් ඉන්කෝපරේෂන් ආයතනයේ පොරොන්දු නෝට්ටුවල ආයෝජිත වටිනාකම රු.12,174,382.19 කී.

එය පහත සඳහන් පරිදි සැකසී ඇත .

- රුපියල් මිලියන 15 ක් වටිනා ණයකර පොළී වෙනුවෙන් නිකුත් කල පොරොන්දු නෝට්ටුවල ඉතිරි නොගෙවූ මුදල — රු.11,262,382.19
- 1997.12.10 දින නිකුත් කරන ලද ණයකර සඳහා 2001 වසරට අදාල පොලිය වෙනුවෙන් නිකුත් කල පොරොන්දු නෝට්ටුවල අගය — රු. 912,000.00

**පොරොන්දු නෝට්ටු බවට පත්වූ මුළු වටිනාකම — රු.12,174,382.19**

**රු11,262,382.19**

2002 ජනවාරි 01 දින සිට ආරම්භ කරන ලද මෙම රුපියල් මිලියන 15ට අදාල පොරොන්දු නෝට්ටු සඳහා පොළී අනුපාත 15.50% විය. මාසිකව පොරොන්දු නෝට්ටු වලට අදාල පොලියත්, මූලික මුදලත් කොටස් වශයෙනුත් ගෙවීමට නියමිත වූ අතර, එම පොළී සහ මූලික මුදල් ගෙවීම 2002 ජූලි මාසය දක්වා සිදුකරන ලදි. ඉන්පසු කිසිදු ගෙවීමක් නොකල අතර ඉතිරි ගෙවිය යුතු පොරොන්දු නෝට්ටුවල වටිනාකම රු 11,262,382.19 කී.

**රු.912,000.00**

වණික් ඉන්කෝපරේෂන් ආයතනයේ අප විසින් ණයකර වල ආයෝජනය කල මූලික මුදල රු.7,450,250.00කී. (Par Value රු. 6,080,000.00) පොලී අනුපාතය 15.75% කී. ආයෝජන දිනය 1997.12.10 දිනය වේ. ඒ වෙනුවෙන් 2000 දක්වා පොළී ගෙවන ලදී. 2001 වර්ෂයට අදාල පොලී මුදල වන රු.912,000 නොගෙවූ අතර, එය පොරොන්දු නෝට්ටුවක් බවට පරිවර්තනය කරන ලදී. එහෙත් එම පොරොන්දු නෝට්ටු මුදලද තවම ගෙවා නැත.

වණික් ඉන්කෝපරේෂන් ආයතනය විසින් අපවෙත නිකුත් කර ඇති ණයකර වල වටිනාකම රු.7,450,250 ක් වන අතර (Par Value Rs.6,080,000/=) ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසුව 2011.12.10 වන දින මෙම මුදල ගෙවීමට නියමිතව තිබුණද ගෙවා නැත.

මෙම සමාගමට එරෙහිව නඩුවක් පවතින අතර නඩුවෙහි වර්තමාන තත්වය පහත පරිදි වේ. එම නඩුව නිමවනතෙක් හිඟ මුදල් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කල නොහැක.

**වණික් ඉන්කෝපරේෂන් ආයතනයට විරුද්ධව දිසා අධිකරණයේ පනවා ඇති ඈවරකිරීමේ නඩුවේ වර්තමාන තත්වය**

වණික් ඉන්කෝපරේෂන් සමාගම ඈවරකිරීම සඳහා කොළඹ වාණිජ මහාධිකරණයේ 84/CO නඩුව පවරන ලද අතර, ඈවර කිරීම සඳහා නියෝගය නිකුත් කරන ලදි. එකී නියෝගයට විරුද්ධ සිවිල් අභියාචනා මහාධිකරණයේ හා ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියාචනා පෙත්සම් දෙකක් ඉදිරිපත් කර එම අභියාචනා පෙත්සම් නිශ්ප්‍රභා කරන ලදි. ඉන්පසුව නැවතත් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් සිවිල් අභියාචනා මහාධිකරණයේ WP/HCCA/270/08 (F) අභියාචනය ගොනු කර ඇති අතර, එම නඩුව නියෝගය සඳහා 2016/09/22 ට කැඳවීමට නියමිතය.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) 2016/30 චැටුප් ප්‍රතිශෝධනයට අනුව පිළියෙල කළ බඳවා ගැනීමේ පටිපාටිය පරිදි 2013/05/01 දින සිට සේවකයින් රැකියා ශ්‍රේණිවලට අන්තර්ග්‍රහණය කිරීමේ ක්‍රියාවලිය සිදුකළ බැවින් හා එම

කාලය තුළ පැවති සේවක වැටුප් විෂමතා නිවැරදි කිරීම හේතුවෙන් සේවක පිරිවැය වැඩි වී ඇත.

(ආ) සාමාන්‍යාධිකාරි තනතුරෙහි සේවය කළ හරේන් සිල්වා මහතා තනතුරෙන් ඉවත් කිරීමට එරෙහිව කම්කරු උසාවියේ නඩුවක් පැවති අතර, එය 2015 ජුලි මස නිමාවිය. එම හේතුව මත සාමාන්‍යාධිකාරි තනතුර සම්පූර්ණ කිරීමට නොහැකි විය. අතිරේක සාමාන්‍යාධිකාරි තනතුර හා සාමාන්‍යාධිකාරි තනතුර පිරවීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත.

## 5 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 සංයුක්ත හා ක්‍රියාකාරී සැලැස්ම

මෙම සැලසුම් සම්බන්ධයෙන් පරිගණක උපදේශකවරයෙකුගේ සහය ඇතිව මේ වනවිට ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර ඇති අතර, 2016 වසරේදී එම කටයුතු ආරම්භ කිරීමට තීරණය කර ඇත.

i. වර්තමානයේදී ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය සමඟ එක්ව ඵලදායිතාව ඉහළ නැංවීම සම්බන්ධයෙන් වැඩ සටහන් ක්‍රියාත්මක වන අතර, එහි මුල් පියවර වශයෙන් එම ආයතනයේ නිලධාරීන් මණ්ඩලයේ සියලුම අංශ හා ප්‍රාදේශිය කාර්යාල ආවරණය වන පරිදි අධ්‍යනයක් කොට වාර්තාවක්ද ඉදිරිපත් කර ඇත. එම වාර්තාවල ඉදිරිපත් වූ දුර්වලතා හඳුනාගෙන ඒවා මඟහරවා ගැනීමේ වැඩසටහන් හා සේවක ධාරිතා වැඩිදියුණු කිරීමේ වැඩසටහන් ආරම්භ කර ඇත.

ii. ඉහත කී වැඩපිළිවෙලෙහි කොටසක් ලෙස සේවක කාර්යඵල ඇගයීම් නව ක්‍රමයක් ද හඳුන්වා දීමට කටයුතු ආරම්භ කොට ඇත.

### 5.2 අභ්‍යන්තර විගණනය

(අ) මණ්ඩලයේ අරමුණු නිවැරදිව හඳුනාගෙන තාක්ෂණික පදනමකින් යුතුව පිළියෙල කරනු ලැබූ සංයුක්ත සැලැස්මක් හා අනුශාංගික ක්‍රියාකාරී සැලැස්මක් 2016 වර්ෂයේදී නැවත සකස් කරන ලද අතර, ඒ අනුව අභ්‍යන්තර විගණන කටයුතුද ඊට අනුකූලව සිදුකරනු ලැබේ.

කෙටුම්පත් වාර්ෂික වාර්තාවද වාර්ෂික ගිණුම් සමඟ අභ්‍යන්තර විගණනයට ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

මණ්ඩලයේ කළමනාකාරිත්වයේ අවශ්‍යතාවය මත පහත දැක්වෙන පූර්ව විගණනයන් 2015 වර්ෂයේදී සිදුකරන ලදි.

(I) **ප්‍රතිලාභ අයදුම්පත් පරීක්ෂාව**

| | පරීක්ෂාකර ගෙවීම් සඳහා යොමු කළ අයදුම්පත් සංඛ්‍යාව |
|---|---|
| සාමාන්‍ය ප්‍රතිලාභ අයදුම්පත් පරීක්ෂාව | 96,943 |
| මරණ ප්‍රතිලාභ අයදුම්පත් පරීක්ෂාව | 2,654 |
| අක්ෂිකාච බද්ධ කිරීම | 651 |
| හෘදසැත්කම් | 588 |
| ස්ථිර දුබලතාවයට පත්වීම් | 63 |
| ස්වයංක්‍රිය ජීවිත රක්ෂණ | 947 |
| ශ්‍රමසුව | 1,636 |
| වකුගඩු බද්ධ කිරීම් | 18 |
| උසස් පෙළ හා 5 වසර ශිෂ්‍යත්ව | 9,562 |
| **කාර්ය මණ්ඩල වෛද්‍ය බිල්පත්** | **13,958** |
| එකතුව | 127,020 |

(ii) කාර්ය මණ්ඩල සේවය අවසන් කිරීමේදී ගෙවිය යුතු හා අයවිය යුතු මුදල් පිළිබඳ පරීක්ෂාව සම්බන්ධයෙන් ඉදිරිපත් කළ වාර්තා සංඛ්‍යාව 17කි.

(iii) මාසික කාර්ය මණ්ඩල දිරි දීමනා ප්‍රතිශතය පරීක්ෂා කිරීම.

(iv) නිවාසණය ප්‍රතිපූර්ණය සඳහා මුදල් නිදහස් කිරීම.

(v) කාර්ය මණ්ඩලයේ වාර්ෂික ප්‍රසාද දීමනා ගෙවීම් කිරීම - 2015.

(vi) ඉතිරි වාර්ෂික නිවාඩු ගෙවීම් කිරීම සඳහා කාර්ය මණ්ඩල නිවාඩු පරීක්ෂාව - 2014.

ඉහත පූර්ව විගණනයට අමතරව පහත දැක්වෙන පශ්චාත් විගණන වාර්තාද ඉදිරිපත් කර තිබේ.

1. දායකත්ව හා අධිභාර මුදල් පිළිබඳ පරීක්ෂාව - 2014.
2. උපලබ්ධි නොවූ මුදල් ඇණවුම් පිළිබඳ පරීක්ෂාව.
3. ඒකක භාර ආයෝජන පිළිබඳ පරීක්ෂාව.
4. දායක මුදල් හා අධිභාර මුදල් නිවැරදි කිරීම සඳහා පරිගණක පද්ධතිය තුල වාර්තා වන ජර්නල් සටහන් පිළිබඳ පරීක්ෂාව.
5. කාර්යාල ගොඩනැගිලි කුලී ගෙවීම් පිළිබඳ පරීක්ෂාව.
6. මණ්ඩලයේ වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා ප්‍රසම්පාදනය පිළිබඳ පරීක්ෂාව.
7. ඵලදායිතා වැඩසටහන යටතේ ස්ථාවර වත්කම් බැහැර කිරීම පිළිබඳ පරීක්ෂාව.
8. පූර්ව විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති පාලන හා වෙනත් කරුණු සම්බන්ධයෙන් එක් එක් අවස්ථාවේදි වෙන් වෙන් වශයෙන් වාර්තා යොමු කර තිබේ.

යථෝක්ත සියළුම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබේ. මීට අමතරව මණ්ඩලයේ සභාපතිවරයා විසින් නියම කරන ලද සියළුම විමර්ශණ වාර්තා (ආයෝජන, ප්‍රසම්පාදන ඇතුළුව) මණ්ඩලයේ සභාපති වෙත් ඉදිරිපත් කර තිබේ.

(ආ) ඉහත පිළිතුරු මෙයටද අදාල වේ.

(ඇ) අභ්‍යන්තර විගණන අංශයේ විෂය පථය අනුව වර්තමාන කාර්ය මණ්ඩල අවශ්‍යතා සැලකිල්ලට ගෙන සකස් කළ නව සංවිධාන සැලැස්ම 2016-2020 සංයුක්ත සැලැස්මට ඇතුළත් කර තිබෙන අතර, ඒ අනුව අදාල නිලධාරින්ට නියමිත උසස්වීම් ලබාදීම හා සුදුසුකම් ලත් පළපුරුදු කාර්ය මණ්ඩලය, මණ්ඩලයේ අනුමත බඳවා ගැනිම් පටිපාටියට අනුකූල වන අයුරින් බඳවා ගැනිමටද කටයුතු කරනු ලැබේ.

## 5.3 අයවැය ලේඛණමය පාලනය

(අ) 2015 වර්ෂයේදි රජය විසින් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවකයන් සඳහා රු 10,000 ක දීමනාවක් ගෙවීම අනුමත කරන ලදි. එය මණ්ඩලයේ සේවකයින්ට ගැලපීම හේතුවෙන්ද වැඩ තහනමකට ලක්වූ සේවකයෙකු නැවත සේවයට බඳවා ගැනීම නිසා වසර ගණනාවක හිඟ වැටුප් ගෙවීම හේතුවෙන්ද අයවැයගත වියදමට වඩා සත්‍ය වැටුප් පිරිවැය හා ප්‍රසාද දීමනා පිරිවැය වැඩිවී තිබුණි.

සාමාජිකයින් සඳහා ලබාදෙන සේවාවන් පුළුල් කිරීම හා විධිමත් කිරීම සඳහා ශාඛා කාර්යාල නවීකරණය කිරීම හා පුළුල් කිරීමට අවශ්‍ය විය. ඒ අනුව, ශාඛා කාර්යාල ගණනාවක් ඉඩකඩ වැඩි ප්‍රවාහන පහසුකම් බහුල ස්ථාන වෙත මාරු කිරීම හේතුවෙන්ද, ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යන කම්කරු මහලේකම් කාර්යාල ගොඩනැගිල්ල සඳහා 2015 දී රු මිලියන 9.6 ක මුදලක් 2007 සිට 2015 වර්ෂ සඳහා හිඟ ගොඩනැගිලි කුලී ලෙස ගෙවීම හේතුවෙන්ද ගොඩනැගිලි කුළි වියදම අයවැයගත වියදමට වඩා වැඩිවී ඇත.

ගොඩනැගිලි කුලී වියදම අයවැයගත වියදමට වඩා වැඩිවී ඇත.

(ආ) වෙලඳපොල පවතින ආයෝජන අවස්ථා, ආයෝජන පොලී අනුපාතයන්, පවතින අරමුදල් ප්‍රමාණය අනුව එක් එක් ආයෝජනයන් සඳහා පුරෝකථනය කරන ලද අරමුදල් ප්‍රමාණයන්ට එම ආයෝජන සඳහාම නොයොදවා ආයෝජන ප්‍රතිපත්තිය තුල සිට වඩා වාසිදයක ආයෝජන අවස්ථා සඳහා යොදවා ඉහළ පොලී ආදයම් ලබා, අපගේ ඉලක්කගත මුළු ආදයම කරා ලඟාවීම අපගේ අපේක්ෂාවයි. ඒ අනුව 2015 දී අයවැය ගත මුළු ආදයමට වඩා සත්‍ය මුළු ආදයම 6.5% කින් වැඩි වීමක් පෙන්නුම් කර ඇත.

එමෙන්ම, නවම් මාවත ඉඩම 2015 අගෝස්තු මස සිට කුලී පදනම මත ලබාදීම නවතා දැමීම හේතුවෙන් කුලී ආදයම අඩුවී ඒ වෙනුවට එම ඉඩම මණ්ඩලයේ සේවකයින් යොදවාගෙන රථ ගාලක් (Car park) පවත්වා ගෙන යන නිසා කුලී ආදයමට වඩා වැඩි ආදයමක් මණ්ඩලයට ලැබී ඇත.

## 6 පද්ධති හා පාලනයන්

(අ) **සාමාජික ගිණුම් වලට මුදල් බැර කිරීම**

සාමාජික මුදල් 1981 සිට 2014 වර්ෂය දක්වා රු මිලියන 135,779 ලැබී ඇති අතර, ඉන් රු මිලියන 133,682 ක් 2016.08.31 දිනට සාමාජිකයින්ගේ ගිණුම් වලට බැර කර තිබේ. එය ප්‍රතිශතයක් ලෙස ගත් කළ 98.5% කි. ඒ අනුව, ලැබී ඇති සාමාජික මුදල් වලින් සාමාජික ගිණුම් වලට බැර කිරීමට 2016.08.31 දිනට ඉතිරිව ඇති වටිනාකම රුපියල් මිලියන 2,097 කි. එය ප්‍රතිශතයක් ලෙස ගත්කළ 1.5% කි.

පවත්නා වර්ෂයට අදල සාමාජික මුදල් ප්‍රමාණය රු මිලියන 18,087 ක් වන අතර, ඉන් රු මිලියන 15,415 ක් 2016.08.31 දිනට සාමාජික ගිණුම් වලට බැර කර තිබේ. එය ප්‍රතිශතයක් ලෙස ගත්කළ 85% කි. ඒ අනුව, ප්‍රවර්ථන වර්ෂයට ලැබී ඇති සාමාජික මුදල් වලින් 2016.08.31 දිනට සාමාජික ගිණුම් වලට බැර කිරීමට ඇති මුදල රු මිලියන 2,671 ක් වන අතර, එය ප්‍රතිශතයක් ලෙස ගත්කළ 15% කි.

(ආ) මණ්ඩලයේ ගිණුම් වාර්තා වලට අනුව සාමාජිකයන් අරමුණු කරගත් අයවැයගත මුළු වියදම් වලට සාපේක්ෂව සත්‍ය වියදම අඩුවී ඇත්තේ 17% කින් පමණි. ඒ අනුව, අයවැයගත සහ සත්‍ය වියදම් වල සැලකිය යුතු මට්ටමක විචලනයක් නොමැති අතර, ඉදිරියේදී සාමාජිකයන් තවදුරටත් දැනුවත් කර වැඩි ප්‍රතිලාභ ලබා දීමට පියවර ගනු ලැබේ.

(ඇ) අභ්‍යන්තර විගණන කොට්ඨාශයේ විෂය පථය අනුව වර්තමාන කාර්ය මණ්ඩල අවශ්‍යතා සැලැකිල්ලට ගෙන සකස්කල නව සංවිධාන සැලැස්ම 2016-2020 සංයුක්ත සැලැස්මට ඇතුලත් කර තිබෙන අතර, ඒ අනුව අදල නිලධාරීන්ට නියමිත උසස්වීම් ලබාදීම හා සුදුසුකම් ලත් පළපුරුදු කාර්ය මණ්ඩලය මණ්ඩලයේ අනුමත බඳවාගැනීම් පටිපාටියට අනුකූල වන අයුරින් බඳවා ගැනීමටද කටයුතු කරනු ලැබේ.

**මහින්ද මඩිහහේවා**
සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

# සංඛ්‍යාත්මක ඇමුණුම්
# புள்ளிவிபர இணைப்புகள்
# STATISTICAL ANNEXURES



පොලී සහ ප්‍රකාශිත ලාභාංශ අනුපාත
அறிவிக்கப்பட்ட வட்டியும் பங்கு இலாபங்களும்
INTEREST & DIVIDENDS 2006 - 2015




පොලී සහ ප්‍රකාශිත ලාභාංශ
அறிவிக்கப்பட்ட வட்டியும் பங்கு இலாபங்களும்
DIVIDENDS DECLARED 2006 - 2015




ආදායම් හා මෙහෙයුම් වියදම් අතර සම්බන්ධතාවය வருமானம், நிறுவன செயற்பாட்டுச் செலவுகள்
INCOME Vs. OPERATING EXPENSES 2006 - 2015



## දායක මුදල් උපනතිය
## சேகரிப்புக்களின் போக்கு
## TREND IN CONTRIBUTION COLLECTIONS 2006 - 2015




## සාමාජික අරමුදලේ වර්ධනය அங்கத்துவ நிதியன் வளர்ச்சி
## GROWTH OF THE MEMBER FUND 2006 - 2015




## සාමාජික ශේෂ ආපසු ගෙවීම් கொடுப்பனவு மீளளிப்பு செய்யப்பட்ட உரிமைக் கோரல்களின்
## MEMBER CLAIMS REFUND 2006 - 2015



## සාමාජික ප්‍රතිලාභ යෝජනා ක්‍රම நலன் தரும் திட்டங்கள் - தீர்க்கப்பாத கோரல்கள்
## MEMBER BENEFIT SCHEMES 2011 - 2015




## ආයෝජන සංයුතිය முதலீடுகளின் பாங்கு
## INVESTMENT PORTFOLIO 2015




## රැස්කිරීම් හා සේවා යෝජක සබඳතා කොට්ඨාශයේ කාර්ය සාධනය
## சேகரிப்பு, தொழில் தருநர் உறவுகள் பகுதிகளின் செயற்பாட் டுத்திறன்
## PERFORMANCE OF COLLECTION & EMPLOYER RELATIONS DIVISION 2011 - 2015



අධිභාර ආදායම් மிகை அறவீடு வருமானம்
SURCHARGE INCOME 2006 - 2015

